මේ සෑම කරුණක් සම්බන්ධයෙන්ම අප එකඟ වන්නෙ නැහැ. මුලින් කී කරුණු ගැන පමණයි, අප එකඟ වන්නේ.

"—idle clerical staff in a large number of Government offices—all these comprise an augean stable crying to be cleaned. Any private concern addicted to these methods would go bankrupt in a matter of months. The Government keeps afloat in a sea of trouble by increasing taxes and issuing more loans."

මේ පත්‍රයේ තවත් නොයෙක් දේවල් තියෙනවා. මෙහි තියෙන හුඟක් දේවල් මටත් තේරෙන්නෙ නැහැ. ඒ සම්බන්ධව මේ පත්‍රයේ ඔය විධියටයි, කියා තිබෙන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ විනිමය අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීම බොහොම හොඳ දෙයක්. මීට පෙර අපත් ඔය විධියට විදේශ විනිමය අයවැය ලේඛන ඉදිරිපත් කර තිබෙනවා. එහෙත් මේ විධියට ගණන් බලා කිසිම දවසක ඒ අයවැය ලේඛන ඉදිරිපත් කර නැහැ. ගරු මුදල් ඇමතිතුමා විදේශ විනිමය සම්බන්ධව ඉදිරිපත් කර තිබෙන සංඛ්‍යා ලේඛනවලින් පෙනෙනවා, ඒ මුදල තක්සේරු කර තිබෙන මුදලට වඩා රුපියල් ලක්ෂ 1,540 කින් අඩු බව. එහෙම නම් මොනවද ඉතිරි වන්නෙ ? පසුගිය වර්ෂයේ ගණන් බලා තිබෙන්නෙ, රුපියල් ලක්ෂ 1,540 ක විදේශ විනිමය වාසියක් ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

වෙනවාය කියායි. දැන් එය වැරදිය කියා එතුමාගේ වාර්තාවෙන් කියනවා. මේ අන්දමට විදේශ විනිමය තක්සේරු හදා කිසිම පලක් නැහැ. ඇති සැටි අවංකව පෙන්වා මේ තක්සේරු හදනවා නම් තමයි, ප්‍රයෝජනයක් ලැබෙන්නේ. එක්කෝ මුදල් ඇමතිතුමාව නොමග යවා තිබෙනවා. එසේ නැත්නම් හිතා මතාම මෙය වැරදියට තක්සේරු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මහා බැංකුව ගැනත් සැකයක් පවතිනවා. ආර්ථික ප්‍රශ්න සම්බන්ධයෙන් මේ ආණ්ඩුවට උපදෙස් දෙන උදවියම මහා බැංකුවේ උසස් නිලතලවල සිටින නිසා ජාතියේ ආර්ථික තත්ත්වය අවංක ලෙස වාර්තා කිරීමේ ආයතනයක් වශයෙන් මහා බැංකුවෙන් බලාපොරොත්තු වන කාර්යය හරි හැටි ඉටු වන්නෙ නැහැ. ඒ ඇයි? මේ ආණ්ඩුව රැඳා තිබෙන්නෙ ප්‍රචාරය උඩයි. මේ ආණ්ඩුවට කව්රුන් හෝ දොස් කිව් වොත් ඔහු ඉවරයි. මේ පාර්ලිමේන්තුව ඇතුළතත් තත්ත්වය එයයි, පාර්ලිමේන්තුවෙන් පිටතත් තත්ත්වය එයයි. ආණ්ඩුවේ සේවකයෙකු මේ ආණ්ඩුවේ වරදක් කිව් වොත් ඔහු මාරු කර යවන්නේ වතුර නැති තැනකටයි. මේ ආණ්ඩුව කවදා හෝ වැටෙන්නෙත්, මේ ප්‍රචාරය කෙරෙහි වැඩි විශ්වාසයක් තබන නිසයි. තමුන්නාන්සේලාගේ පත්‍රවලින්ම දැන් ඒ පහරවල් වැදී ගෙන යනවා. ආර්ථික ප්‍රශ්න සම්බන්ධව මේ ආණ්ඩුවට උපදෙස් දෙන උදවියම මහා බැංකුවේ ලොකු තැන්වල සිටින නිසා බොහොම ව්‍යාකූල තත්ත්වයක් දැන් පවතිනවා.

මේ ආණ්ඩුව වැඩියෙන්ම පුරසාරම් දොඩන්නේ ආහාර නිෂ්පාදනය ගැනයි. 1956 ට පෙර තිබුණු අදහස් උඩමයි, අපේ අගමැතිතුමා තවමත් කල්පනා කරන්නේ. ගොවි කර්මාන්තයෙන් මේ රට ස්වයම් පෝෂිත කර ආහාර පිටරටත් පටවා ණය සියල්ලක්ම ගෙවන්නටයි, එතුමා බලාපොරොත්තු වන්නේ. කීප වරක්ම මේ රටේ අගමැතිකම් කළ, දීර්ඝ කාලයක් තිස්සේ එක්සත් ජාතික පක්ෂයේ නායකයා වශයෙන් කටයුතු කරන අපේ අගමැතිතුමා තවමත් ඒ පරණ අදහස් දැරීම ඇත්තෙන්ම ජාතික විපතක්.

තරඟකාරී වෙළෙඳපොළක් තිබෙන මෙවැනි අවස්ථාවකදී ගොවිතැනින්ම රට ස්වයංපෝෂිත කරන්නට මෙන්ම ගොවි ද්‍රව අපනයනය කර ලබා ගන්නා දෙයින් විදේශ ධනය ඇති කර ගන්නටත් උත්සාහ කරතොත් අපේ ජාතියෙන් ගන්නට දෙයක් නැති වෙනවා. තේ වෙළෙඳාම පහළ යමින් පවත්නා බව තමුන්නාන්සේ දන්නවා. පොල් අපනයනයත් පහළ යන බව තමුන්නාන්සේ දන්නවා. රබර් වෙළෙඳාමටත් පහර වැදීගෙන යන හැටි තමුන්නාන්සේට පෙනී යනවා. චීනය නිසා තරමකවත් යම් සහනයක් තිබෙන බව සැබෑ වුවත් තේ, රබර් සහ පොල් යන ප්‍රධාන වෙළෙඳ ද්‍රව්‍ය තුනම සම්බන්ධයෙන් තරඟ බිමක් තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. තේ වගාව දැන් අප්‍රිකාවේ රොඩේෂියාව ආදි ප්‍රදේශවල බෙහෙවින් කෙරෙන නිසා තේ වෙළෙඳාමටත් දැන් විශාල වශයෙන් පහර වැදීගෙන යනවා.

1960දී පමණ මා ඉරාකයට ගිය අවස්ථාව මට මතකයි. ඒ අවස්ථාවේදී අපේ තේ වෙළෙඳපොළෙන් සියේට දොළහමාරයි ඉන්දියාව අල්ලාගෙන සිටියේ. දැන් තත්ත්වය කොහොමද? දැන් මේ ආණ්ඩුවේ තමුන්නාන්සේලා ඉරාකය සමග තරහවෙලා ඉන්න නිසා ඒ වෙළෙඳ පොළවල් පහළ බහිනවා. එපමණක් නොවෙයි, දැන් සමහර තැන්වල උදවිය තේ බිම පවා අත්හැර දමන්නට කටයුතු කර ගෙන යනවා. දැන් රෝමයේ තේ වෙළෙඳ මධ්‍යස්ථානය වසා දමා තිබෙනවා. ඒක හොඳයි. රෝමයට ගිය කෙනෙකුට තේ බොන්නට ලැබෙන්නෙ නැහැ. තේ නමින් බොන්නට දෙන්නේ වයින්වලට දමන ලද තේ පමණයි. තේ ප්‍රචාරය අඩුවෙලා—බොහොම අඩුවෙලා—දැන් ක්‍රම ක්‍රමයෙන් තේ වෙළෙඳපොළත් ඇකිලීගෙනයි යන්නේ. රබර්වලටත් ලබා තිබෙන්නේ සතුටු වෙනන්ට පුළුවන් ත්ත්වයක් නොවෙයි. කෘත්‍රිම රබර් නිසා, අප නිපදවන රබර්වලට තැනක් නැහැ. චීනය අපේ රබර් වලින් එක්තරා ප්‍රමාණයක් ගන්නවා. ඒ නිසා සැහෙන තත්ත්වයක්වත් අපට තිබෙනවා. පොල්තෙල්වලටත් තරඟයෙන් සිදු වී තිබෙන හානිය සුළුපටු නැහැ. සෝයාබෝංචිවලින් සාදනු ලබන තෙල් නිසාත්, ඇමෙරිකාවේ සාදන තෙල් නිසාත් අපේ පොල්තෙල් වෙළෙඳාම දැන් අඩු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වේගන යන බව කල්පනා කරන්නට ඕනෑ. ඒ නිසා ගොවිතැනින් නිපදවන දේවල් අලෙවියෙන් අපේ විදේශ ධනය ආරක්ෂා කර ගන්නට ඕනෑයයි යමෙක් කල්පනා කරතොත් ඊට වඩා බොළඳ කල්පනාවක් ඇතැයි හිතන්නට අමාරුයි. ඒ කාරණය විස්තර කිරීමට ඊට වඩා බර, ඊට වඩා තද වචනයක් පාවිච්චි කරන්නට මා කැමති නැහැ.

ආහාර නිෂ්පාදනය ගැන මේ ආණ්ඩුව හුඟක් දේවල් කථා කර තිබෙනවා. හුඟක් දේවල් ලියා තිබෙනවා. නොයෙක් විධියේ ප්‍රචාරක පත්‍රිකා විසුරුවා හැර තිබෙනවා. ඒවා අපටත් ලැබෙනවා. ඒවාට අපෙනුත් ප්‍රචාරය ලැබෙනවා. ආහාර නිෂ්පාදනය කෙරෙහි අපේ සැලකිල්ලත් තදින්ම යොමු වෙනවා. ඒ බව ගරු මුදල් ඇමතිතුමාටත් මේ ආණ්ඩුවටත් දන්වන්නට කැමතියි. මේ ආණ්ඩුව ආහාර නිෂ්පාදනය වැඩි කිරීම සඳහා කර තිබෙන්නේ මොනවාද ? එක් එක් දිස්ත්‍රික්කයට, එක් එක් කච්චේරියට, ඒජන්තවරුන් දෙදෙනෙකු බැගින් පත් කර සිටිනවා. ආහාර නිෂ්පාදනය හා සම්බන්ධ ප්‍රචාරක කටයුතු කර ගෙන යාම ඒ උදවියගේ ප්‍රධාන කාර්යයයි. ගරු අගමැතිතුමා ආහාර නිෂ්පාදනය සම්බන්ධයෙන් නොයෙක් නොයෙක් දේවල් කියා තිබෙන අතර විරුද්ධ පාර්ශ්වයේ අප සම්බන්ධයෙන් කියා තිබෙන්නේ මොනවාද ? "බලාපල්ලා, උඹලා ආණ්ඩුව කරගෙන ගියා. ඒ කාලයේ ආහාර නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට උඹලා කළ දේ මොනවාද ? උඹලා ඒ දවස්වල ට්‍රැක්ටර්, ජීප්, ලෑන්ඩ් රෝවර් යනාදිය කීයක් ගෙන්වා තිබෙනවාද ? අපේ ආණ්ඩුව ඒවා කොයි තරම් ප්‍රමාණයක් ගෙන්වා තිබෙනවාද ?" යනාදී වශයෙන් එතුමා කියා තිබෙනවා. අපට නම් ඔය කියන දේවල් ඔය තරම් ගෙන්වන්නට ලැබුණේ නැහැ.

වී ගොවිතැනින් ලැබුණු අස්වැන්න ගැන මේ ආණ්ඩුව කියන්නේ මොනවාද ? මහ කන්නේ වී ගොවිතැනින් අස්වැන්න විශාල ප්‍රමාණයක් ලැබුණාය කියනවා. ඒ කොයි හැටි වෙතත් අපට තවමත් ඒවායේ තොරතුරු දැන ගැනීමට ඉලක්කම් ලැබී නැහැ. මහයි, යලයි දෙකම එකතු කළාමයි අවුරුද්දේ අස්වැන්න දැන ගන්නට පුළුවන් වන්නේ. තවම යල් අස්වැන්න ගැන කියන්නට බැහැ. ඔය දෙකම එකතු කළාම තත්ත්වය කොහොමට හිටිවිදැයි කියන්නට බැහැ. මගේ කථාව කරගෙන යන විට මේ ගැන වැඩි දුරටත් කියන්නම්. හාල් කොපමණ නිපදවා තිබෙනවාදැයි දැන ගන්නට අප කවුරුත් කැමතියි.

තවත් එක් කාරණයක් ගැන සඳහන් කරන්නට කැමතියි. ආණ්ඩු පක්ෂයේ තමුන්නාන්සේලා මා සමග තරහ වන්න එපා. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයෙකු වශයෙන් මේවා මතක් කර දිය යුතුයි. ජාතිය වෙනුවෙන් විශාල වගකීමක් විරුද්ධ පාර්ශ්වයට තිබෙනවා. ගොවිතැන සඳහා ට්‍රැක්ටර්, ජීප් ආදියෙන් මොන මොනවාද විරුද්ධ පාර්ශ්වය බලයේ සිටිද්දී ගෙන්වා තිබෙන්නේ, යනුවෙන් ගරු අගමැතිතුමා පසුගියදා පැවැත්වුණු විවාදයේදී ප්‍රශ්න කළා. විරුද්ධ පාර්ශ්වයේ අය කියන අන්දමට වැඩ කරන්නට තමන් පැමිණියේ නැතැයි ආණ්ඩුව කියනවා. අපේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නට නොවෙයිලු ආණ්ඩු පක්ෂය බලයට පැමිණ සිටින්නෙ. ඒ ගැන අප ප්‍රශ්න කරන්නේ නැහැ. එහෙත් එවැනි කථා ඇසෙන විට ඒ ගැන නියම තොරතුරු කියා දීම අපේ යුතුකමක් හැටියට අප කල්පනා කරනවා.

ඔය තරම් ජීප්, ට්‍රැක්ටර් ආදිය මේ රටට ගෙන්වා ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජනය කුමක්ද ? ගොවිතැනට ඒවායින් ප්‍රයෝජනයක් තිබෙනවාද ? සාමාන්‍ය ගොවියාට එයින් ලැබෙන ප්‍රයෝජනය කුමක්ද ? සාමාන්‍ය ගොවියාට ඔය ට්‍රැක්ටර්වලින් ඒ තරම් ප්‍රයෝජනයක් නැහැ. ව්‍යාපාරිකයාටයි එයින් ප්‍රයෝජනය ලැබෙන්නේ. මේවා ගෙන්වන්නේ කොහෙන්ද ? අපට වාසියක් ලැබෙන තැනකින්ද මේවා ගෙන්වන්නේ ? අපේ ජාතියට ප්‍රයෝජනයක් ලැබෙන තැනකින්ද මේවා ගෙන්වන්නේ ? ඒවා ගෙන්වන්නේ මේ ආණ්ඩුවේ නෑදෑ හිතමිතුරන්ගේ කොමිස් ඒජන්තවරුන් ඉන්න තැන්වලිනුයි. ඒ අයට කොමිස් ආදියෙන් ප්‍රයෝජනයක් ලැබෙන තැන්වලිනුයි මේ ගෙන්වා ගන්නේ. මට මෙය උදාහරණයකින් පෙන්වා දෙන්නට පුළුවනි. රාජාසන කථා විවාදයේදීත් මේවා ගැන සඳහන් කර තිබෙනවා. ඕලන්දය, රුසියාව, බල්ගේරියාව වැනි රටවලින් මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

යන්ත්‍ර ගෙන්වනවාද? ට්‍රැක්ටර් ගෙන්වීම ගැන සාමාන්‍ය ජනයා ඒ තරම් උනන්දුවක් දක්වන්නේ නැහැ. ආණ්ඩු පක්ෂයේ නෑදෑ හිතමිතුරනට කොමිස් ඒජන්සියක් තිබෙන රටවලින් පමණක් මේවා ගෙන්වා ගන්නේ ඇයි? හොඳයි, එහෙම නම් මේ උදවියට රුසියාව වැනි රටවලින් ඒජන්සියක් ලබා ගන්නට බැරිද? එතකොට එතුමාට කොමිස් පමණක් නොවෙයි මේ ජාතියටත් සෙතක් ලැබෙනවා. එසේ වුණොත් විකුණා ගන්නට බැරිව තිබෙන අපේ තේ ටික විකුණා ගන්නට පුළුවන් වෙනවා. ඇයි ඒජන්සිය ගන්නට බැරි?

මෙන්න "Nation" කියන ප්‍රවෘත්ති පත්‍රය. ගරු රාජ්‍ය ඇමතිතුමාත් මෙය කියවන්නට කැමති නම් රුපියල් 15 ක් මට දෙන්න. අවුරුදු පතා එවන්නම්. මෙන්න එහි පළ වී තිබෙන එක් පුවතක්:

"UNP Vendetta

SOCIALIST TRACTORS REFUSED AGAIN

For the third time in succession the U. N. P.—Federalist Government has turned down a favourable trade offer from a Socialist country.

This time it is tractors for our commodities from the People's Republic of Bulgaria."—

සමහරු "බුල්ගේරියා" කියනවා; සමහරු "බල්ගෙරියා" කියනවා.

—"Earlier the Government refused a similar offer from the People's Republic of China and the USSR in exchange for our tea.

The local representative for the Bulgarian make of Bolgar TL30A Caterpillar tractors in June applied to the Ministry of Agriculture and Food to import tractors on a bilateral trade agreement in return for the purchase of Ceylon produce.

The Commercial Counsellor of the Bulgarian Trade Mission in Ceylon Mr. Chavadar M. Angelov guaranteed the offer to the Ministry of Agriculture and Food with all spares and accessories for the agricultural machinery including facilities for Service Stations in all parts of the island.

The Trade Counsellor also informed that payments in respect of the machines could be in terms of the Ceylon-Bulgarian Payment Agreement of 1961 and that Bulgaria would buy Ceylon goods for a like amount of the value of tractors and other machines purchased.

Bulgarian agricultural machines rank among the best in the world and are manufactured to international standards incorporating the latest developments. Some 1,000 units are exported annually to many countries all over the world."—

මාත් ළඟදී බල්ගෙරියාවට ගිහින් ආවා. එහෙත් මා නමුන්නාන්සේලාට පොඩි "ඇඩ්වර්ටිස්මන්ට්" එකක් කරනවා නොවෙයි.

—"When the local representative's request was turned down, the Bulgarian Trade Mission here appealed to the Ministry of Agriculture to at least allow the import of sample tractor units as this would facilitate to compare the output of the machine with other makes, as well as, operation of the unit and price factor. This too was turned down.—[*Interruption*].

While there is no foreign exchange involved in the import of Bulgarian tractors UNP Senator N. M. Appuhamy's Sathyawadi Stores was given Rs. 2.5 million in free exchange for the import of 210 Fordson tractors in the allocations for the latter half of 1967.

He was also given .8 million rupees in free exchange for spares against the allocations.

Two other UNP favoured firms were also given allocations for the import of tractors for the latter half of 1967 but did not involve free exchange.

Brown and Company was allocated Rs. 12.5 million for the import of Massey-Ferguson Tractors. The amount allocated was made up of Rs. 11 million in French aid and Rs. 1.5 million in U. K. aid. This was for the import of 1,500 tractors.

Ceylon Service and Supplies Limited was allocated Rs. 2.5 million for the import of International Harvester tractors. This amount for the import of 210 tractors was made up of aid from the United Kingdom.

In the early part of this year (i.e. till June) 396 tractors came into the island. Of these 300 were Massey-Ferguson and 96 were Fordson tractors."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුන්නාන්සේලා උපදේශ ගන්නේ කාගෙන්ද කියා මා අහන්නට කැමතියි. නමුන්නාන්සේලා උපදේශ ගන්නේ වෙළෙඳුන්ගෙන්ද? ව්‍යාපාරිකයින්ගෙන්ද? එහෙම නැත්නම් ආර්ථික ප්‍රශ්න සම්බන්ධ විශේෂඥයින්ගෙන්ද? අඩු වශයෙන් අපේ රාජ්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇමතිතුමාගෙන්වත් උපදේශ ගන්නවා නම් මෙවැනි ආර්ථික පරිහානියකට එතුමා ඉඩ තබන්නේ නැහැ.

පෞද්ගලික වෙළෙන්දන් සමග අප තරහ නැහැ. එහෙත් මේ අවස්ථාවේදී වචනයක් මතක් කරන්න කැමතියි. අප මේ ගැන යමක් කියන විට එය වැරදියි; නමුත් ලොකු අය කියන විට ඒක හොඳට අල්ලනවා.

මෙන්න වෙළඳ මහත්වරුන් ගැන අවුරුදු 200 කට පමණ කලින් ආචාර්ය සැමුවෙල් ජොන්සන් කියන දේ :

"A merchant's desire is not of glory but of gain, not of public wealth but of private environment. He is rarely"—

මෙන්න මේකයි මට අගමැතිතුමාට කියන්න ඕනැ කරන්නේ.

—"to be consulted on questions of war or peace or any designs of wide extent and distant consequences."

එහෙත් තමුන්නාන්සේලා උපදෙස් ගන්නේ කාගෙන්ද? මෙහි විස්තර කරන්නේ කුමක්ද? "වෙළෙන්දාගේ ආශාව, කීර්තියට නොව ධනයටයි; පොදු සම්පතට නොව පෞද්ගලික වුවමනාවටයි. යුද්ධය, සාමය ගැන හෝ දීර්ඝ කාලීන වැඩ සටහන් ගැන හෝ ඔහුගේ අදහස් විමසිය යුතු නොවේ."

ඒ අවුරුදු 200 කට පමණ කලින් ආචාර්ය ජොන්සන් කී දේ. ඒ ලිපිය සපයන නැනැත්තා කියනවා, ආචාර්ය ජොන්සන් අර විධියට කියන්නත් කලින් —පලස්තිනයේ ව්‍යාපාරිකයන් ක්‍රිස්තුස් වහන්සේ එළවා දැම්මාය කියා. මම නම් ක්‍රිස්තුස් වහන්සේ කෙනෙකු නොවෙයි; ඒ තරම් උච්චස්ථානයක් බලාපොරොත්තු වෙන්නෙත් නැහැ. එහෙත් මටත් ඕක වැදුණා.

තමුන්නාන්සේලා අනුගමනය කරන්නේ කොහොමද? අපි බලමු, ජෝන් ඩී රොක්ෆේලර් මොකක්ද කිව්වේ කියා.

John D. Rockefeller defending the standard oil monopoly said :

"The growth of a large business is merely a survival of the fittest. The American beauty rose can be produced in the splendour and fragrance which bring cheer to its beholder, only by sacrificing the early bud which grows up around it. This is not an evil tendency in business, it is merely the working out of the law of nature and of God."

රොක්ෆේලර් කියන එක්කෙනා ලොකු ව්‍යාපාරිකයෙක්. ඔහු කියනවා, ලොකු ව්‍යාපාරිකයන් තර වීම නීති විරෝධි දෙයක් නොවේය කියා. ඇමෙරිකාවේ ඉතාම අලංකාර ඒ වාගේම සුවඳ හමන රෝස මල ආරක්ෂා කිරීමට නම් ඒ වටේටම තිබෙන කැකුළු විනාශ කරනවාලු. ඒ කැකුළු විනාශ කළ විට රෝස මලේ සුවඳත් අලංකාරයත් ලැබෙනවාලු. එම නිසා වටේට ඇති සියලුම කැකුළු කපා දමා එක රෝස මලක් පමණක් අරගෙන සන්තෝෂ වෙනවා. රොක්ෆේලර් කියන්නෙත් ඒකයි. තමුන්නාන්සේලා සූදානම් වන්නෙත් ඒකටයි.

සුළු ව්‍යාපාරිකයන්, සුළු වෙළෙන්දන්, සුළු මිනිසුන් සියල්ලම විනාශ කර රොක්ෆේලර්ලා හදන්නයි තමුන්නාන්සේලා සූදානම් වන්නේ. තමුන්නාන්සේලාට වදින්නෙත් රොක්ෆේලර්ලාගෙන්. එක අතකින් මේ අවුරුදු 5 මෙසේ ගත වීම ගැන අප සන්තෝෂයි. දෙවියන්ගේ නාමයෙන් අප බලයට පත් වූ විට අපට වැඩ තිබෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
අවුරුදු 10ක්.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

හැබැයි තමුන්නාන්සේලා හිතන තරම් භයානක පියවරවල් අප ගන්නේ නැහැ. තමුන්නාන්සේලාට ප්‍රජාතන්ත්‍රවාදී ස්ථානයක් දීගෙනයි අප වැඩ කරන්නේ. කිසි කලක බය වෙන්න එපා තමුන්නාන්සේලා වාගේ චරිත ඝාතනය කරනවාය කියා; කිසි කලක බය වෙන්න එපා තමුන්නාන්සේලා වාගේ අප මඩ ගසනවාය කියා; කිසි කලක බය වෙන්න එපා තමුන්නාන්සේලා වාගේ කොමිෂන් සභා පත් කර කෙනකුට නින්දා කරන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

වාය කියා. අප එහෙම කරන්නේ නැහැ. එහෙත් තමුන්නාන්සේලාගේ හිල්ටන් හෝටලය එහෙම ආවාම ඒක එක්කෝ ජනසතු කර හෝටලයක් වාගේම පවත් වනවා; එහෙම නැත් නම් තමුන්නාන් සේලාගේ "සෙක්‍රටරියට්" එක ඒකට දානවා. ඔන්න ඔය වාගේ වැඩ කරන්න සිද්ධ වන නිසා, තමුන්නාන්සේලා ඔවැ නි දේවල් කරනවාට අප කැමතියි.

ආහාර නිෂ්පාදනයෙහිත් ඔවැනි තත්ත් වයක් පවතින්නෙ. බඩු පිටරටින් ගෙන් වන්න කොමිෂන් ඒජන්තවරුන්ට අවසර දීමෙන්, එමගින් කොමිස් මුදල් ලබා ගැනීමටත් අවස්ථාව සලසා දීමයි තමුන් නාන්සේලාගේ අදහස. ගොවියා ගැන කිසිවක් කර නැහැ. තමුන්නාන්සේලා කියයි, "මොකද නැත්තෙ අර්තාපල් වෙනුවට බතල, මංඤ්ඤොක්කා, කුරක්කන් වවන්න ආධාර දෙනව නේද, ඒවා සින් කොයි තරම් වාසියක් සැලසෙනවද" කියා. මේ ලාභවලින්, පරිප්පු ගෙන්වන් න, සුදුලූනු ගෙන්වන්න, රෙදි ගෙන් වන්න ගියාමයි අමාරුවට මුහුණ පාන්න වෙන්නෙ.

ඒ අතරම ගිනිපෙට්ටි ගැනත් සඳහන් කරන්න ඕනෑ. බොහොම කනගාටුයි, ගරු කර්මාන්ත ඇමතිතුමා මේ අවස්ථාවෙ සභා ගර්භයේ නොසිටීම ගැන. විශේෂ යෙන්ම අධ්‍යාපන උප ඇමතිතුමාට මත ක ඇති, ගිනි පෙට්ටි සම්බන්ධයෙන් කොයි අන්දමින්ද එතුමා චෝදනා අපට කළේ කියා. එතුමා විපක්ෂයෙ සිටියදි, ගරු උප ඇමතිතුමාත් විරුද්ධ පක්ෂයෙ ඒ කාලයෙ සිටිද්දි, එතුමා අප දෙගොල් ලන්ටම චෝදනා කළ හැටි තමුන්නාන් සේට මතක ඇති. නමුත් දැන් කොහෙද ගිනිපෙට්ටි ගන්න තිබෙන්නෙ? දැන් ගිනිපෙට්ටි දූසිමක් ගන්න තිබෙනව නම් දූවකට දෑවැද්ද වශයෙන් දෙන්න වුණත් පුළුවනි.

කර්මාන්ත නිෂ්පාදනය ගැන දැන් හරියට පුරාජේරු කථා කරනවා. ගරු මුදල් ඇමතිතුමාගෙ ලැයිස්තුවෙත් මහ බැංකුවෙ වාර්තාවලත් තිබෙන මේ සියල් ලක්ම කර්මාන්ත, 1967 අවුරුද්දට පෙර සකස් කළ ඒවා බව මෙහිදී සඳහන් කරන්න කැමතියි. මෙයින් කර්මාන්ත තුනක් හැරෙන්න, අනික් සියල්ලක්ම 1965 ට පෙර ක්‍රියාත්මක වූ ඒවායි. සිමෙන්ති කම්හල් ව්‍යාප්තිය, කඩදාසි කම්හල, ඔය සියල්ලක්ම කර්මාන්ත අවු රුදු ගණනාවකට පෙර සකස් කළ සැලැස් මවල්. මේ රජය මගින් කිසිම කර්මාන්ත යක් පටන් ගත්තෙ නැහැ. පටන් ගන් නවා තබා නුදුරු අනාගතයේදී පටන් ගන්නවාය කියාවත් ප්‍රතිඥාවක් මුදල් ඇමතිතුමාගෙ අයවැය ලේඛන වාර්තා වෙන් දී නැහැ.

**එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.** (මිනුවන්ගොඩ)

(*திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன— மினுவாங்கொட*)

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda)

සෙක්කුවක්වත් නැහැ.

**ඉලංගරත්න මයා.**

(*திரு. இலங்கரத்ன*)

(Mr. Ilangaratne)

අපේ මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමා කියනවා සෙක්කුවක්වත් නැහැ කියා.

ඊළඟට, අයවැය හිඟය ගැනත් වචන යක් කියන්න කැමතියි. මෙවර අයවැය හිඟය ලක්ෂ 8290 ක් බව සඳහන් කර තිබෙනවා. එසේ සංඛ්‍යා ඉදිරිපත් කර තිබෙන්නෙ ලක්ෂ 1670 ක් වැය වෙන්නෙ නැති හැටියට සලකායි. ඒ අයගෙ තක්සේ රුවෙ හැටියට ලක්ෂ 1670 ක් වියදම් කරන්න බැරි වෙයි. ඒ ප්‍රමාණය අඩු කර තමයි රුපියල් ලක්ෂ 8290 කට ගණන් හදා තිබෙන්නෙ. ඒ ප්‍රමාණයත් එකතුව හිඟය රුපියල් ලක්ෂ 9960 ක් වෙනවා. මේ තරම් ලොකු හිඟයක් කවදාවත් ඇති වුණේ නැහැ. ගරු රාජ්‍ය ඇමතිතුමා බහින වාය කීවත් අහසට යන තුරු ඉහළ නගි නවා මිස බැහීමක් නම් පෙනෙන්න නැහැ. නමුත් මේ තරම් විශාල හිඟයක් ගත වූ අවුරුදු 18ක පාර්ලිමේන්තු කාලසීමාව තුළ දී කවදාවත් ඇති වී නැහැ. මේ හිඟය පිරි මැසීමට තමුන්නාන්සේලා මොකක්ද කරන්න සූදානම් වෙන්නෙ? මෙහි දැක් වෙන අන්දමට ලක්ෂ 750ක මුදලක් සේවක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අර්ථසාධක අරමුදලිනුත්, රක්ෂණ සංස්ථාවෙනුත්, මධ්‍යම බැංකුවෙ ආශිර්වාදයෙනුත් ලබාගන්න යන බවයි ආරංචි. කොහොම වුණත්, මම ස්තුති කරනවා, මෙමගින් මටත් ප්‍රශංසාවක් කිරීම ගැන. ඒ ප්‍රශංසාව මම පෞද්ගලික වශයෙන් භාර ගන්නෙ නැහැ, බණ්ඩාරනායක රජය මගින්, මගේ අතින් සකස්වුණු සේවක අර්ථසාධක අරමුදලිනුත්, ජනසතු කරන ලද රක්ෂණ ව්‍යාපාරවලිනුත් තමුන්නාන්සෙලාට සහන යන් සැලසීම ගැන මම ඉතාමත්ම සන්තෝෂ වෙනවා. ඒ අතරම මා පිළිබඳව, මගේ කාර්යයන් පිළිබඳව, මා පෞද්ගලික වශයෙන් වර්ණනා කරනු ලැබීම ගැනත් මා සන්තෝෂ වෙනවා. අනික් සියල්ල පැත්තක තිබියදී දැනට සේවක අර්ථසාධක අරමුදලින් පමණක් සැලසී ඇති සේවය අප්‍රමාණයි. 22,500 ක පමණ වන ස්වාමි පක්ෂය, තමන් යටතෙ සේවය කරන 12,50,000 ක් පමණ වන සේවකයන් වෙනුවෙන් මෙම අරමුදලට මුදල් යෙදීමට බැඳී සිටිනවා.

"මේ මුදලින් රුපියල් හතළිස් කෝටියක් ජාතික සංවර්ධන කටයුතු සඳහා තැන්පත් කර ඇත."

ඒ කියන්නෙ පසුගිය අවුරුද්ද වන තුරුයි.

"කම්කරු විනිශ්චය සභා : සේවකයන් 22,500 ක් දැනට සහනය ලබා ඇත."

දැන් කම්කරු විනිශ්චය සභා වැඩ කරන අන්දම ඉතාම කනගාටුදායකයි. කම්කරු ඇමතිතුමා මේ අවස්ථාවේදී නො සිටීම ගැන මා කනගාටු වෙනව. "ටර්ෆ් ක්ලබ්" හෙවත් තුරඟ තරඟ සමාජයට කම්කරු උසාවිය මගින් තීන්දු කළා, එහි සේවය කළ සේවකයින්ට රුපියල් ලක්ෂ 3 ක් ගෙවන්න කියා. එහෙත් අද වන තුරු සතයක්වත් නැහැ. මොකද කාරණය? ඒගොල්ලන්ගෙ ආණ්ඩුවක් තිබෙන්නෙ. ධනපතියන්ගෙ ආණ්ඩුවක් තිබෙන නිසා ඒ අය භය නැහැ, උසාවි තීරණ ක්‍රියාත්මක නොකරන්න. කම්කරුවො ඇවිත් අපට කරදර කරනව. ඒ වගේම එල්. එස්. බී. පෙරේරා මහත්මයාගේ නෝනමහත්මයාට පෞද්ගලික ආරෝග්‍ය ශාලාවක් තිබුණා. එහි සේවය කළ අයටත් ගණනක් ගෙවන්න කම්කරු උසාවිය මගින් තීරණය කළා. දැන් නෝනමහත්මයත් නැහැ; මහත්මයත් නැහැ. කම්කරු උසාවියේ තීන්දුව අඩපණ වෙලා.

"කම්කරු සමූපකාර සමිති : ලංකාවේ නගර 36 ක කම්කරුවන් හාර දාහසට අවුරුදු පතා රක්ෂා සපයා ඇත."

එහෙත් දැන් මොකද වෙලා තිබෙන්නෙ? දැන් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට පමණක් කොන්ත්‍රාත් දෙනව. තරඟ ඇති කරනව. කම්කරු සමූපකාර සමිතිවලට අපි රුපියල් ලක්ෂය දක්වා කොන්ත්‍රාත් දුන්න. දැන් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් තමන්ගේ ආධාරකරුවන් නිසා ඔවුන්ට පමණක් කොන්ත්‍රාත් දීමෙන් මේ කම්කරු සමූපකාර සමිති කඩාකප්පල් වී යනවා.

ලංකා ඛනිජ තෙල් සංස්ථාව : අද කොයි තරම් මට බැන්නත් දොස් කිව්වත්, මගේ මරණපොලේදී, මගේ සොහොනේදී, කවුරු හරි පොඩි ගලක් ඉදි කරනවා ඇති, ඛනිජ තෙල් සංස්ථාවෙන් සිදු වුණු සේවය ගැන කියන්න. මා හිතන විධියට කාවදා හෝ ඒක කරන්නෙ අපේ කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් තුමායි.

**ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. டீ. ஷெல்ற்றன் ஜயசிங்ஹ—கைத்தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)

සමාවෙන්න, මට ඇහුනෙ නැහැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

තමුන්නාන්සෙනෙ හොඳයි කිව්වෙ.

"ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් මෙතෙක් ලබා ඇති ලාභය කෝටි 15 යි. ඉතිරි කර ගැනීමට හැකි වූ විදේශ විනිමය කෝටි 10 යි."

මෙයට වඩා විදේශීය ධනපති තෙල් සමාගම් තුන මගින් අපේ රටේ බාධාවක් නොමැතිව කරගෙන ආව සූරාකෑම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

සම්පූර්ණයෙන්ම නැවතුණා. මාසයකට රුපියල් ලක්ෂ 12 කට වැඩි විදේශ විනිමයක් ඛනිජ තෙල් සංස්ථාවෙන් ඉතුරු වෙනවා යයි තමුන්නාන්සේලාගේ පත්‍ර මගින් ප්‍රචාරය කරනව. ලාම්පු තෙල් වල මිළ පහළ දැම්ම. ආනයන අවසර පත්‍ර මගින් තමුන්නාන්සේලා පැට්‍රෝල්වල බද්ද සියයට 9 කින් වැඩි කරන්න යනව. ඒ අතරම ඉතා ආඩම්බරයෙන් කියනව, "වැඩිවන මිළ අපි පාරිභෝගිකයාට දන්නෙ නැහැ; ඒක අපි සංස්ථාවෙන් අය කර ගන්නව" කියා. ඒ අවස්ථාවෙදි අත්පොළසන් දෙන ශබ්දයකුත් මට ඇහුණා. [බාධාකිරීමක්] කොම්පැණි තිබුණා නම් මක්වෙයිද කියා වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) අහනව. කොම්පැණි තිබුණා නම් එක්සත් ජාතික පක්ෂයේ ආරක්ෂාව මීට වැඩිය තහවුරු වෙයි. අපේ ජාතිය මීටත් වඩා පරිහාණියට පත් වෙනව. කොම්පැණි තිබුණා නම් තමුන්නාන්සේලාට කියන්න බැහැ, "අපි මිළ වැඩි කරනවා. ඒක සම්පූර්ණයෙන් අපි භාර ගන්නවා" කියා. කොම්පැණිකාරයින් ඒ වැඩි වූ මිළ පාරිභෝගිකයන් පිට දායි. එහෙත් ආනයන අවසර පත්‍ර බද්ද වැඩි කිරීමෙන් බලාපොරොත්තු වන ආදායම මේ අවුරුද්දේත් ලැබෙන්නෙ නැහැ.

"රක්ෂණ සංස්ථාව: රක්ෂණ සංස්ථාව මෙතෙක් ලබා ඇති ආදායම රුපියල් පහළොස් කෝටියයි. ඉතුරු කර ගැනීමට හැකි වූ විදේශ විනිමය හය කෝටි විසි ලක්ෂයයි. දේශීය හා විදේශීය ධනපති සමාගම් මගින් කරගෙන ආ රක්ෂණ ව්‍යාපාර සම්පූර්ණයෙන්ම ජාතිය සතු කිරීමෙන් පසු මහජනයාට වඩා හොඳ සේවයක් ලැබේ."

ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා. එහෙත් මට පෙනෙන ලකුණු නම් වැඩිය හොඳ නැහැ. මට ආරංචියි, අද රක්ෂණ සංස්ථාවෙ සභාපතිතුමා එළවා දැම්ම කියා. පත්‍රවල නම් තිබුණේ ඉල්ලා අස් වුණා කියායි. මම විභාග කර බැලුවාම දැනගන්න ලැබුණා, අස් කර තිබෙන බව. ඇයි? තමුන්නාන්සේලාගේ බලවතුන් කීප දෙනකු කිව්වලු, සුදුසුකම් නැති පිරිසකට රක්ෂා දෙන්න කියල. උන්නැහේ කිව්වලු, සුදුසුකම් නැති අයට රක්ෂා දෙන්න අපට බැහැ කියල. හුඟ දෙනෙක් අපේ වැඩ පිළිවෙලට භය වෙලා තිබෙනව. ආණ්ඩුවේ යම්කිසි සේවකයෙක් ජාතික පරිහාණිය පිළිබඳ වැඩක් නීති විරෝධි ලෙස කර තිබෙනවා නම් ඔහුටත් සී. ඩබ්ලිව්. ඊ. කොමිසම වගේ කොමිසමකට මුහුණ දෙන්න සිදු වන බව අප ප්‍රකාශ කර තිබෙනව. ඊට බිය වීමෙන්දෝ ඒ අය මැතක සිට තමුන්නාන්සේලා කියන හැටියටම යටත් වන්නේ නෑ. ලංකා ගමනාගමන මණ්ඩලයේ උසස් නිලධාරියකු කර තිබෙන ප්‍රකාශයක් ඊයේ "ඩේලි නිව්ස්" පත්‍රයෙන් මා දැක්කා. පසුගිය මාස 24 ඇතුළත ලංකා ගමනාගමන මණ්ඩලයට බඳවා ගත් ඩ්‍රයිවර්ලා කොයිතරම් අදක්ෂයින් දැයි කියතොත්, මින් පෙර කිසි කලක නොවූවිරූ තරම් හදිසි අනතුරු ඇති වුණා යයි ඒ නිලධාරියා කියා තිබෙනවා. මොකක්ද මීට හේතුව? මා රාජ්‍ය ඇමතිතුමාට පෞද්ගලිකව දෙස් කියන්නෙ නැහැ. අපට මේවා හිනාවට කරුණු. අප නොයෙකුත් සංස්ථා ඇති කොට ඒවායින් ලැබෙන ලාභවලින් වෙනත් ව්‍යාපාර ඇති කොට ඒවාට මිනිසුන් යොදවන්නට උත්සාහ කළා. එහෙත්, දැන් තමුන්නාන්සේලා කරන්නේ මොනවාද? රත්තරන් බිත්තර දමන කිකිළිය මරා ගෙන කනවා. තමුන්නාන්සේලා රක්ෂණ සංස්ථාවට සුදුසු නැති අය දැම්මා. තෙල් සංස්ථාවට සුදුසු නැති අය දැම්මා. තෙල් සංස්ථාවට පමණක් වුවමනාවට වැඩියෙන් සියයට 35 ක් මිනිසුන් දමා තිබෙනවා. ඇයි මේ? අතුරු මැතිවරණ නිසායි. අතුරු මැතිවරණ 9 ක් ඇති වුණා. නව පොළකට ගොස් පෙන්වන්නට මේ විධියට වැඩ කළා. කර්මාන්ත ඇමතිතුමාත්, එතුමාගේ උප ඇමතිතුමාත්, ජනසතු සේවා ඇමතිතුමාත්, යම් යම් බල කිරීම් ඇති වන විට ඒ අනුව වැඩ කළා. වෙන මොනවා කරන්නද? ආණ්ඩුවේ සිටින්නටත් ඕනෑ. ආණ්ඩුව ජීවත් වන්නටත් ඕනෑ. මහජන බලපෑම් ඇති වන විට ඒවාට ඇහුම්කන් දෙන්නටත් ඕනෑ. ඒ නිසා දිගට හරහට රක්ෂා දුන්නා.

ඊළඟට සමුපකාර තොග වෙළඳ සංස්ථාව ගැන සලකා බලමු.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*

(The Hon. J. R. Jayewardene)

එක්කෙනෙකුවත් ගත්තේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
හිටි අය වෙනුවට වෙනත් අය ගත්තා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
කවුද ?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
අප විසින් දැමූ අය අස්කරදමා තමුන්නාන්සේලාගේ උදවිය දමා ගත්තා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
කවුද ?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
ආරක්ෂක නිලධාරියා. කීදෙනකු දමා ගෙන තිබෙනවාද ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඒ, මා එන්නට කලින්.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
මා තමුන්නාන්සේට දොස් කියන්නේ නැහැ. තමුන්නාන්සේ හොඳ ඇමතිවරයෙක්. එහෙත් "බෑඩ් කම්පනි". සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව පිළිබඳ ප්‍රතිපත්ති අතින් ගරු රාජ්‍ය ඇමතිතුමාගේත් මගේත් අදහස් එකිනෙකට ඉඳුරා වෙනස්. එතුමා කටයුතු කරන්නේ සම්පූර්ණයෙන්ම පෞද්ගලික ව්‍යාපාරිකයා කෙරෙහි භක්තිය තියාගෙනයි. ඒකත් එක්තරා දර්ශනයක්. විශේෂයෙන්ම, බලයේ සිටින්නට වුවමනා උදවිය, තමන් බලයට පත් කරන්නට ආධාර කරන්නට බලාපොරොත්තු වන උදවිය සතුටු කිරීම එක්තරා දර්ශනයක්. අප උත්සාහ කරන්නේ පාරිභෝගිකයින් සනසන්නටයි. රාජ්‍ය ඇමතිතුමාගේත් මගේත් වෙනස මෙයයි. මෙය පන්ති සටනක්. මා නිර්ධන පන්තියෙන් බිහි වුණු කෙනෙක්. එහෙත්, "ස්විස්" බැංකුවෙහි මගේ මුදල් තිබෙනවායයි සමහර අය කියනවා. තමුන්නාන්සේලාට බැරියැ ඒක ජනසතු කරන්නට ! අපගේ පන්ති සටනේ හැටියට අප පාරිභෝගිකයින් සනසන්නට උත්සාහ කරනවා. තමුන්නාන්සේලාගේ පන්ති සටනේ හැටියට තමුන්නාන්සේලා ධනපති ව්‍යාපාරිකයින් සනසන්නට මහන්සි ගන්නවා. මේ දර්ශන දෙකක්. මහනුවර ගරු මන්ත්‍රීතුමා (ඊ. එල්. සේනානායක මයා.) කළ ප්‍රකාශයක් මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. "මාත් මාක්ස්වාදියෙක්. නුඹලා නිධන පන්තියේ. මා ධනපති පන්තියේ. අප දෙගොල්ල සටනක් කළයුතුයි" යනුවෙන් එතුමා කියා තිබෙනවා. ආත්ම ගරුත්වය නිර්ධන පන්තියටත් ධනපති පන්තියටත් පොදු දෙයක් බව මා මේ අවස්ථාවේදී කියන්නට කැමැතියි. ආත්ම ගෞරවය ඇති උදවිය ධනපතියන් අතරත් සිටිනවා. ආත්ම ගෞරවය ඇති උදවිය නිර්ධන පන්තිකයින් අතරත් සිටිනවා. වංකකම නැතිකම ටම පමණක් සීමා වන දෙයක් නොවෙයි. ඇති අය බොහෝ දෙනෙක් වංකයෝ. එම නිසා, යම් යම් ප්‍රකාශයන් කිරීමේදී අප ටිකක් පරෙස්සම් විය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම සංස්ථාවෙන් රටට විශාල සේවයක් සිදු වී තිබෙනවා. වාර්ෂික ලාභය රුපියල් 1,80,00,000යි. රටේ සෑම ජන කොට්ඨාශයකටම එකාකාර සේවයක් සැලසීමයි මෙහි පරමාර්ථය වුණේ. තමුන්නාන්සේලාගේ ආහාර ඇමතිතුමාගේ ස්ථිර ලේකම්තුමාත් දැනට අපේ මුදල් ඇමතිතුමාගේ අංශයෙහි සිටින ආචාර්ය කැලේගම මහත්මයාත් ඇතුළු පස් දෙනකු එකතු වී, ජීවන වියදම පහළ හෙලීම සඳහා මොනවා කළයුතුද යන්න ගැන වාර්තාවක් සකස් කළා. ඒ අය කර තිබෙන නිර්දේශය කුමක්ද ? සමුපකාර සංගම් සමුපකාර තොග වෙළඳ ආයතනයට ගන්නය කියායි. නමුත් මා එය කළේ නැහැ. අපට වුවමනා කර තිබුණේ ජනතාව සනසවන්නටයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
එම නිසා හරියාකාර යුතුකම් ඉෂ්ට කරන සමුපකාර සංගම්වලට අප අත ගැසුවෙ නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
තොග වෙළඳ සංගම්—සුළු සංගම් නොවෙයි.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
ඔව්. නමුත් නිර්දේශ කළේ ඒවත් සමුපකාර තොග වෙළඳ ආයතනයට ගත යුතුය කියායි. අප ඒකවත් කළේ නැහැ. තමුන්නාන්සේලා කියනවා වාගේම අපත් ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා මාර්ග හතරක් උපයෝගි කර ගත්තා. ආණ්ඩුව, ආණ්ඩුවේ සංස්ථා, සමුපකාරය හා පෞද්ගලික ව්‍යාපාර යන හතර මාර්ගයෙන් මේ රටේ ආර්ථික ප්‍රශ්න විසඳන්නට අප ක්‍රියා කළා. තමුන්නාන්සේලා කියන්නෙත් ඒකම තමයි. හැබැයි, තමුන්නාන්සේලා ඒවායේ පුද්ගලයින්ට තැන දෙනවා මිස පාරිභෝගිකයාට තැන දෙන්නේ නැහැ. ඒ මාර්ග හතර උපයෝගී කරගෙන අප මහජනතාවට සේවය කරන්නට බලාපොරොත්තු වූවා මිස මහජනතාව මාගීයෙන් ඒ අංශවල පුද්ගලයින්ට අප ආධාර කළේ නැහැ. තමුන්නාන්සේලා කරන්නෙ ඒකයි. ජීවන වියදම පහත හෙලීම සඳහා බඩු මිළ පහත හෙලීම සඳහා අප දෙයාකාරයකින් ක්‍රියා කළා. සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් හා එහි ශාඛාවලින් අසවල් අසවල් මිළ ගණන්වලට බඩු ගන්නට පුළුවන්ය කීවාම පෞද්ගලික වෙළඳුන් අධික මිළ ගණන්වලට බඩු විකුණන්නට භය වෙනවා. ඒ එක පැත්තක්.

අද තමුන්නාන්සේලා තුළ තිබෙන භය එදත්, 1960 දිත්, තිබුණා. එය කුමක්ද? බොහෝ අවස්ථාවලදී ඔය සමුපකාර සංගම්වල උසස් තැන්වල සිටින්නෙ බලවතුන්. ඒ බලවතුන් අපට විරුද්ධයි. එම නිසා තමයි වර්තමාන අගමැතිතුමාත් තමුන්නාන්සේලාත් අපේ ආණ්ඩුව අද වැටෙනවාය, හෙට වැටෙනවාය, [illegible] මාසයෙන් වැටෙනවාය, හය මාසයෙන් වැටෙනවාය කිය කියා රට හැම තැනම එදා ප්‍රචාර ගෙන ගියෙ. ඒ අතරතුර, බඩු නැත, මේ ආණ්ඩුව හොඳ නැත, කියා වෙළෙඳුන් ප්‍රචාරයක් ගෙන ගියා. ඒ අවස්ථාවේදී යම් යම් ක්‍රියා මාර්ග ගැනීමෙන් බඩු මිළ පහත හෙලීමට අපට වුවමනා කළා. මගේ ගුරුවරයකු වන දැනට වත්තේගම ගරු මන්ත්‍රීතුමාත් (පී. බී. ඒ. වීරකෝන් මයා.) ඒ පිළිබඳව සාක්ෂි දෙනවා ඇති. ඒ කාලෙ එතුමාත් අප සමගයි හිටියෙ. ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැක්කේ මෙන්න මේ ගණන්වලටය කියා බඩු මිළ සීමා කරන්නට අපට සිදු වුණා. ඒ වාගේම බඩු හිඟයක් ඇති නොවන පරිදි අප සමුපකාර තොග වෙළඳ ආයතනයේ ශාඛා නොයෙක් ස්ථානවල විවෘත කළා. පෞද්ගලික සිල්ලර වෙළෙඳුන්ටත් ඒවායින් බඩු බාහිරාදිය ගන්නට අප ඉඩ සලසා දුන්නා. නමුත් අප එක් විශේෂයක් කළා. එනම්, පුරවැසියන් නොවන අයට සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් බඩු ගන්නට ඉඩ නොදීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහජන බැංකුවේ වාර්ෂික ලාභය රුපියල් විසි ලක්ෂයයි.

> "සුළු ආදායම් ලබන පුද්ගලයින්ට, ශිෂ්‍යයින්ට හා සමුපකාර සමිති විශාල සංඛ්‍යාවකට ණය දීමෙන් සහනය සලසා දී ඇත."

මේ ආයතනය අල්ලාගෙන අපට කොපමණ මඩ ගැසුවාද? මහජන බැංකුවෙන් වූ සේවය කෙළවරක් නැහැ. මා නොහඳුනන කෙනෙක් මට මඟුල් ගෙදරකට ආරාධනාවක් එවා තිබුණා. මමත් ගියා ඒ මඟුල් ගෙදරට. මක්නිසාද? තමුන්නාන්සේ පිහිටෙවූ මහජන බැංකුවෙන් ණයක් ගත් නිසා මා අද දියුණු වී සිටිනවා, මේ මඟුලට සහභාගි වන මෙන් මං තමුන්නාන්සේට ආරාධනා කළේ ඒ නිසාය කියා ඔහු මට ප්‍රකාශ කළා. ඇත්ත වශයෙන්ම මා ඔහු හඳුනන්නෙ නැහැ; දැකලත් නැහැ. සමහර විට ඔය කොමිෂන් කාරයො, "ඔන්න ණයක් ගත් මිනිසකුගෙ මඟුල් ගෙදරක ගිහින් හිටපු ඇමතිතුමා අත්සන් කළා"ය කියාවි. ඒ ගැනත් අල්ලස් කොමසාරිස්ට පෙත්සමක් යවාවි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආයතන නිසා අප කොයි තරම් බැණුම් ඇසුවාද ? මේ අවස්ථාවේදී ඒවාට උත්තර යක් දෙන්නට මා අදහස් කරන්නෙ නැහැ. බැංකු කොමිෂන් සභාවේ වාර්තාව තිබෙනවා. ඒ වාර්තාවෙ සඳහන් කර තිබෙන්නෙ කුමක්ද ? " යථා පරිදි ක්‍රියා කිරීමට මෙය එවමි." එපමණයි. ඔය වාක්‍යය සඳහන් කළ කොමිෂන් සභා වාර්තා කීයක් තමුන්නාන්සේලාට ලැබී තිබෙන වාද ? අවුරුදු නවයක් තිස්සේ අපට විරුද්ධව ඉදිරිපත් කළ චෝදනාවලට ලැබී තිබෙන එකම සාක්ෂිය " සුදුසු පරිදි ක්‍රියා කිරීම සඳහා මෙය එවමි " යන්නයි. එපමණයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමුප කාර තොග වෙළඳ ආයතනය පිළිබඳ කොමිෂන් සභා වාර්තාව ගැනත් ගරු ඇමතිතුමා සඳහන් කළා. මගේ ඇමති පදවියෙහි බලපෑම නිසා හතර දෙනෙකුට පත්වීම් දුන්නාය කිව්වා. ඒ ගැන මා දැන් විග්‍රහ යක් කරන්නට අදහස් කරන්නෙ නැහැ. එය යථා කාලයේදී විග්‍රහ කරනවා. බැංකු කොමිෂන් සභාව නම් දැන් අහෝසි වී තිබෙනවා. එහෙත් මේ බැංකු කොමිෂන් සභාව වාගේම, සමුපකාර තොග වෙළඳ ආයතන කොමිෂන් සභාව වාගේම, තවත් කොමිෂන් සභා දෙකක් එම කොන්දේසි උඩම තමුන්නාන්සේලාගේ කාලය තුළ කර තිබෙන දේවල් ගැනත් විභාග කර බලන්නට පත් කරන්න. හැකි නම් එය කරන්නය කියා මා අභියෝග කරනවා. එම කොන්දේසි උඩම තමුන්නාන් සේලාගේ කාලය තුළ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ගමනාගමන මණ්ඩලය, සමුපකාර තොග වෙළඳ ආයතනය, වරාය ආදියෙහි කර තිබෙන දේවල් ගැනත් සොයා බලන්න කොමිෂන් සභා පත් කරන්න. එතකොට මොන මොන දේවල් හෙළිදරව් වේදැයි අපට බලාගන්නට පුළුවනි. එම නිසා, අවංකයයි කියා ගන්නා ගරු ඇමතිවරයෙක් ඉන්නවා නම් තමන්ගේ හොඳ නම රැක ගැනීම සඳහා එයවත් කරන හැටියට මා ඉතා ඕනෑකමින් බැගෑපත්ව ඉල්ලා සිටිනවා.

ජාතික ලොතරැයි මණ්ඩලය ගැනත් කියන්නට කැමතියි. ඒ සමඟ ම මා පිළිබඳව කථා කිරීම ගැන සමා [illegible] ඉල්ලා සිටිනවා. මගේ අතින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උදව්වෙන්, බණ්ඩාරනායක රජයන්ගෙන් කෙරුණු ඒවායි. මා කියන්නේ. ලොතරැයි මණ්ඩලයෙන් ලැබුණු ලාභය කොපමණද ?

" මේ මණ්ඩලය ආරම්භ කිරීමෙන් පසුව අවුරුදු පතා ලැබෙන ලාභය 1 කෝටි 80 ලක්ෂයයි. මේ මුදල් ඉතා වැදගත් ජාතික ව්‍යාපාරයන් කීපයකම සංවර්ධනය සඳහා යොදා ඇත."

මේවායින් ප්‍රයෝජන ලැබීම ගැන අප බොහොම සන්තෝෂ වෙනවා. කරුණාකර කලාතුරකින්වත් කියන්න, " උඹලත් හොඳ වැඩක් කළා " කියා. අපට ටිකක් සන්තෝෂ වන්නට හිතෙන්වත් ඇවිත් කියන්න. වත්කම් හංගා තිබෙන්නේ කොහෙද කියා සොයන්න නැදැයන්ගේ වත්කම් බලන්න සී. අයි. ඩී. කාරයන් එවන්නේ නැතිව ඉඳහිටවත් එසේ කියන්න. මැතිවරණ වේදිකාවල කියන්න ඕනෑ නැහැ. අඩු තරමින් මේ ගරු සභාවේදීවත් කියන්න, " උඹලත් හොඳ වැඩක් කර තිබෙනවා " කියා. මුදල් ඇමතිතුමා නම් කියා තිබෙනවා. තමුන්නාන්සේත් කර්මාන්ත ගැන කියා තිබෙනවා.

කරුණු කීපයක් සංක්ෂේප වශයෙන් ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනවා. ඒවායින් ඔප්පු වෙනවා, මේ බජට්ටුව හොර බජට්ටුවක්, රැවටිලි බජට්ටුවක් බව. සමහරු මෙයට කියනවා, " යැංකි රූකඩ බජට්ටුවක් " කියා. තවත් සමහරු " හිඟන බජට්ටුවක් " කියනවා. තවත් කොටසක් මෙය " ජාතිනාශක අයවැය වට්ටෝරුවක් " යනුවෙන් හඳුන්වනවා. එකිනෙක කරුණු ගෙන එය ඔප්පු කරන්නටයි, මා බලාපොරොත්තු වන්නේ.

දැන් නැවතත් අපි බලමු යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මුදල් ඇමති වශයෙන් කළ 1964-65 අයවැය කථාව සම්බන්ධයෙන් ගරු රාජ්‍ය ඇමතිතුමා කියා තිබෙන්නේ කුමක්ද කියා. එතුමා මෙසේ කියා තිබෙනවා :

" අපි අයවැය ලේඛනයක් මනින්නේ කොහොමද ? එහි ඇති යෝජනාවලින් මහජනයාට ප්‍රයෝජනයක් ලැබෙනවාද නැද්ද යන මිම්මෙනුයි අයවැය ලේඛනයක් මැනිය යුත්තේ. කොහොමද අපි [illegible] විධියකින් මනින්නේ ? මේ රටේ ප්‍රශ්නවලට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
උත්තරයක් දී තිබෙනවාද ඒ ප්‍රශ්න විසඳීමට යෝජනා ඉදිරිපත් කර තිබෙනවාද කියා බැලීමෙනුයි."

මෙසේ කියන්නේ රාජ්‍ය ඇමතිතුමායි. එතුමා තවදුරටත් මෙසේ කියනවා:

"අද මහජනයා මුහුණ පා තිබෙන ප්‍රශ්න මොනවාද ?"

මෙන්න, රාජ්‍ය ඇමතිතුමා කී ප්‍රශ්න:

"අද ලංකාවේ නැඟිය යුතු දේ බහින බවත්, බැසිය යුතු දේ නඟින බවත් අපට පෙනෙන කාර ණයක්; ජීවන වියදම බැසිය යුත්තක්; නමුත් එය දිනපතාම නඟිනවා. රැකිරක්ෂා නැති අයගේ සංඛ්‍යාව බැසිය යුත්තක්; නමුත් ඒ සංඛ්‍යාව දිනපතාම නඟිනවා."

මේවා කියන විට රාජ්‍ය ඇමතිතුමා සිටියේ විරුද්ධ පාර්ශ්වයේ යි. අපි එතුමාගේ කථා වෙන් තව ටිකක් කියවා බලමු:

"අරක්කු වෙළෙඳාමත් දිනපතාම නඟිනවා."

දැන් 10,000 ත් පනිනවා.

"ඒවා බැසිය යුතු දේ බව කවුරුත් පිළිගන්නවා. 1956 පටන් කිසිම අයවැය ලේඛනයකින් මේවා බැස්සීමට යෝජනා ඉදිරිපත් කර නැහැ."

රාජ්‍ය ඇමතිතුමා විරුද්ධ පාර්ශ්වයේ හිටියා නම් අද එයම දහ වාරයක් හයියෙන් කියනවාට අඩමානයක් නැහැ.

"ඊළඟට නැඟිය යුතු දේ ගැන බලමු."

රාජ්‍ය ඇමතිතුමා නැඟිය යුතු දේ ගැනත් කියනවා.

"ලංකාවෙන් පිට තිබෙන අපේ රත් පවුම් අරමුදල නැඟිය යුත්තක්; නමුත් එය දිනපතාම බහිනවා. නැඟිය යුතු, එහෙත් දිනපතාම බහින තවත් බොහෝ කරුණු ගැන අපි දන්නවා."

මෙසේ කියන්නේ රාජ්‍ය ඇමතිතුමා මිස මා නොවෙයි.

"මේ අයවැය ලේඛනයෙන් බැසිය යුතු දේ බසී විය, නැඟිය යුතු දේ නඟීවිය කියා කල්පනා කිරීමට මට නම් අමාරුයි"

"මටත් අමාරුයි" කියා රාජ්‍ය ඇමතිතුමා කියනවා. තමුන්නාන්සේ අද විරුද්ධ පාර්ශ්වයේ හිටියා නම් කොයි විධියට කියයි ද? ඒ නිසා අප බලන්නට ඕනෑ, හත් හවුල් රජයේ මුදල් ඇමතිතුමාගේ පසුගිය අයවැය ලේඛණ දෙකින් නුත්, මේ අයවැය ලේඛනයෙනුත්—ඒවායේ සඳහන් යෝජනාවලින්—නැඟිය යුතු දේ කොයිතරම් දුරට බැස තිබෙනවා ද, බැසිය යුතු දේ කොයි තරම් දුරට නැඟ තිබෙනවාද කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයක පරම යුතුකම වන්නේ ජනතාවට වුව මනා දේ ලබා ගැනීමට වාතාවරණයක්, පරිසරයක් ඇති කර දීමයි. ජාති භේද යෙන් පංති භේදයෙන් ආගම් භේද යෙන් මෙන්ම කට්ටි භේදයෙන් තොරව හැම දෙනාටම මිනිසුන් හැටියට ජීවත් වන්නට අවස්ථාව ලබා දීම සාධාරණ රජ යක යුතුකමයි. මිනිසාට වුවමනා කරන කාරණා කීපයක් තිබෙනවා. පරණ කථාවේ හැටියට නම් ඒවා කෑම ඇඳීම හා ඉඳීමයි. එහෙත් දැන් හැටියට කෑම ඇඳීම නිවාස ව්‍යායාමය විශ්‍රාමය ආරක්ෂාව මෙලොව පරලොව යන කොයි දේ ගැනත් හිතන් නට ඕනෑ. මේ සියල්ලම දැන් ඕනෑ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා නම් අර්ථ ශාස්ත්‍රඥයෙක් නොවෙයි. මා කවදාකවත් විශ්ව විද්‍යාලයක ඉගෙනීම ලබා නැහැ. විශ්ව විද්‍යාලවල ශිෂ්‍ය සංගම් වලට නම් මා ගොස් තිබෙනවා. එපමණයි. එහෙත් දැන් අවුරුදු 54ක් තිස්සේ ජීවිතය නමැති විශ්ව විද්‍යාලයේ දුක සැප නමැති විභාග ගණනාවක්ම පාස් කර තිබෙනවා. මා පමණ දුක් විභාග පාස් කළ තැනැත්තකු නම් මේ රටේ දේශපාලන භූමියෙහි තවත් ඇතැයි මා හිතන්නේ නැහැ. එසේ හෙයින් මේ ආණ්ඩුවේ වාර්තා වලින් ද, ආණ්ඩු පක්ෂයේ උදවියගේ කථා වලින් ද මහ බැංකු වාර්තාව නමැති බයිබලයෙන් ද කරුණු උපුටා ගෙන බණ්ඩාරනායක රජයවලින් අපේ රටවැසි මහජනතාවට කොතරම් දියුණුවක් ලැබුණා ද, මේ ආණ්ඩුව යටතේ කොතරම් පිරිහීමක් ඇති වුණා දැයි පෙන්වන්නට මා අදහස් කරනවා. නොයෙකුත් වාර්තා වල හා කථාවල කොටස් උපුටාගෙන කරුණු ඉදිරිපත් කරන්නට මා අදහස් කරනවා.

මගේ අදහසේ හැටියට යම් රටක ජාතික ආදායම ජාතික වියදමට වැඩි නම් ඒ රටේ ආර්ථික තත්ත්වය හොඳයි. එහෙත් ජාතික වියදමට වැඩියෙන් ජාතික ආදායම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොතරම් ඉහළින් තිබුණත් පුද්ගලයකුගේ ආදායම ඔහුගේ වියදමට වඩා අඩු නම් වැඩක් නැහැ. රාජ්‍ය ඇමතිතුමා ඇතුළු ආණ්ඩු පක්ෂයේත්, මා ඇතුළු මේ පැත්තේත් තිබෙන වෙනස ඕකයි. ජාතික වියදමට වඩා පිටින් ගෙනෙන ලද හෝ රට තුළින්ම ලබා ගන්නා ලද හෝ ආදායමක් පෙන්වන්නට මෙම ආණ්ඩුවට හැකි නම් එයින් මෙම ආණ්ඩුව සැනසෙනවා. එහෙත් අප නම් එවැන්නකින් සැනසීමක් ලබන්නේ නැහැ. අපට වුවමනා කරන්නේ ජාතික වියදමට වැඩි වූ ජාතික ආදායමක් ඇති කර ගන්නවා වාගේම, පුද්ගලයාගේ ආදායම පුද්ගලයාගේ වියදමට වඩා ඉහළින් තැබීමයි. ධනපති රටවලටත් දැන් මේ කාරණයෙහි ඇති වැදගත්කම අවබෝධ වී ගෙන යනවා. මේ පිළිබඳව ධනපති රටවල් ද නොයෙකුත් දේ කියනවා. මම දැන් ඇමෙරිකන් ලේඛකයකුගේ ලිපියකින් කොටසක් කියවන්නම්.

"BUSINESS AS A SOCIAL INSTITUTION BY DAVID PACKARD"

ඩේවිඩ් පැකාඩ් ඇමෙරිකන් ලේඛකයෙක්.

"We are continuing to experience the most impressive period of economic prosperity and growth in the history of America. In statistical terms, our production of goods and services, as measured by the gross national product calculation, has grown from a rate of 504 billion dollars in 1960 to an estimated 725 billion dollars in 1966.

To put these figures in perspective, we have increased in a mere five years our output of goods and services by an amount nearly equal to the total goods and services now available to the people in France and Germany combined. In terms of the total goods and services available in America, this is an increase of over 40 per cent. If we make adjustments for population growth, which has been substantial, and inflation, which is less significant, the average American has 17 per cent. more of the material things in life than he had five years ago."

කොතරම් වැඩි වීමක් ද යන්න එයින් පේනවා. මා කියවන්නට අදහස් කරන කොටස ඊළඟට මෙන්න තිබෙනවා. මේ කොටස බොහොම වැදගත්.

"Yet, with this widespread and growing affluence there is a strong current of restlessness, a growing concern among the American people about their society. It is a concern among groups of people who feel they have not received their fair share of the increasing prosperity."

එහි තවදුරටත් මෙසේ කියා තිබෙනවා :

"This concern about America and its future is apparent in every facet of our society. It is being expressed in the government by a myriad of new laws and administrative action directed towards social welfare."

වැදගත්ම කොටස නම් මෙයයි :

"It is being expressed by the churches, no longer content with the role of leading the way to a better life in the hereafter. They are increasingly becoming involved in trying to make a better life here, now."

අමෙරිකාවත් එහෙමයි හිතන්නේ. තමුන්නාන්සේලාට උගන්වන පාඩම් ඒ අයටත් එපා වෙලයි ඉන්නේ. ඒ පිළිබඳව දූන් අමෙරිකාවේ විශාල බලපෑමක් තිබෙනවා. සියයට 17 ක ජාතික නිෂ්පාදනයක් තිබෙන ඒ රටේ අද එවැනි බලපෑමක් ඇති වී තිබෙන්නේ මන්ද? අපේ රටේ ජාතික නිෂ්පාදනය සියයට 1.6 යි. ඊට බෙහෙවින් වැඩි ප්‍රමාණයක් තිබෙන ඒ උදවියට දූන් මහජනතාවගෙන් විශාල බලපෑමක් කෙරෙනවා. "තමුන්නාන්සේලා කොතෙක් පොහොසත් වුවත් අපට ඒවායින් ප්‍රතිඵලයක් නැහැ" යනුවෙන් මහජනයා කියනවා. මෙම තත්ත්වය දූන් පල්ලිවලටත් බෝ වෙලා. මීගමුවේ ගරු මන්ත්‍රීතුමනි, පල්ලිත් දූන් ඒ ගැන කියනවා. "එලොව ගැන පමණක් බලා බැහැ ; මෙලොවත් බලන්ට ඕනෑ" යනුවෙන් මහජනතාව කියන වචනවලට අප ඇහුම්කන් දිය යුතුය කියන කාරණය දූන් පල්ලිවලිනුත් රජයට කියා සිටිනවාලු.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்ணண்டோ)*
(Mr. Denzil Fernando)
මොන පල්ලිද ?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
මොන පල්ලිත් එහෙම කියනවාලු. තමුන්නාන්සේලාගේ පල්ලිත් එහෙම කියනවා ඇති. [බාධා කිරීමක්] එහෙම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
කියන්නේ නැද්ද? මහජනයාට සැප සම්පත් දෙන්වය කියා තමුන්නාන්සේලාගේ පල්ලි කියන්නේ නැද්ද? ඒ ගැන තමුන්නාන්සේට වඩා මා දන්නවා. මාත් ඉගෙන ගෙන තිබෙන්නේ පල්ලියේ ස්කෝලයකයි.

නියෝජ්‍ය කථානායකතුමා
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Three minutes more.

ඉලංගරත්න මයා.
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

I will take some time.

නියෝජ්‍ය කථානායකතුමා
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The Opposition Whip has given the hon. Member one and a half hours, which time will be over at 11.45 A.M. If he does not finish his speech by that time he will be taking up the time of another Member of the Opposition. It is only on that condition that I can allow him to go on till 12 noon.

ඉලංගරත්න මයා.
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

I should like to continue even thereafter.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

You can take my time.

නියෝජ්‍ය කථානායකතුමා
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

That is why I have requested the Whips to discuss this matter and fix the time to be allotted to hon. Members; otherwise, every hon. Member will want extra time and then it will be difficult to accommodate everyone. Whatever it is, the Whips can discuss this during the lunch interval and decide on allocation of extra time. The hon. Member can go on till 12 noon.

ද සොයිසා සිරිවර්ධන මයා.
*(திரு. டி. சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

We do not know exactly the number of hours that the Opposition will have for the Debate. Are we having the party leaders' meeting at 4 o'clock ?

නියෝජ්‍ය කථානායකතුමා
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Yes, we are having a meeting today.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

Shall we have the meeting tomorrow ?

නියෝජ්‍ය කථානායකතුමා
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Cannot we have it in the morning because we will have to come to some working arrangement ? Can we meet at 9.30 tomorrow morning ?

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

We are having a meeting of the Parliamentary Group tomorrow morning to elect a Senator.

නියෝජ්‍ය කථානායකතුමා
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Then, at 4 o'clock.

ද සොයිසා සිරිවර්ධන මයා.
*(திரு. டி. சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

Till such time we will not know exactly how much time the Opposition will have.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Will the two Whips get together and come to a decision during the interval ?

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

The Government has promised to give half an hour of their time to the Opposition.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

I do not think it is a promise. The hon. Minister has just mentioned it.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

From my time I shall give a quarter of an hour. The hon. Member for Kolonnawa is reading from the speeches I made while I was in the Opposition.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

Thank you very much. It is interesting when they stand on a high pedestal and express their views while being in the Opposition.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

I shall give you a quarter of an hour.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Anyway, the time must be taken from the time allotted to the Opposition, not from the Government.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1965-66 අයවැය ලේඛනය පිළිබඳ විවාදයෙදි ගරු අගමැතිතුමා බොහොම වේගවත් ස්වර යෙන් කතා කර තිබෙනවා. එතුමා කර තිබෙන කථාවෙන් එක් කොටසක් මෙසේ යි :

"When we went to the country we told the people of this country that you were all wrong. So we told the people who had suffered for nine years under those policies, 'Return us to undo all this.' The people accepted our word. That is why we are here. We are not here to carry out your policies, we are here to carry out our policies as we promised the people, . . . . ."—[OFFICIAL REPORT, 26th August 1965 ; Vol. 61, c. 1844.]

**වෛද්‍යාචාර්ය නාගනාතන්**
*(டொக்டர் நாகநாதன்)*
(Dr. Naganathan)

Hear, Hear !

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

What did we promise the people ?

ඊ ළඟ ප්‍රශ්නය ඒකයි. අගමැතිතුමා කිව්වේ කුමක්ද ? අප ඇවිත් සිටින්නේ තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ක්‍රියාවේ යොදවන්නට නොවෙයි. අප ආවේ අපේ ප්‍රතිපත්ති ක්‍රියාවේ යොදවන්නටයි. අප මැතිවරණයේදී කිව්වා, තමුන්නාන්සේලාගේ වැඩ හරි නැත, තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති වැරදිය, ඒවා හරිගස්සන්න අපව එවන්නය කියා. මහජනතාව අවුරුදු 9 ක් දුක් වින්දා. ඒ මහජනතාව දැන් අපව පත් කර එවා තිබෙනවා. අප දුන් පොරොන්දු අප දැන් ඉටු කරනවා.

අගමැතිතුමා මැතිවරණයේදී කීවේ කුමක්ද කියා ඊ ළඟට සොයා බලමු. 1965 හේ එක්සත් ජාතික පක්ෂයේ මැතිවරණ ප්‍රකාශනයෙන් මා මේ කියවන්නේ :

" අහස උසට නැග්ග ජීවන වියදම නිසා කම්කරු ජනතාව නොසන්සුන් ව, ගම්බද ජනතාව දුක් ගින්නකට වැටී මහ පෙරළියකට සැරසෙද්දී ශ්‍රී ලංකා පක්ෂය මහා දේශපාලන කපටිකමක් කර,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
මාක්ස්වාදීන් සමග හවුල් වී, ජීවන බරින් තැලී පෙලී සටන්කාමීව සිටි ජනතාව ඒකාධිපති බල යෙන් නිහඬ කර, මුළු මහත් රටම දාස භාවයට ගැනීමට මාන බැලීය. මහජන මතය පාගා ගෙන තව අවුරුදු 20 ක් බලෙන් රට පාලනය කරන්නට ඔවුහු කටමැත දෙඩවූහ."

මෙන්න ඊ ළඟට තියෙන කොටසක්:

"යුක්ති ගරුක ආණ්ඩුවක්: රටේ සෑම නීති යක්ම ලොකු කුඩා කොයි කාටත් එක හා සමානව බලපෑ යුතුය. අද හවුල් ආණ්ඩුවේ හිතවතුන්ට හා මැති ඇමතිවරුන්ගේ නෑදෑයින්ට නීතියෙන් පිටස්තරව කෙතරම් වාසි සැලසෙන්නේද? එවැනි අසාධාරණකම්වලින් තොර කාටත් එක හා සමානව සලකන, යුක්ති ගරුක, ධාර්මික ස්ථාවර රජයක් පිහිටුවීමට එක්සත් ජාතික පක්ෂය පොරොන්දු වෙයි."

"අද හවුල් ආණ්ඩුවේ හිතවතුන්ට හා මැති ඇමතිවරුන්ගේ නෑදෑයින්ට නීතියෙන් පිටස්තරව කෙතරම් වාසි සැලසෙන්නේද?"

විභාගයක් පවත්වමුද, තත්ත්වය කෙසේද කියා බලන්න? කර්මාන්ත ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා හිනහා වෙනවා, මෙහෙමත් දේවල් අප කිව්වා නේද, දැන් අප කරන්නේ මෙහෙම නේද කියා.

ගරු අගමැතිතුමා කිව්වා, තමුන්නාසේලා කියන විධියට කරන්න නොවෙයි, මහ ජනතාව අපව එව්වේ කියා. දැන් කොහොමද කරන්නෙ?

"සිංහල රජදරුවන් දවස ශ්‍රී ලංකාව දශරාජ ධර්මයෙන් පාලනය කළාක් මෙන් බුද්ධාගමට නිසි තැන දී අන්‍යාගම් අදහන්නවුන්ට ආගම් ඇදහීමේ නිදහස දෙමු.

සේවක ස්වාමි සබඳකම්: සියලුම අංශවල, සියලුම තරාතිරම්වල සේවකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත්, තවදුරටත් ඔවුන්ගේ ශුභසිද්ධිය සැළසීමටත් අපි පොරොන්දු වෙමු. සේවකයින්ටත්, ඒ ඒ ව්‍යාපාර පාලන කටයුතුවල හවුල් කරුවන් විය හැකි ලෙසත්, ලාභයෙන් කොටසක් ඔවුන්ට භුක්ති විඳිමට හැකි ලෙසත්............"

තවම නම් ඒ වැඩේ කෙරිලා නැහැ. මේ කම්කරු ඇමතිතුමා ආවට පස්සෙ බොහොම හඬ නගා කිව්වා, ව්‍යාපාරිකයන්ගේ ලාභයෙන් කොටසක් සේවකයන්ට දෙන වාය කියා. තවම ඒ වැඩේ කෙරුණෙ නැහැ, මට අයිති "සබ්බ සයුරම" ඔඩ්ඩු අල්ලෙන් නම් ඔය වැඩේ කවදාවත් කරන්නෙ නැත කියා. තමුන්නාන්සේලාට තබා අපටවත් බැරි වුණා, ඔය වැඩය කරන්න.

"............... සේවක පක්ෂයත්, ස්වාමි පක්ෂයත් අතර සුහද සබඳකමක් වගා කිරීමට අවශ්‍ය නීති රීති සම්පාදනය කර ඒවා වහා ක්‍රියාවේ යෙදවීමට එක්සත් ජාතික පක්ෂය පොරොන්දු වෙයි."

"මුදල් හදල්: නිදහස්—සමසමාජ—කොමියුනිස්ට් හවුල් ආණ්ඩුවේ අකාර්යක්ෂම පාලනය නිසා රට අන්ත බංකලොත් භාවයකට පත් විය."

ගරු රාජ්‍ය ඇමතිතුමාටත් හිනා. මේක සකස් කෙළේ එතුමා වන්නට ඇති.

"19 වැනි සියවසේ මුල් භාගයේ යුරෝපයේ සමාජ ක්‍රමයක විෂමතාවන් අතරින් මතුවුණු මාක්ස්වාදයේ යල් පැනපු තර්ක විතර්ක හා පාලක පක්ෂයේ දූෂණ හා තකතීරු වැඩ නිසා රට ගිගමනට පත් විය."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනසතු කිරීම් වැඩි හරියක් සිදු වී තිබෙන්නේ මගේ ඇමති අංශයෙයි. මා මාක්ස් වාදයේ අකුරක්වත් දන්නෙ නැහැ. අපේ තේ ගන්නට බැරිය කියා අද වගේ එදත් විශාල කලබැගෑනියක් ඇති වුණා. ඒ නිසා ආදායම පහළ ගියා.

ලංකාවේ මුදල් තත්ත්වය මා සඳහන් කළ අන්දමින් පවතිද්දී මා ඉරාකයටත් මිසරයටත් ගියා. එහිදී ඇති වූ සාකච්ඡාවල දී අපට මුහුණ පාන්නට සිදු වූ තත්ත්වය කුමක්ද? ලංකාවේ තේ බොන්නට ඒ අය කැමති බව ඔවුන් ප්‍රකාශ කළා. "අපේ මිනිසුන් ඔබේ තේ බොන්නට කැමතියි; එහෙත් ඒ සඳහා ගෙවන්නට අපට මුදල් නැහැ" යනුවෙන් ඒ අය අපට කියා සිටියා. අපෙන් යම් ද්‍රව්‍යයක් ලබාගෙන ඒ වෙනුවට අපට තේ දෙන්නට කැමති නම් හොඳයි යනුවෙන් ඒ උදවිය කියා සිටියා. ඒ ගැන සලකා බලනන්ට අපට සිදු වුණා. අපේ රට මෙන්ම යටත් විජිතවාදී රටක් හැටියට තිබී මෑතදී නිදහස් වූ රටවල් නිසා ඒ රටවල මුදල් තත්ත්වය සතුටුදායක නැහැ. ඒ රටවලින් මොනවා නමුත් අපේ රටට ගෙන යතොත් අපේ රටෙන් තේ ගෙන්වා ගැනීමට ඒ අය කැමැත්ත ප්‍රකාශ කළා. මේ ගැන සොයා බලන විට අපට පෙනී ගියේ ඒ අයට පෙට්‍රල් තිබෙන බවයි. ඒ නිසා ඒ රටෙන් පෙට්‍රල් ගෙන්වා ගන්නබව අප කල්පනා කළා. ඒ අනුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපට තීරණයක් ගන්නට සිදු වුණා. පෙට්‍රල් ගෙන්වා ගත්තාම ඒවා විකුණන් නැයි කොම්පැනිකාරයින්ට කිව්වාම— අපේ තේ වෙනුවට අප ගෙන්වන පෙට්‍රල් අරන් බෙදා දෙන්නැයි කොම්පැනිකාර යින්ට කිව්වාම—"අපේ ටැංකිවලට රතු තෙල් දමන්නේ නැහැ" යනුවෙන් කොම් පැනිකාරයින් කියන්නට පටන් ගත්තා. එයින් ඇති වූ තත්ත්වය කුමක්දැයි තමුන් නාන්සේ දන්නවා. මට තිබෙන්නේ පොල්ගෙඩි සියයක් පමණක් නම් එය හෝ විකුණා මට වුවමනා කරන වෙනත් දේවල් ලබා ගත යුතු බව තමුන්නාන්සේ දනන්වා. මා ළඟ සල්ලි නැත්නම්, මා ළඟ තිබෙන දෙයක්වත් විකුණන්නේ නැතිව මා වෙන මොනවා කරන්නටද? ඒ නිසා අපේ තේ විකුණා ඒ වෙනුවට පෙට්‍රල් ගන්නට සිදුවුණා. එසේ කළේ මාක්ස් වාදයක් නිසා නොවෙයි. මා දන්නා මාක්ස් වාදයක් නැහැ. මා මාක්ස්වාදය දැන ගත් නිසා එසේ කළා නොවෙයි. කොහේ හරි පොතක ඒවා තිබුණාවේ. ඒවා යම් යම් පොත්වල තිබුණු නිසාම අපට අපේ අත් දැකීම් අනුව පිළිගතහැකි දේවල් අහක දමන්නට පුළුවන්ද? අපේ විදේශ විනිම ය අඩුවේගන යනවා දකින්නට ලැබුණාම ඒ ගැන සුදුසු වැඩක් කිරීම අපේ යුතු කමක් නොවෙයිද? ඒ නිසා අපට රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙනුත් නිසි පරිදි ක්‍රියා කරන්නට සිදු වුණා. කොයි දේ ගැනත් එහෙමමයි.

මම තවදුරටත් කියවන්නම්:

"**රැකීරක්‍ෂා:** සෑම සියලු රටවැසියකුටම රක්ෂා වක් තිබිය යුතුය. එය පාලකයින් විසින් පැහැර නොහැරිය යුතු වගකීමෙකි. රජයේ අදූරදර්ශී තීරණ හා මෝඩකම් නිසා රක්ෂාව නැති වූ දස දහස් ගණනට අමතරව ලියාපදිංචි වී සිටින රක්ෂා නැති අයගේ සංඛ්‍යාව පන් ලක්ෂයකට වැඩියි. රැකීරක්‍ෂා සුලභ වන අන්දමට රටේ තත්ත්වය දියුණු කරන ලෙස පාලකයින්ට බල කිරීමට මේ රක්‍ෂා නැති පිඩිතයින්ට අයිතියක් තිබේ."

ලියාපදිංචි වූ, රැකීරක්ෂා නොමැතියවුන් ගේ සංඛ්‍යාව පන් ලක්ෂයටත් වැඩිලු. ඒ කාලයේ තිබුනු තත්ත්වය හැටියටයි ඔය කියන්නේ. ඒ තත්ත්වයේ හැටියට නම් ඔය ගණන් වැරදියි. මේ ඉලක්කම් කො හෙන් ගත්තාදැයි කියන්නට මා දන්නේ නැහැ. එදා රැකීරක්ෂා නැති අය පන් ලක්ෂයත් ඉක්මවා සිටියා නම් අද ඒ ගණන දශ ලක්ෂයත් ඉක්මගොස් සිටින් නට පුළුවනි.

"මේ තත්ත්වය නැති කිරීමට අපි පොරොන්දු වෙමු."

දෙන පොරොන්දු ඉටු කෙරෙන හැටි නම් කවුරුනුත් දන්නවා.

"**රජයේ සේවය:** රජය මෙන්ම රජයේ සේව යත් ඉතාම වැදගත් ය. පොදු මහජන මතය අනුව ධාර්මික ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සඳහා තෘප්ති යට පත් රජයේ සේවක පිරිසක් හා ඔවුන් අතර සහයෝගය හා සාමූහික වගකීම පිළිබඳ හැඟීමක් තිබිය යුතුය. හවුල් ආණ්ඩුව කළාක් මෙන් රජයේ සේවකයින්ට ගර්ජන හා තර්ජන කර, අයුතු දඬුවම් දී, රහස් පොලිස් දැල් එළා, ඉහළ තැන්වලට......"

අපේ අධ්‍යාපන ඇමතිතුමා ඉන්නවාද?

"රහස් පොලිස් දැල් එළා, ඉහළ තැන්වලට අසාධාරණ ලෙස තම තමන්ගේ හිතවතුන් හා පාක්ෂිකයින් පත් කර රජයේ සේවකයන්ගේ හොඳහිත හෝ සහයෝගය ලබා ගත නොහැකිය."

තමුන්නාන්සේගේ ස්ථිර ලේකම් එහෙම තෝරා ගත්තේ කොහොමද? දැන් ප්‍රවෘත්ති ලේකම් කෙනෙකුත් පත් කරන් නට යනවා, අපේ ගරු අගමැතිතුමා.

"පාක්ෂිකයින් පත් කර රජයේ සේවකයින්ගේ හොඳ හිත හෝ සහයෝගය ලබාගත නොහැකිය."

ඒක නම් ඇත්ත. තමුන්නාන්සෙලාගේ වැඩ කටයුතු නිසා දැනටමත් රජයේ සේ වකයන් සම්පූර්ණයෙන්ම කලකිරීගෙන යන බව පෙනී යනවා.

"ඔවුන්ගේ සහයෝගය ලබාගත හැක්කේ සාධා රණයත් යුක්තියත් ඉටු කර, දේශපාලන ඇඟිලි ගැසීම්වලින් තොරව ඔවුන් උනන්දු කිරීමෙන් හා මෙහෙයවීමෙන් පමණි."

අල්ලස් කොමිෂන් සභාව සම්බන්ධ යෙන් කියන්නට තිබෙන්නෙ මොනවාද? කොමසාරිස්තුමා මාරු කළේ කොහොමද? සිංහල භාෂාව පිළිබඳ වැඩ පිළිවෙළ හරියා කාර ක්‍රියාත්මක නොකරතැයි භාණ්ඩා ගාරයට දොස් කී නිසා මොකක්ද වුණේ? රාජ්‍ය භාෂා කොමසාරිස්තුමා පිටමං කර දැම්මේ මොන අන්දමටද? වෙනත් පත් වීමක් දී එතැනින් ඉවත් කළේ නැද්ද? සාධාරණය ඉටු කරන්නේ ඒ අන්දමටද?

"රජයේ සේවයේ ඇතැම් කොට්ඨාශවලට දේශ පාලන නිදහස දීම යුක්ති සහගත බව අපේ පිළි ගැනීමයි."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

තමුන්නාන්සේලා කර තිබෙන්නේ කුමක්ද? සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ කම්කරුවන් මෙතෙක් කල් භුක්ති විඳගෙන ආ, ඒ දේශපාලන නිදහස ඔවුන්ගෙන් ඉවත් කළේ නැද්ද? ඔවුන්ගේ දේශපාලන නිදහස මේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ අහෝසි කර දැම්මේ නැද්ද? රටට ප්‍රකාශ කළේ ඇතැම් කොට්ඨාශවලට දේශපාලන නිදහස දීම යුක්ති සහගත ලෙස තමන් පිළිගන්නා බවයි. එහෙත් ක්‍රියා කර තිබෙන්නේ ඇතැම් කොට්ඨාශවලට තිබුණු දේශපාලන නිදහසත් නැති කර දැමීමයි. තිබුණු ටිකත් ආපසු අරන් තිබෙනවා.

"මේ කොට්ඨාශ තෝරා බේරා වෙන් කළ යුත්තේ සියලුම දේශපාලන පක්ෂවලින් සමන්විත පාර්ලිමේන්තු කොමිටියක් මගිනි."

භාෂා ප්‍රතිපත්තිය ගැනත් තමුන්නාන්සේලා කිව්වේ කොහොමද? වටමේස සාකච්ඡාවක් ඇති කරනවාය කිව්වේ නැද්ද? එහෙත් එවැන්නක් කර තිබෙනවාද? තමුන්නාන්සේලාගේ අගමැතිතුමාට ආත්ම ශක්තියක් නැහැ. ආත්ම අවංකකමක් නැහැ එවැන්නක් කරන්නට. ඒ වෙනුවට රහස් ගිවිසුමක් ගහ ගත්තා. තමුන්නාන්සේලා බලයට පත් වුණා පමණයි, රහස් ගිවිසුමක් ඇතිකර ගත්තා. ඒ කාරණය මෙහිදී මා තරයේම කියා සිටිනවා. රහස් ගිවිසුමක් ගහලා තමයි තමුන්නාන්සේලා බලය ලබා ගත්තේ. පෙඩරල් පක්ෂයට නොයෙක් පොරොන්දු දීලා තමයි, ඒ උදවිය ආණ්ඩුවට ඇදා ගත්තේ.

"**පොලීසිය සහ හමුදාව:** මෙම සේවාව විසින් දුක් කරදර, ගැහැට රාශියක් මැද්දේ රටටත් ජනතාවටත් ඉතාම අවංක සේවයක් කර ඇත. මෑතක පටන් දේශපාලනඥයන්ගේ ඇඟිලි ගැසීම් නිසා හමුදාවටත් පොලිසියටත් අපක්ෂපාතව සේවය කිරීමට තිබුණු ඉඩකඩ ඇහිරී ඇත."

අපක්ෂපාතව ක්‍රියා නොකළ හමුදාවේ අය අසු වූ විට තමුන්නාන්සේලා කරන්නේ මොකක්ද? වෙන එකක් තබා කුමන්ත්‍රණයක් කර අසු වූ හමුදාවේ හා පොලීසියේ අයට තමුන්නාන්සේලා කර තිබෙන්නේ මොකක්ද? තමුන්නාන්සේලා ඔවුන්ව ධෛර්යමත් කරනවා. ප්‍රජාතන්ත්‍රවාදී රජයක් පෙරළීමට උදව් කළ හමුදා නිලධාරීන්ට තමුන්නාන්සේලා උදව් කර තිබෙනවා. එයින් එක් අයෙක් හෝටල් සංස්ථාවේ සභාපති. එවකට සිටි පොලිස් පතිටත් ලොකු පදවියක් දී තිබෙනවා. මා සඳහන් කරන්නේ ළඟදී අස් වූ පොලිස් පති ගැන නොවෙයි; කුමන්ත්‍රණයට අසු වූ තැනැත්තා ගැනයි.

ඊළඟට අල්ලස් හා දූෂණ. ඒක තමයි බණ්ඩාරනායක ආණ්ඩුව කෑවේ. ඒ පිළිබඳව තමුන්නාන්සේලා කියා තිබෙන්නේ මොනවාද? [බාධා කිරීමක්] මැතිවරණය කාලයේදී තමුන්නාන්සේ වේදිකාවට ආවේ නැහැ. ඒ කාලයේ වේදිකාවට ආවේ ලොකු අය.

**එස්. බී. හේරත් මයා.** (හිරියාල)
*(திரு. எஸ். பி. ஹேரத்—ஹிரியால)*
(Mr. S. B. Herat—Hiriyala)

අල්ලස් ගැන කථා කළේ කවුද කියලයි මා ඇසුවේ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

කථා කළේ තමුන්නාන්සේලාගේ පක්ෂය.

**එස්. බී. හේරත් මයා.**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herat)

දැන් කථා කරන්නේ කවුද?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

මම තමුන්නාන්සේලාට ඇඟිල්ල පෙන්වා හූනක් කියන්නම්. දැන් තමුන්නාන්සේලා කියන්නේ නැහැ. වැරදිකාරයෝ තමුන්නාන්සේලායි.

"**අල්ලස් හා දූෂණ:** රජයේ හා පොදු අංශ හැමෙකකින්ම අල්ලස් හා දූෂණතා අතුගා දැමීමට විශේෂ කොමිසමක් පත් කිරීමට එක්සත් ජාතික පක්ෂය පොරොන්දු වෙයි. අපේ මහජන මන්ත්‍රීවරුන් සහ උත්තර මන්ත්‍රීවරුන් ඔවුන්ගේ වත්කම් හා ආදායම් මාර්ග අවුරුදුපතා හෙළි කරනු ඇත. උසස් පෙළේ රජයේ සේවකයකු වේවා දේශපාලනඥයකු හෝ වේවා අල්ලස් දූෂණ චෝදනාවකට වරදකාරයෙකු වුවහොත් ඔහුට කිසිම සමාවක් හෝ ආරක්ෂාවක් එක්සත් ජාතික පක්ෂයෙන් නොලැබෙනු ඇත."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අල්ලස් කොමිසමක් පත් කරන්නය කියා කෝට්ටේ මන්ත්‍රීතුමා තමුන්නාන්සේලාට කියමින් අවුරුදු 8 ක් තිස්සේ කෑමොර ගැසුවා. එවැන්නක් කිරීමට තමුන්නාන්සේලාට ආත්ම ශක්තියක් තිබුණේ නැහැ. අන්තිමට එය කළේ බණ්ඩාරනායක අගමැතිතුමායි. එමෙන් ම අල්ලස් ගත් අයත් ඇල්ලුවා. ඔවුන් දෙවිටත් දැම්මා. [බාධා කිරීමක්] නල්ලූර්හි ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාතන්) තමයි, මේ සම්බන්ධව විවාදයට සහභාගි විය යුතු නැතිම තැනැත්තා. [බාධා කිරීමක්]

**වෛද්‍යාචාර්ය නාගනාතන්**
*(டொக்டர் நாகநாதன்)*
(Dr. Naganathan)

All your people.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please!

**සෝමරත්න සෙනරත් මයා.** (අම්පාරෙයි)
*(திரு. சோமரத்ன செனரத்—அம்பாறை)*
(Mr. Somaratne Senerath—Amparai)

The Member for Nallur is not in his seat.—[*Interruption*]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Please get back to your seat.—[*Interruption*]

**වෛද්‍යාචාර්ය නාගනාතන්**
*(டொக்டர் நாகநாதன்)*
(Dr. Naganathan)

The hon. Member must not speak like that. What I meant was that none from this side was found guilty of bribery but some from the other side.—[*Interruption*]

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ள)*
(Mr. T. B. Tennekoon—Dambulla)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හරක් වැටෙන් පනින්නා වගේ මේ මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරුනුත් ආසනවලට උඩින් පැනීම සුදුසුද?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please. The Sitting is suspended till 2 P.M.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින් අ. භා. 2 ට නැවත පවත්වන ලදී.**

*அதன்படி அமர்வு பி. ப. 2 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 2* P.M. *and then resumed.*

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිවා භෝජනය සඳහා විසිර යාමට කලින් මා විග්‍රහ කරමින් සිටියේ අපේ ගරු අගමැතිතුමා කළ ප්‍රකාශයක් ගැනයි. යටියන්තොට ගරු මන්ත්‍රීතුමාට පිළිතුරු වශයෙන් එතුමා කියන්න යෙදුණා, ආණ්ඩුව බලයට පැමිණ සිටින්නේ විරුද්ධ පක්ෂය කියන ඒවා කරන්න නොවේය, මැතිවරණ කාලයේදී ජනතාව ඉදිරියට ගොස් ඔවුනට එක්තරා විධියකින් කථා කිරීමෙන් ඒ ජනතාව විසින් තමන් බලයට පත් කර ඇති නිසා ජනතාවට දුන් ඒ පොරොන්දු ඉටු කිරීමටය කියා. මේ සම්බන්ධයෙන් 1965 මැතිවරණ ප්‍රකාශනයෙන් කරුණු දක්වමින් මම කිව්වා, මැතිවරණ පොරොන්දු සියයට සියයක් ම ඇත් කඩා බිඳ දමා තිබෙන බව. දිවා භෝජනයට කලින් මම විග්‍රහ කෙළේ 10 වෙනි අංකයට තිබෙන කරුණ ගැනයි. එනම් "අල්ලස් හා දූෂණ" ගැනයි. ඒ ගැන කථා කර ගෙන යද්දී නල්ලූර් ගරු මන්ත්‍රීතුමා මොකක්ද කලබලයක් කර වැටක් උඩින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

පැන එහාට මෙහාට දිවීම ගැන මම කන ගාටු වෙනවා. මෙහි කියා තිබෙන්නේ කෙසේද ?

"**අල්ලස් හා දූෂණ:** රජයේ හා පොදු අංශ හැමෙකකින්ම අල්ලස් හා දූෂණතා අතුගා දැමීමට විශෙෂ කොමිසමක් පත් කිරීමට එක්සත් ජාතික පක්ෂය පොරොන්දු වෙයි. අපේ මහජන මන්ත්‍රීවරුන් හා උත්තර මන්ත්‍රීවරුන් ඔවුන්ගේ වත්කම් හා ආදායම් මාර්ග අවුරුදු පතා හෙළි කරනු ඇත."

අපි දන්නවා, 1960 මාර්තු මාසයේ රාජාසන කථාවටත් තමුන්නාන්සේලා මේ කාරණය ඇතුළත් කර තිබෙන බව. දැන් මේ ආණ්ඩුව බලයට පත් වී අවුරුදු දෙකහ මාරකටත් වැඩියි. එහෙත් තවමත් ඒ කිසිවක් ක්‍රියාත්මක වී නැහැ. මෙය බොහෝම ලෙහෙසියි. මහජනතාවට අමුතු වෙන් කියන්න වුවමනාවක්ද නැහැ. එක පෑන් පාරින් ක්‍රියාත්මක කරන්න පුළුවන්; නමුත් කරන්නේ නැහැ.

ඊළඟට ඒ කොටසේම මෙසේ සඳහන් වෙනවා :

"......උසස් පෙළේ රජයේ සේවකයකු හෝ වේවා, දේශපාලනඥයකු **හෝ වේවා, අල්ලස් දූෂණ** චෝදනාවකට වරදකාරයෙකු වුවහොත් ඔහුට කිසිම සමාවක් හෝ ආරක්ෂාවක් එක්සත් ජාතික පක්ෂයෙන් නොලැබෙනු ඇත."

තමුන්නාන්සේට මා මතක් කර දෙන්න කැමතියි, මා කලිනුත් ඒ ගැන කිව්වා, බණ්ඩාරනායක ආණ්ඩුව අල්ලස් කොමිෂන් සභාවක් පත් කළ බව. කලින් අවුරුදු 8ක් පමණ තිස්සේ සිට එවැනි කොමිෂන් සභාවක් පත් කරන්නයයි කෝට්ටෙ හිටපු මන්ත්‍රීතුමා මේ සභාවෙ දීත් පිටතදීත් ඇවිටිලි කළා. එහෙත් එක්සත් ජාතික පක්ෂයට ආත්ම ශක්තියක් තිබුණේ නැහැ, එවැන්නක් කිරීමට. අපි නිර්භයව ඒක කළා. පරීක්ෂණ පැවැත්තුවා. චෝදනා ලැබූ අය ගැන විභාග කළා. වැරදිකරුවන්ට දඬුවම් දුන්නා. දැන් ආන්දෝලනයක් ඇති කර තිබෙනවා, දැනට විරුද්ධ පක්ෂයේ සිටින අප ඒ කාලයේදී නොයෙක් දූෂණ ක්‍රියා කළාය කියා. හොඳයි, දැන් අප ඉන්නේ විත්ති කූඩුවේ. ආණ්ඩුව වශයෙන් තමුන්නාන්සේලා ඉන්නේ නඩුකාර ආසනවල. දැන නඩුව අසන්න පුළුවන්. මහජනයා සාක්ෂියට ඉන්නවා. නියෝජ්‍ය කථානායකතුමනි, ඔවාට අප බය නැහැ. කොමිෂන් සභා කීපයකටම අප මුහුණ පා තිබෙනවා. අප ඒවාට බය නැහැ.

එම නිසා මා ඉල්ලා සිටිනවා, තමුන්නාන්සේලාගේ ඒ පොරොන්දු ඉටු කරන්නය කියා. තමුන්නාන්සේලා අප කවුරුත් දන්නවා මේ සභා ගර්භයේදීම නොයෙකුත් චෝදනා ඉදිරිපත් වී තිබෙන බව. මැණික් හොරකමක් ගැන චෝදනාවක් ඉදිරිපත් වුණා. දෙහිඕවිට ගරු මන්ත්‍රීතුමා කීප වතාවක්ම කෑ කෝ ගසා කිව්වා. ඒ ගැන තවමත් කිසිම පියවරක් ගෙන නැහැ. පාත්‍ර හොරකමක් ගැන, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ සංස්ථාවල බල තල දරන පිරිස් ගැන චෝදනා ඉදිරිපත් වුණා. තවමත් ඒ ගැන කිසිම හෝඩුවාවක් නැහැ. හොර චෙක් පතක් ගැන සතොසේ කොමිෂන් සභා වාර්තාවෙන් එළි වුණා. එනම් අත්සනක් නොකළ චෙක්පත් වගයක් දී තේ කොන්ත්‍රාත්තුවක් කළාය කියා. ඒ නැන සතොසසේ කොමිෂන් සභා වාර්තාවෙ තිබෙනවා. ඒ ගැන අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා එදා කරුණු කී වෙලාවෙ අගමැතිතුමා පොරොන්දු වුණා යමක් කරන්න. එහෙත් මොකක්ද සිද්ධ වුණේ ? ඒ ජාවාරම නිසාමයි, සතොසේ තේ කොන්ත්‍රාත්තුව නිසාමයි, ඒ චෝදනාව ලැබුවේ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*

(The Hon. J. R. Jayewardene)

ඒක බොරු චෝදනාවක්.

**ඉලංගරත්න මයා.**

*(திரு. இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

සතොසේ කොමිෂන් සභා වාර්තාවෙ සඳහන් කර තිබෙනවා, ආර්. පී. ද සිල්වා නොහොත් ලංකා ගමනාගමන මණ්ඩලයෙ සභාපතිවරයා යම්කිසි ජාවාරමක් කරද්දී අත්සන් නොකළ චෙක් පත් මගින් එක් තරඟ ප්‍රෝඩාවකට සම්බන්ධ වුණාය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

සාක්ෂි ගැන තීරණයක් නැහැ මණ්ඩල යෙන් ; පළමුවන වාතීාවේ ඒ ගැන තීරණ යක් නැහැ ; තීරණයක් ලැබුනාම ඒ ගැන ක්‍රියා කරනවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඒ ගැන ක්‍රියා කරන බව දැනගන්න ලැබී මත් සන්තෝෂයට කරුණක්. ඒ අතරතුර මා පෙන්වන්න අදහස් කරනව "ඇත්ත" පත්‍රයේ පළ වී ඇති ප්‍රකාශයක් ගැන. "ඇත්ත" පත්‍රයෙ පළ වන හැම දෙයක්ම බොරුයයි ආණ්ඩුවට කියන්න පුළුවන් කමක් නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

නම "ඇත්ත" වුණත් තිබෙන තරමක් තිබෙන්නෙ බොරු !

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

"සතොසේ කොන්ත්‍රාත්තුව පස්ස දොරෙන් ආර්. වී. ටම."

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඒක බොරුවක්.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඒක බොරුවක් යයි කියනවා නම් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැම තියි. එහි කම්කරුවන් විසින්ම සංවිධානය කළ සමුපකාර සමිතියක් තිබෙනව. ඒ උද විය තමයි, මේවා පටවන්නෙ බාන්නෙ. තමුන්නාන්සෙ පිටිපස වාඩි වී සිටින කෘෂි කර්ම උප ඇමතිතුමා ඔළුව වනනවා. එතුමා, සමුපකාර සමිති ගැන බොහොම කාලයක සිට උනන්දුවක් දැක්වූ කෙනෙක්. එම නිසා, මෙම කොන්ත්‍රාත් තුව දීම අවලංගු කර, කොන්ත්‍රාත්තුව කලින් භාරගෙන කටයුතු කළ සමිතියට දෙන්නටය කියන ඉල්ලීම අනුව ක්‍රියා කරන මෙන් මා ඉල්ලා සිටිනවා. මෙම සමිතියට අපේ කිසිම අන්දමක සම්බන්ධ කමක් නැහැ. ඒ අය අපේ පාක්ෂිකයෝද නොවෙයි. කෙසේ වුණත් එම ඉල්ලීම ඉටු කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ටෙන්ඩර් කැඳවා තිබෙනවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ටෙන්ඩර් කැඳවීම බොහොම හොඳයි. මෙහිදී මතක් කළ යුතු වැදගත් කාරණ යක් තිබෙනවා. දැනට ප්‍රතිපත්තියක් තිබෙනවා—ඒ ගැන මතක් කරන එක හොඳයයි මම කල්පනා කරනවා—එනම්, කම්කරු සංවිධාන තිබෙන විට ටෙන්ඩර් කැඳවන්නෙ එම සංවිධාන අතරින් පමණයි. අන්න ඒ කාරණය ගැනත් තමුන්නාන්සේගේ අවධානය යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

ඒ සමගම මතක ඇති, මැතිවරණයෙදි අල්ලස් දීම ගැනත් ලොකු කලබැගෑනි යක් තිබුණා. සාරි හොරකම් ගැන නො යෙකුත් විධියෙ ආන්දෝලනයක් තිබුණා. පූජකයන් ඇවිත් සමහර ලොකු ඇමතිවරුන් සමග එකට කා බී මැණික් ගල් වංචාවක් කරගෙන ගිය බවටත් චෝදනා තිබුණා. තවත් වංචාවක් සිදු වී තිබෙනව, සමහර විට ඇමතිතුමා දන් නෙත් නැතුව ඇති, ජපන් තානාපති කාර් යාලයෙ එක්තරා නිලධාරියෙක් තේ පැකැට්ටුවල මාර්ගයෙන් මැණික් ගල් ගෙන ගොස් තිබෙනවා. ඒ අන්දමට සඟවා ගෙන යාමෙදි අසු වී තිබෙනවා. මෙ වැනි දේවල් සිදු වෙනවා නම් තමුන් නාන්සෙලාගෙ බලය යොදා එවැනි සිදුවීම් වැළැක්වීමට කටයුතු කර, පක්ෂයෙ ගරුත් වය ආරක්ෂා කර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

මේ අවස්ථාවෙහි ගරු අගමැතිතුමා සභාවෙ නොසිටීම ගැන මම කනගාටු වෙනව; එතුමා රාජාසන කථාවෙහිදි එක්තරා ප්‍රකාශයක් කරන්න යෙදුණා. ඒ ප්‍රකාශය බොරු බව හඟිස්සීම පිණිස මා නැගී සිටි අවස්ථාවෙදි මට ඊට ඉඩ දුන්නෙ නැහැ, නීතියට ගරු කර මට වාඩි වෙන්න සිඩ වුණා. එතුමා කියන්න යෙදුණ, මම ඇමති වශයෙන් සිටි කාලයේදී—

"His criterion for choosing people for jobs was—first, loyalty to the Prime Minister; second, loyalty to him; and third, loyalty to the Government."—[OFFICIAL REPORT, 19th July, 1967; Vol. 72, c. 1008.]

එහෙම ප්‍රකාශයක් මා කිසි කලෙක කර නැහැ. මගේ ප්‍රකාශය ඒක නොවෙයි. මගේ ප්‍රකාශයත්, මා ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙළත්, කවදා හෝ නැවතත් බලයට ආවොත් ක්‍රියාත්මක කරන දෙය මෙන්න මේකයි:

සංයුක්ත මණ්ඩලවල අධ්‍යක්ෂවරුන් පත් කිරීම ගැන මගේ ප්‍රතිපත්තිය: (1) අගමැතිතුමාට පක්ෂපාත කම. (2) ඇමතිවරයාට පක්ෂපාතකම. (3) රජයෙ ප්‍රතිපත්තිය පිළිගැනීම. (4) ආයතනයට පක්ෂපාත කම.

ඔය පක්ෂපාතකම් හතර අනුවයි අප නැවතත් බලයට ආවොත් අප ක්‍රියා කරන්නෙ. මා හිතන අන්දමට වර්තමාන ආණ්ඩුවත් එය ක්‍රියාත්මක කරනවා, අපට වඩා හොඳ ලස්සනට. එහෙත් ඔය කාරණා හතරට, තවත් සුදුසුකම් දෙකකුත් එකතු කර තිබෙනවා. එනම්, ඡන්දයෙන් පරාජය වීම. අනික් සුදුසුකම කියන්න මා ටිකක් මැළියි—ඒක සුදුසුකමක් හැටියට ගණන් ගන්නෙ නැහැ—ඒ සුදුසුකම දූෂණකම්වලින් චරිතය අපවිත්‍ර වීමයි. ඒ විධියේ කරුණු තුන-හතරක් සිදුවෙලා තිබෙන නිසයි, මම කියන්නෙ. මේවා ගැන තමුන්නාන්සේගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණු එකක් දෙකක් නොව මේ විධියේ කරුණු තව රාශියක් තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ මැතිවරණ ප්‍රකාශනයේ සඳහන් තවත් කරුණක් මෙන්න:

"ගුරු වෘත්තීය හා ජාතික වෛද්‍ය වෘත්තීය: අද එම නිදහස් ජාතික අධ්‍යාපන ක්‍රමය අවුල් ජාලයකි. ගුරුවරු මාරුකිරීම හා පත් කිරීම අද දේශපාලන තුරුම්පු වශයෙන් විනා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ හා ඒ ඒ ප්‍රදේශයේ වුවමනා එපාකම් අනුව සිදු නොවේ."

අධ්‍යාපන ඇමතිතුමා අසනීපයෙන් සිටීම ගැන අපි බොහොම කනගාටු වෙනවා. අද කොයිතරම් දුරට මේ පොරොන්දුව නරක අන්දමට, අසතුටු දයක අන්දමට අනික් පැත්තට හරවා ගෙන ක්‍රියා කරනවාද යන්න ගැන තමුන්නාන්සේගේ අවධානය යොමු කරවනවා. අද ගුරුවරුන් විතර බැටකෑ කොටසක් තවත් නැති තරම්. විශේෂයෙන්ම ගුරුවරුන් යම්කිසි අන්දමකින් මැතිවරණ කටයුතුවල යෙදුණා නම්, ඒ යෙදුණේ මොන පක්ෂයක් බලයට පත් වුණත් තමන්ට දේශපාලන නිදහස ලැබේය යන විශ්වාසය නිසයි. අපේ පක්ෂයත්, තමුන්නාන්සේලාගේ පක්ෂයත් හැම එකක්ම කීව්වෙ රජයේ සේවකයින්ට දේශපාලන අයිතිවාසිකම් දෙනවා කියායි. ඒ කෙරෙහි විශ්වාසය තබාගෙන කොයි රජය ආවත් කමක් නැහැ යයි හිතාගෙන බලය අතට ගෙන රජයේ සේවකයින් ක්‍රියා කළා. දැන් මොකක්ද වෙලා තිබෙන්නෙ? රජය පැත්තට වැඩ කළ ගුරුවරුන්ට සම්මාන ලැබුණා. සමහර අයට උසස් තැන් දී තිබෙනවා. මේ විධියටයි, දැන් වැඩ කරගෙන යන්නෙ. තවදුරටත් මෙහෙම කියා තිබෙනව:

"සිංහල හා ඉංග්‍රීසි ගුරුවරුන් අතර ඇති පරතරය නැති කර සියල්ලන්ටම එක හා සමාන අයිතිවාසිකම් සහ සම්පූර්ණ විශ්‍රාම වැටුප් දිය යුතු බව අපගේ පිළිගැනීමයි. ගුරු වෘත්තිය වැදගත් බව විශ්වාස කරන අපි එයට වෛද්‍ය හා නීති වෘත්තිවලට තරම් ගරු කළ යුතු බව කියමු."

කියනුම කවරේද? කොයිතරම් දුරට මේවා ක්‍රියාත්මක කර තිබෙනවාද යන්න ගැන තීරණයකට බැසීම ඔබතුමාට භාරයි. තවත් පොරොන්දුවක් මෙන්න:

"ජාතික වෙළඳාම සහ කර්මාන්ත හිමියා: රටේ දියුණුවට අගනා මෙහෙයක් ඉටු කළ මේ ස්වජාතික ව්‍යාපාරිකයින්ට ජාතියේ ආර්ථික දියුණුවට තවදුරටත් පිහිට විය හැකි පරිදි ඔවුන්ට රජයේ සහයෝගය දිය යුතුය."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොතෙක් දුරට කරල තිබෙනවද?

"**ජීවන වියදම :** ඔබේ ආහාරය සහ රෙදිපිළි සඳහා අද කරම් ගිනි ගණන් මින් පෙර කවදාවත් ගෙවා නැත. දහඩිය මහන්සියෙන් ඔබ උපයන ධනය මොහොතකින් අලු වෙයි. ඔබේ රුපියලේ වටිනා කම දැන් අඩු වී ඇත. ඔබ හරි හම්බ කරන මුදලින් මීට වඩා සැපවත් ජීවිතයක් ගත කිරීමට ඔබට අයිතියක් තිබේ."

ඒ කරුණු තව ටිකකින් මම ඉලක්කම් වලින් පෙන්වා දෙන්නම්.

"එක්සත් ජාතික පක්ෂය බලයට පත් කළ හොත් මාර්ග දෙකකින් අපි ඔබ ජීවන බරින් නිදහස් කරන්නෙමු.

(1) ක්ෂණික සහන ලබා දෙන කෙටි කාලීන වැඩ පිළිවෙලක් හා

(2) ස්ථිර සහනය සලසන දීර්ඝ කාලීන වැඩ පිළිවෙලක් අනුව අගහිඟකමින් තොර, ලාබෙට කෑම, බීම, ඇඳුම් පැළඳුම් සුලබ සෞභාග්‍යමත් සමාජයක් එක්සත් ජාතික පක්ෂය ඔබට පොරොන්දු වෙයි."

මම ඉලක්කම්වලින් පෙන්වා දෙන්නම් කොයිතරම් දුරට ජීවන වියදම් බරින් නිදහස් කර තිබෙනවද කියා.

"**ජනසතු ව්‍යාපාර :** ඒ ඒ ජන සතු මණ්ඩල පාලනයට යාලු මිත්‍රයින් හා දේශපාලන හැඳින් නොව ඒ ඒ තනතුරුවලට සුදුසු දක්ෂයින් පත් කර ඒවා නියම ජනතා සේවාවන් බවට පත් කරන්නෙමු."

අසව්, අසව්, කොයිතරම් දුරට මේක කර තිබෙනවාදැයි අපි නොකිව්වට මිනිසුන් දන්නවා.

"**රාජ්‍ය භාෂාව :** රටේ රාජ්‍ය භාෂාව වශයෙන් සිංහල භාෂාව නොවෙනස්ව තබාගෙන ජාතිය එක මුතු කිරීම සඳහා අප පක්ෂය විසින් වට මේස සාකච්ඡාවක් කැඳවනු ඇත."

[බාධාකිරීමක්] අපේ පොළොන්නරුවේ ගරු මන්ත්‍රීතුමා (විජේසිංහ මයා.) කියන්නා වගේ වටමේස සාකච්ඡාවක් නොව ඇඳ යට සාකච්ඡාවක් කරල රහස් ගිවිසුම කින් සුළු ජාතිකයන්ට මහ ජාතිය පාවා දුන්නා. තවදුරටත් මෙහෙම තිබෙනවා :

"නිදහස් ජාතියක් වශයෙන් ආඩම්බරයෙන් යුතුව බලගතු ජාතීන්ට පවා මුහුණ දීමට හැකි වාතාවරණයක් අපි සකස් කරමු.

**සර්ව සාධාරණ පාලනයක් :** වෙනත් දේශපාලන පක්ෂවලට අයත් වූවත් ගෙන් වෙනත් දේශපාලන මත දරන්නන් ගෙන් පලිගැනීම පරාජිත හවුල් ආණ්ඩුවේ ලොකුම හපන්කම විය."

"අපි ඒ දූෂණය සිය ගුණයෙකින් වැඩි කොට කරන්නෙමු" යනුවෙන් මෙතැන සඳහන් කරන්නටයි තමුන්නාන්සේලාට තිබුණේ. එසේ කළා නම් අද අපට මෙහි විවේචනය කරනන්ට දෙයක් ඇති වන්නේ නැහැ. තවදුරටත් මෙසේ කියා තිබෙනවා :

"මහජනයාට අවශ්‍ය ආහාර පාන, රෙදිපිළි සැපයීම පසෙක තබා හවුල් ආණ්ඩුවේ මැති ඇමති වරු දේශපාලන විරුද්ධකාරයින් සොය සොයා පළි ගත්හ. මෙවැනි පළිගැනීම් නිසා රජය විසින් ජනතා සිත් දූෂ්‍ය කරන ලදී."

එහෙත් තමුන්නාන්සේලා අපට සැලකූ හැටි කොහොමද? සී. අයි. ඩී. කාරයින් එනවාය, ආණ්ඩුව පෙරළන්නට සමහරුන් උත්සාහ කරනවාය, ප්‍රජාතන්ත්‍රවාදය නසන්නට හදනවාය කියමින් සමහරුන් වෙවුලමින් සිටියා. එහෙත්, එවැනි දේ කරන්නට සූදානම් වුණු අය පෙන්වා දෙන්නට මට පුළුවනි. මා, නම් කියන්නේ නැහැ. අද ඔය ඉස්සරහ පුටුවල සිටින සමහර ඇමතිවරුනට විරුද්ධව සටන් කරලයි, අප ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගත්තේ.

"ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, මාක්ස්වාදී සම සමාජ—කොමියුනිස්ට් පක්ෂ හවුල් වී රට නැති කළ දා පටන් ඔබ බලාපොරොත්තු වූයේ එක්සත් ජාතික පක්ෂයේ ධාර්මික පාලනයකි."

ඒක නම් ලැබුණා. දැන් සියල්ල සම්පූර්ණයි. ඒ නිසා තමයි, මල්වත්තේ මහානායක හාමුදුරුවොත් තමුන්නාන්සේලාට විරුද්ධ වී සිටින්නේ. දැන් නම් ආයෙමත් ටිකක් හොඳ වගේ පෙනෙනවා.

1965-66 අය වැය කථාව පිළිබඳ විවාදයේදී යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) 1965 අගෝස්තු මාසයේ 18 වැනි දා මෙවැනි ප්‍රකාශයක් කළා :

"This Government came into existence as a result of a fraud. It came into existence with the support of the Federal Party, Mr. Thondaman's Congress and so on, without any reference to the country, without—up to date—any reference to this House, and now you are continuing it. This Budget is only an excuse to find more money to put into the pockets of the capitalist classes in

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

this country, and to play second fiddle to the United States of America."—[OFFICIAL REPORT, 18th August 1965 ; Vol. 61, c. 296.]

මෙය කොයිතරම් දුරට ඇත්තද යන බව දැන් තමුන්නාන්සේලාම දන්නවා.

ගරු මුදල් ඇමතිතුමාගේ 1965/66 අය වැය කථාවේ 27 වැනි පිටුවෙහි මෙසේ සඳහන් වී තිබෙනවා :

"ආර්ථික අංශයෙහිලා අප අසමර්ථ වුවහොත්, අන් කිසි අංශයකින් අපට සාමාර්ථයක් ලැබීමට ඉඩකඩ ඇති බවක් මට නම් පෙනෙන්නේ නැ."

සම්පූර්ණ ඇත්ත.

"අවුරුද්දකට සියයට 3 ක් හෝ 4 ක් හෝ වන වර්ධනය පිළිබඳ පරිමාණයකින් අපට සතුටු විය නො හැකියි. අපේ ආර්ථික තත්ත්වයෙහි කැපී පෙනෙන වෙනසක් දකින්නට නම්, වර්ෂයකට සියයට හයක් පමණ හෝ වන ආර්ථික වර්ධනයේ පරිමාණයත් හැකි තරම් ඉක්මණින් අප ළඟා කරගත යුතුයි. වඩාත් ක්‍රියාශීලී ලෙස සංවර්ධනය වන ඇතැම් රටවල්, සැළකිය යුතු විශාල වර්ධන පරිමාණයන් දැනටමත් ලබාගෙන තිබෙනවා. එහෙයින්, අපත් ඒ සමාන ඉලක්කයන් දිනා ගැනීමට අපේ උත්සාහයන් මෙහෙය විය යුතුයි. බොහෝ රටවලට ලැබී නැති පහසුකම් හා සම්පත් අපට නොයෙක් ආකාරයෙන් තිබෙන නිසා, ආර්ථික ප්‍රගතිය පිළිබඳව මේ රට අන් රටවලට පසුබට වීමට කිසිම හේතුවක් නැහැ."

තමුන්නාන්සේලා මෙහෙම කිව්වත්, බලය ගත් හැටියෙම සිදු වුණේ කුමක්ද? අද සිදු වී තිබෙන්නේ කුමක්ද යන්න විග්‍රහ කිරීමට අමුතු විස්තර ඉදිරිපත් කරන්නට වුවමනාවක් නැ. ගරු මුදල් ඇමතිතුමාගේ මේ අය වැය කථාවම ඒ සඳහා ප්‍රමාණවත් වෙනවා. සියයට 4 ක්ව තිබුණු ජාතික දළ නිෂ්පාදිතය ලෝකයේ අනෙක් රටවල තත්ත්වයට ගෙන ඒමට සියයට 6 දක්වාවත් වැඩි කරන්නට ඕනෑයයි කී මේ රජය දැන් එය වැඩි කර තිබෙන අන්දම අපි බලමු.

1960 දී පැවැති ජාතික දළ නිෂ්පාදිතය 4.8 යි. 1961 දී එය 4.7 දක්වා පහළ ගියා. 1962 දී 4.1 යි. 1963 දී 3.9 යි. 1964 දී 5.8 යි. මේ ප්‍රමාණය මදියයි කී මේ රජය බලය ගත්තාට පසුව, 1965 දී ජාතික දළ නිෂ්පාදිතය 2.9 දක්වා පහළ බැස තිබෙනවා. 1966 දී 1.3 යි. ඒ සාමාන්‍ය දළ ජාතික නිෂ්පාදිතයයි. ඊළඟට, දළ දේශීය නිෂ්පාදිතය, ඒ කියන්නෙ මේ රටේ බඩු නිෂ්පාදනය ගැන බලමු. එය අප සිටින කාලෙ, 1962 වර්ෂයේදී 4.2 යි. 1963 වර්ෂයේදී 4 යි. 1964 වර්ෂයේදී 5.6 යි. ඒක මදිය කී තමුන්නාන්සේලා බලයට පත් වුණ 1965 වර්ෂයේදී 2.7 යි. 1966 වර්ෂයේදී 1.6 යි. මහා බැංකුවේ වාර්තාවලයි මේ ඉලක්කම් තිබෙන්නෙ. ඊළඟට ඒක ජන දළ ජාතික නිෂ්පාදිතය ගැන බලමු.

"පවත්නා මිළ අනුව සියයට 1.0 කින්ද මූර්ත වශයෙන් සියයට 0.7 කින්ද අඩුවී ඇත."

තමුන්නාන්සේලාගේ වාර්තා වලින්ම එය පිළිඅරගෙන තිබෙනවා. අයවැය ලේඛනයක් මණින්නට පුළුවන් වන්නේ මේ සංඛ්‍යා නැග තිබෙන හැටිත් බැස තිබෙන හැටිත් ජනතාවට ලැබී තිබෙන ප්‍රයෝජනත් සංසන්දනය කිරීමෙන්ය කියා ගරු රාජ්‍ය ඇමතිතුමා මුලින්ම කියන්නට යෙදුණා. මේ සංඛ්‍යා ලේඛන ටිකක් මා ළඟ එකතු කර තිබෙනවා. තමුන්නාන්සේලාගේ වාර්තා වලින්මයි මේ සංඛ්‍යා ලේඛන පිළියෙළ කර තිබෙන්නෙ. තමුන්නාන්සේලාගේ ධනපති කණ්ඩායම්වලට දී තිබෙන සහනයත් අනිත් කණ්ඩායම් වලට දී තිබෙන සහනයත් මම වෙන් කළා. කොහොමද ඒ සංඛ්‍යා තිබෙන්නෙ? තමුන්නාන්සේලා 1965/66 වර්ෂයේදී පොහොසත් උදවියට අයබදු සහන වශයෙන් ලක්ෂ 509.9 ක් දී තිබෙනවා. බදු බර කිසිවක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මුදල් ඇමති වශයෙන් කටයුතු කළ කාලයේදී ලක්ෂ 90 ක බදු සහනයක් දී සුළු ආදායම් බදු ගෙවන 25,000 ටත් 28,000 ටත් අතර සංඛ්‍යාවක් සම්පූර්ණයෙන්ම නිදහස් කළා. නමුත් තමුන්නාන්සේලා මොකක්ද කළේ? අයබදු සහන වශයෙන් ලොකු අයට ලක්ෂ 509.9 ක් දුන්නා. බදු බරින් ඒ අය නිදහස් කළා. 1966/67 වර්ෂයේදී මුදල් බදු සහන ලක්ෂ එකහමාරක් දී තිබෙනවා. 1967/68 දී තමුන්නාන්සේලා ලොකු උදවියට ශතයක්වත් බර පැටෙව්වේ නැහැ.

ඊළඟට එකතුව බලමු. පසුගිය අවුරුදු තුන ඇතුළත තමුන්නාන්සේලා දුප්පත් ජනතාවගෙන් උදුරා ගෙන තිබෙන ගණන ලක්ෂ 511.4 යි. ඒ ලක්ෂ 511.4 ට [illegible] කෝටි 5½ ක්—තමුන්නාන්සේලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තෙල් කොම්පැනිකාරයින්ට වන්දි වශයෙන් දුන් කෝටි 5½ ත්—එකතු කරන්නට ඕනෑ. ඒ අනුව පසුගිය අවුරුදු තුන ඇතුළත සාමාන්‍ය ජනතාවගේ භාණ්ඩාගාරයෙන් ලොකු ධනපතියන්ට ලක්ෂ 1,061.4 ක් දී තිබෙනවා. පුංචි අයට කොපමණ දුන්නාද? 1965/66 වර්ෂයේදී තීරු බදු සහන ලක්ෂ 184 ක් දී තිබෙනවා. ලොකු අයටත් එය බලපාන බව ඇත්තයි. ඊළඟට 1966/67 වර්ෂයේදී කිසිම සහනයක් දී නැහැ. 1965/66 වර්ෂයේදී ලක්ෂ 184 ක තීරු බදු සහනයක් දී තීරු බදු බර ලක්ෂ 250 ක් දැම්මා. ඒ විස්තර සියල්ලක්ම මා ළඟ තිබෙනවා. වුවමනා නම් කියවන්නම්. 1966/67 වර්ෂයේදී කිසිම සහනයක් දී නැහැ. හාල් කැපීමෙන් දුප්පත් මිනිසුන්ට පැටවූ බර ලක්ෂ 1,400 යි. තමුන්නාන්සේලාගේ ඉලක්කම් අනුව ඒ ගණන ලක්ෂ 1,500 යි. මහා බැංකුවේ ඉලක්කම් අනුව ලක්ෂ 1,400 යි. ඊළඟට තීරු බදු බර ලක්ෂ 1,000 ක් පැටෙව්වා. 1967/68 වැටුප් සහන වශයෙන් ආණ්ඩුවේ සේවකයන්ට ලක්ෂ 600 ක් දී තිබෙනවා. එසේ කර මුළු ජනතාවටම තීරු බදු බර ලක්ෂ 950 ක් පැටෙව්වා. එතකොට කොහොමද අය වැය? සාමාන්‍ය ජනතාවට දුන් සහනය ලක්ෂ 784 යි. පැටවූ බර ලක්ෂ 3,600 යි. ලොකු අයට තමුන්නාන්සේලා කිසිම බදු බරක් පැටෙව්වෙ නැහැ. ඒ අයට බදු සහන දුන්නා ලක්ෂ 511.4 ක්. ඒ අනුව දුප්පත් අයට ලැබුණු ලාභය රුපියල් ලක්ෂ 784 යි, පාඩුව 3600 යි. මේ අනුව බලන විට ඔවුන්ගේ ශුද්ධ පාඩුව රුපියල් ලක්ෂ 2816 යි. දුප්පත් අයට රුපියල් ලක්ෂ 2816 ක අමතර බරක් පටවා, ධනපති පන්තියට ලක්ෂ 1011 ක සහනයක් දුන්නා. දැන් කියනවා, "හාල් ගෙනෙන්නටවත්, වෙන මොනවා ගෙනෙන්නටවත් සල්ලි නැත" කියා.

1965 බලයට ආ හැටියේම වාගේ ගරු අගමැතිතුමා හොඳ කථාවක් කළා:

"... a three-pronged attack is necessary to pull us out of this economic situation. What is the three-pronged attack? Stepping up exports, substituting for imports and external aid."

එහි තේරුම මේ රට ආර්ථික පරිහානියෙන් බේරා ගන්නට නම් කඳවුරු තුනකට පහර දිය-යුතු බවයි. ඒ තුන නම් අපනයනය වැඩි කිරීම, ආනයන ආදේශයන් ඇති කිරීම හා විදේශාධාරයි. 1966 මහ බැංකු වාර්තාවේ 11 වන පිටුවේ අපේ අපනයනයන් ගැන සඳහන් කර තිබෙන්නේ කෙසේද? අයවැය කථාවේත් එය සඳහන් වී තිබෙනවා. මේවායින් පෙනෙනවා, තමුන්නාන්සේලාගේ බලාපොරොත්තු සම්පූර්ණයෙන්ම කඩාකප්පල් වී තිබෙන බව.

මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මයා.) 1964 දී කර්මාන්ත ඇමති වශයෙන් මෙසේ සඳහන් කර තිබෙනවා:

"දළ කාර්මික නිෂ්පාදනය 1960 දී ලක්ෂ 3130 ක් වූ අතර 1963 දී ලක්ෂ 4130 කට නැංගා. මෙයින් ලක්ෂ 3320 ක්ම පෞද්ගලික ව්‍යාපාරිකයන් මාර්ගයෙන් ඇති වුණු බව කියන්නට කැමතියි."

එහෙත් මේ වර්තමාන රජය මේ වන තෙක් කිසිම කර්මාන්තයක් පටන්ගෙන නැහැ. අප පටන් ගත් කර්මාන්ත දිගටම කරගෙන ඒමයි, මේ අය කරන්නේ. එය බොහොම හොඳයි. අප එයට විරුද්ධ නැහැ. එහෙත් එයින් පමණක් අර ප්‍රශ්න විසඳන්නට තමුන්නාන්සේලාට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

අපේ ආණ්ඩුව බලයට පත් වූවාට පසුව කෙරුණු කාර්මික නිෂ්පාදනය පිළිබඳ වාර්තාව කෙටියෙන් කියන්නට කැමතියි. පිටරටින් මෙරටට බඩු ගෙන්වීම සඳහා අපේ රට දැරූ වියදම ක්‍රම ක්‍රමයෙන් අඩු වෙමින් ගිය හැටි එයින් හොඳට ඔප්පු කරන්නට පුළුවන්. Gross Domestic Capital Formation—දේශීය නිෂ්පාදනයට වුවමනා කොටස පිටරටින් ගෙන්වීම අඩු කරගෙන ගොස්, නිෂ්පාදනය වැඩි කළ හැටි මේ ඉලක්කම්වලින් ඇක්වෙනවා: කර්මාන්ත නිෂ්පාදනය සඳහා 1959 දී පිටරටින් ගෙන්වූ ප්‍රමාණය සියයට 33.01 යි. 1960 දී 33.03යි. 1961 දී 29.8යි. 1962 දී 28.7යි. 1963 දී 26.6යි. 1964 දී 26.6යි. 1965 දී 21 යි. 1966 දී ගෙන්වූ ප්‍රමාණය 27.3 දක්වා වැඩි කර තිබෙනවා. මේ ආණ්ඩුව බලයට ආ පසුව වැඩියෙන් ගෙන්වා තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

මේ අවස්ථාවේ කර්මාන්ත ඇමතිතුමා මේ ගරු සභාවේ සිටීම ගැන මා සන්තෝෂ වෙනවා. 1966 මහ බැංකු වාර්තාවේ 47 වන පිටුවේ, කාර්මික නිෂ්පාදනයේ වටිනාකම මෙසේ දක්වා තිබෙනවා: 1962 කාර්මික නිෂ්පාදනය දස ලක්ෂ 388.0 යි. 1963 කාර්මික නිෂ්පාදනය දස ලක්ෂ 432.4 යි. 1964 කාර්මික නිෂ්පාදනය දස ලක්ෂ 537.5 යි. 1965 කාර්මික නිෂ්පාදනය දස ලක්ෂ 847.0 යි 1966 කාර්මික නිෂ්පාදනය දස ලක්ෂ 850.3 යි. නොයෙකුත් අඩුපාඩු කම් තිබියදීත් අපේ කාර්මික නිෂ්පාදනය ට එතරම් අවහිරයක් නොවී මෙසේ වැඩි වීමට ආධාර කිරීම ගැන අප බොහොම සන්තෝෂ වෙනවා. ඒ වුණත් සුළු කර්මාන්තකාරයන්ගේ විශාල අදෝනාවක් තිබෙනවා. කර්මාන්ත ඇමතිතුමා පිළිතුරු දී තිබෙනු මා දක්කා. එහෙත් ක්‍රියාව සිදු වන්නේ පිළිතුරේ හැටියට නොවෙයි. ඇස්බැස්ටෝස් කර්මාන්ත කාරයනට නව නවත් විනිමය වෙන් කර, උළු කර්මාන්තකාරයනට අවහිර වැඩි කර තිබෙන බව අපට ලැබී ඇති ආරංචියයි.

කෙසේ වෙතත් අපේ ගරු කර්මාන්ත ඇමතිතුමාගේ ගිනිපෙට්ටි කර්මාන්තය ගැන නම් සතුටු වන්නට පුළුවන්කමක් නැහැ. එදා අප ඔය පැත්තේ සිටියදී ගිනිපෙට්ටි නිෂ්පාදනය ගැන අපට කොතරම් දොස් කීවාද? එහෙත් අද තත්ත්වය එදාටත් වඩා පිරිහිලා. 1964 දී සාදන ලද ගිනිපෙට්ටිවල වටිනාකම රුපියල් ලක්ෂ 103 යි; 1965 දී රුපියල් ලක්‍ෂ 123 යි. එහෙත් 1966 දී රුපියල් ලක්‍ෂ 87 දක්වා පහත බැස තිබෙනවා. මේ වෙලා තිබෙන්නේ මොකක්ද? ගිනිපෙට්ටි හදා ගන්නටවත් බැරි කර්මාන්ත අංශයක් නේද මේ?

කෘෂිකාර්මික නිෂ්පාදනය ගැන මෙම ආණ්ඩුව පුරසාරම් දෙඩනවා. හොඳයි, අපි ඒ ගැනත් ටිකක් කල්පනා කර බලමු. මුලින්ම තේ නිෂ්පාදනය ගනිමු. 1964 දී නිපදවූ තේ ප්‍රමාණය රාත්තල් දශ ලක්‍ෂ 482 යි; 1965 දී රාත්තල් දශ ලක්ෂ 503 යි; 1966 දී රාත්තල් දශ ලක්ෂ 490 යි.

ඊළඟට වී නිෂ්පාදනය සිදු වී තිබෙන්නේ කෙසේදැයි බලමු. 1960 දී වී නිෂ්පාදනය බුසල් ලක්ෂ 431 යි; 1961 දී බුසල් ලක්‍ෂ 432 යි; 1962 දී බුසල් ලක්ෂ 481 යි; 1963 දී බුසල් ලක්ෂ 492 යි; 1964 දී බුසල් ලක්ෂ 505 යි; 1965 දී බුසල් ලක්‍ෂ 363 යි; 1966 දී බුසල් ලක්ෂ 461 යි. ඉතින් මේ වෙලා තිබෙන්නේ මොකක්ද? රට පුරා ගොස් වී නිෂ්පාදනය සතුටුදායක බව කියනත් මේ වාර්තා අනුව නම් අපට එවැන්නක් පෙනෙන්නේ නැහැ. මේ අවුරුද්දේ මහ කන්නයේදී විශාල අස්වැන්නක් ලැබී ඇති බව ගරු අගමැතිතුමා කියනවා. ඒක ඇත්ත නම් අපත් ඒ ගැන සතුටු වෙනවා.

පසුගිය වර්ෂයේදී රබර් නිෂ්පාදනය වැඩි වුණත් තේ, පොල් නිෂ්පාදනය බැස්සා. තේ, පොල් නිෂ්පාදනය පහළ බැස්සේ අපනයන අවස්ථා නැති වී ගිය හෙයිනැයි කියනවා ඇති. එහෙත් තේ නිෂ්පාදනය බැස්සේ ප්‍රධාන වශයෙන්ම කුඩා වතු හිමියනට සැලකිල්ලක් නොදැක්වීම නිසයි. ඒ අය අනාථ වී සිටිනවා. කුඩා වතු හිමියනට ආධාරයක් නැති නිසා නිෂ්පාදනය වැටී තිබෙනවා.

පොල් ගැන මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමාත් (එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.) මීගමුවේ ගරු මන්ත්‍රීතුමාත් (එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.) කරුණු ඉදිරිපත් කරනවා ඇති. මීගමුව හලාවත පැත්තේ පොල් නිෂ්පාදකයන් කොතරම් අමාරුවකට මුහුණ පා ඇද්දැයි ඒ ප්‍රදේශවල ගරු මන්ත්‍රීවරුන් හොඳින් දන්නවා ඇති. 1964 දී පොල් නිෂ්පාදනය ගෙඩි දශ ලක්ෂ 3,000 යි; 1965 දී ගෙඩි දශ ලක්ෂ 2681 යි; 1966 දී ගෙඩි දශලක්ෂ 2468 යි. පොල් නිෂ්පාදනය අඩු වී තිබෙන්නේ ඉඩෝරය නිසා යයි කියනත් ඊට ප්‍රධාන හේතුව නිෂ්පාදකයනට කිසිම ධෛර්‍යයක් නොදීමයි.

සතොස කොමිසන් සභා වාර්තාව ගැන ගරු අගමැතිතුමා පසුගියදා සඳහන් කළා. සමහර වෙලාවට එතුමා බොහොම කෝපයට පත් වෙනවා. ඒ වේලාවන්හිදී එතුමා කියන දේ මොනවාද කියා එතුමා දන්නේ නැහැ. පසුගියදා දොම්පේ ගරු මන්ත්‍රීතුමාගෙන් සමාව ඉල්ලන්නට සිදු වුණෙත් ඒ නිසයි. අගමැතිතුමා මෙසේ ප්‍රකාශ කළා:

"There is an interim report of the Co-operative Wholesale Establishment Committee of Inquiry. The hon. Member will have to answer a lot when the final report is issued... I would like to tell the hon. Member for Kolonnawa that I am

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

prepared to face any inquiry into our relative integrity at any time, at any place, by anyboody."—[OFFICIAL REPORT, 19th July 1967 ; Vol. 72, c. 1018.]

ඒ වේලාවේදී මා පිළිතුරු දුන්නා, මේ විදියට :

"I have faced every commission and there has been nothing against me."—[OFFICIAL REPORT, 19th July 1967 ; Vol 72, c. 1018.]

සතොස කොමිසමේ වාර්තාවෙහි තිබෙන්නේ මොකක්ද ? තිබෙන එකම "චාජ්" එක මේකයි :

"We find that the following appointments were made as a result of pressure improperly brought to bear by Mr. T. B. Ilangaratne as Minister and as a mark of favour to the appointees :

(a) ... Roland Jayasekera ...
(b) ... T. B. Ratnayaka ...
(c) ... S. R. Munidasa ...
(d) ... V. Aluwihare ...
(e) ... Peter Silva ..."

PUBLIC LIBRARY JAFFNA

මා මේ කරුණු ගැන සාක්ෂි දුන්නා. සාක්ෂි දීමේදී මා කියා සිටියේ යථා පරිදි ක්‍රියා කිරීමට ඒ ඒ කඩදාසි යැවූ බව මිස මා කිසිම බලපෑමක් නොකළ බවයි. ඉතින් අගමැතිතුමා අර්ථ විරහිතව කෝප වී, "සී. ඩබ්ලිව්. ඊ. එකත් තිබෙනවා ; අපි දෙන්නාගෙන් කවුද හොඳ කියා බලමු" යි ප්‍රකාශ කළා. මාත් කැමතියි, ඕනෑම විභාගයකට පෙනී සිටින්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ දර්ශනයට අනුව නම් අද දවසේ මේ ආණ්ඩුවෙන් දූෂණ වැඩ රාශියක් කෙරෙන බව පෙනෙනවා. විශේෂයෙන් වෙළඳාම් කටයුතුවලදී දූෂණ කෙරෙනවා. එසේම විදේශ රටවලින් භාණ්ඩ ගෙන ඒමේ ඒජන්තකම් වැඩි වශයෙන් දී තිබෙන්නේ තමන්ගේ හිතවතුන්ට සහ නෑදෑසින්ටයි. ඒවා වැරදිය කියන එකයි, අපේ දර්ශනය. තමුන්නාන්සේලාගේ දර්ශනය ඊට වඩා වෙනස් වෙන්නට පුළුවනි. තමුන්නාන්සේලාගේ දර්ශනයේ හැටියට අපේ ජනසතු සේවා වැඩ පිළිවෙළ ඇද වෙන්නට පුළුවනි. අපේ දර්ශනයේ හැටියට යම් යම් ව්‍යාපාර සහෝදරයන් සතු කිරීම, නෑදෑයන් සතු කිරීම සහ මිත්‍රයන් සතු කිරීම අපට ඇදයි. එම නිසයි, අපි තමුන්නාන්සේලාට චෝදනා කරන්නේ. අප මෙම චෝදනා ඉදිරිපත් කරන්නේ පුද්ගලික අමනාපයකට නොවෙයි. අප කියා සිටින්නේ තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිවලට අනුව පුද්ගලයන් තර වෙනවා මිස ජාතියට සේවාවක් සිදු නොවන බවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව හුඟක් කරුණු කියන්ට පුළුවනි. නමුත් තමුන්නාන්සේගේ අණ පිළිපැදීමක් වශයෙන් මගේ කථාව මා වැඩිදුරට පවත්වන්ට කල්පනා කරන්නේ නැහැ. මට තව එක කාරණයක් මතක් කරන්ට තිබෙනවා. තමුන්නාන්සේ දන්නවා ඇති ඉරාක පත්‍රය ගැන ; බැග්ඩැඩ් පත්‍රය ගැන. මා එහි පළවූ ලිපියක් කියෙව්වා. එම ලිපිය ලියා තිබුණේ කලීඩ් ජැමිල්—Khaled Jamael—නම් මහතකු විසිනුයි. උන්නැහේ එම ලිපියෙන් ප්‍රකාශ කර තිබුණා, "මිසරය සහ ඊශ්‍රායලය පිළිබඳ අරගලයේදී ලංකාව ඊශ්‍රායලය පැත්ත ගන්නා නිසා ඒ ගොල්ලන්ගේ තේ වෙළඳාමට ලංකාව දක්වන උනන්දුව පුදුම සහිතය ; ඒ සම්බන්ධව ක්‍රියා කළ යුතුය" යනුවෙන්. ඒ ගැන එම තානාපති කාර්යාලයට පැමිණිලි කළ බවත් ඔවුන් ඒ වෙනුවෙන් සමාව ඉල්ලා සිටි බවත් අපේ අගමැතිතුමා කියා සිටියා. සමාව ඉල්ලුවා නම් මා බොහොම සන්තෝෂ වෙනවා. එහෙත් ගරු අගමැතිතුමාටත් රාජ්‍ය කටයුතු පිළිබඳ ඇමතිතුමාටත් දන්වා සිටින්ට කැමතියි, කලීඩ් ජැමීල් මහතා අද ඉරාකයේ වෙළඳ උප ඇමති බවට පත් කර සිටින බව. තමුන්නාන්සේලාට එහෙම කිව්වාට මොකද, එම ලිපියෙන් සහ වෙනත් වැඩවලින් එතුමා කොතරම් සේවයක් කර තිබෙනවාද කියතොත් අද එතුමා ඒ රටේ උප ඇමතිකමකටත් පත් කර සිටිනවා. ඒක හොඳ වැඩක්.

ඒ වගේම අපේ තේ වෙළඳාමට අවහිර වන අන්දමේ ලිපි නොයෙකුත් පත්‍රවල පළ වන බව අපි දන්නවා. අරාබියට පහර ගැසූ උප කතුවැකි එහෙම පළ වෙනවා. ඒවා මා කීප වතාවක් දැක තිබෙනවා. 'යම් කිසි වෙළඳ දූත පිරිසක් ලංකාවට පැමිණෙන අවස්ථාවක් වෙතොත් එම අවස්ථාවේදී ඉරාකයට නැතිනම් අරාබියට විරුද්ධව කතුවැකි ලිය වෙනවා. මීට මාස තුන හතරකට පෙරත් එවැනි ලිපි පළ වුණා. මා ඒවා දැන් මෙහි ගෙනැවිත් නැහැ. ඒ හැම අවස්ථාවකදීම තමුන්නාන්සේලා අර ප්‍රතිපත්තිය අනුගමනය කරනවාද කියා මා අහනවා. "අපේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

රටේ පත්‍ර ඉරාකයට නැති නම් මිසරයට විරුද්ධව ලිපි ලියා තිබෙනවාය; අපි ඒ වෙනුවෙන් කනගාටු වෙනවාය" යනුවෙන් තමුන්නාන්සේලා ඒ රටේ නසාර් වැනි ලොකු ලොක්කන්ට දන්වා හරිනවාද? අපේ ගරු කම්කරු ඇමතිතුමා ප්‍රසිද්ධියේම නසාර්ට විරුද්ධව නොයෙකුත් මත ප්‍රකාශ කළා. ඒවාගේම නසාර් මැරීමට තැත් කළාය කියන රමධාන් ලංකාවට පැමිණි විට ඔහු රාජ්‍ය අමුත්තකු විධියට සලකා සංග්‍රහ කළා. එසේම ඊශ්‍රායලයට සහයෝග යත් දක්වූවා. එවැනි ක්‍රියාවලට ගරු අග මැතිතුමා නසාර්ගෙන් සමාව ඉල්ලා සිටියාද? මෙවැනි කරුණු නිසායි, අපේ වෙළ දාම් කටයුතු එහෙම මෙතරම් පහත බැස තිබෙන්නේ.

රාජ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා මට පසුව කතා කරන්ට සිටින බව මා දන්නවා. එතුමා 1965 අගෝස්තු 18 වන දින ඉතාමත් නිහතමානී ලෙස මෙසේ කියා තිබෙනවා:

"Some day people will get tired of us, however good we may be or whatever good we may do. So there must be an Opposition to take our place."—[OFFICIAL REPORT, 18th August 1965; Vol. 61, c. 371.]

එතුමා තව දුරටත් කියා තිබුණා, දස අවුරුද්දෙන් දස අවුරුද්දට ආණ්ඩුවක් මාරු විය යුතු බව. "කවදාහරි මහජනතාවට අපි ඇති වෙනවා; කොතරම් කළත් මොනවා කළත් අපව කලකිරෙනවා; ඒ නිසා අපේ තැන ගන්න විරුද්ධ පාර්ශ්වයක් වුව මනායි" යනුවෙන් එතුමා කියා තිබුණා. රාජ්‍ය කටයුතු පිළිබඳ ඇමතිතුමනි, අපි ඊට කැමතියි. දස අවුරුද්දක් ඉන්නේ නැතුව කරුණාකර අස් වී යන ලෙස ජාතියේ නාමයෙන් තමුන්නාන්සේලාගෙන් ඉල්ලමින් මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 2.40

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) අපේ මහ මැතිවරණ ප්‍රකාශනය කියවද්දී, එතුමා එය පළමුවන වතාවට දැකපු දෙයක් හැටියට විකක් සැකෙයෙන් කියවනවාය යන හැඟීම මට ආවා. වුණා. අවුරුදු දෙකකට පෙර එතුමා ඒ ප්‍රකාශනය කියෙව්වා නම් සමහරවිට එතුමා අපට ඡන්දය දෙන්නටත් ඉඩ තිබුනා. දැන් එතුමා විරුද්ධ පාර්ශ්වයේ නායකයකු හැටියට සිටින නිසා කිසිම වගකීමක් නැතිව කථා කරන්නට එතුමාට ඉඩ ලැබී තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ සිටින විට තමන්ගේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු සම්බන්ධව, තමන් දුන් පොරොන්දු සම්බන්ධව, ඒ පොරොන්දු ඉෂ්ට කළ පිළිවෙළ සම්බන්ධව හැඟීමක් ඇතිව වග කීමෙන් යුතුව කථා කරන්නට ඕනෑ. එහෙත් විරුද්ධ පාර්ශ්වයට එවැනි වග කීමක් නැහැ. උන්නැහේගේ පක්ෂයේ මැතිවරණ ප්‍රකාශනය කියෙව්වොත් අපේ මැතිවරණ ප්‍රකාශනයට වඩා එහි වැඩි වෙනසක් නැති බව පෙනෙයි. ඒ නිසා අප මේ අවසථාවේදී මැතිවරණ ප්‍රකාශනය ගැන වාද වීම යුතුයයි මා සිතන්නෙ නැහැ. මැතිවරණයක් ඇති වූ විට ඔය විධියේ ප්‍රකාශන තමයි, කව්රුනුත් ඉදිරිපත් කරන්නේ. එහෙත් ක්‍රියා කරන්නට ගිය විට නොයෙක් නොයෙක් අපහසුකම් ඇති වෙනවා. ලෝකයේ තත්ත්වය වෙනස් වෙනවා. සූවස් අර්බුදය නිසා අපට හදිසියේ නොයෙකුත් කරදරවලට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. ඒ නිසා අප මේ වේලාවේදී මැතිවරණ ප්‍රකාශන ගැන වාද වීම යුතුයයි මම සිතන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය ලේඛනය ගැන කරුණු රාශියක් කියන්නට තිබෙනවා. මුදල් ඇමතිතුමාගේ අයවැය ලේඛනය විවිධ අදහස්වලින් පිරුණු අංග සම්පූර්ණ එකක්. රටේ ආර්ථික තත්ත්වය, සංවර්ධන වැඩ කටයුතු, විදේශ විනිමය, ආදි වශයෙන් නොයෙකුත් අංශ ගැන ඒ අයවැය කථාවේ සඳහන් වී තිබෙනවා. ඒ ගැන අපට පැය ගණන් වාද කරන්නට පුළුවනි. මගේ කථාවෙන් කොටසක් කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (පී. බී. ඉලංගරත්න මයා.) කියෙව්වා. ඒ නිසා මගේ කථාව කෙටි කරන්නටයි, සිදු වී තිබෙන්නේ. කරුණු දෙකක් තුනක් ගැන පමණයි, මා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ.

අයවැය ලේඛනය ගැන සඳහන් කරන විට කොළොන්නාවේ මන්ත්‍රීතුමා හොඳ වචනයක් පාවිච්චි කළා. ඒක සිංහල වචන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යක්ද නැද්ද කියා මම දන්නෙ නැහැ. "බජට්ටුව" කියන වචනය එතුමා පාවිච්චි කළා. මාත් ඒ වචනය පාවිච්චි කරනවා. එකක් රුපියලේ බජට්ටුව. අනික් එක විදේශ විනිමය බජට්ටුව. මුදල් ඇමතිවර යකු හැටියට පළමුවෙන්ම විදේශ විනිමය බජට්ටුවක් ඉදිරිපත් කෙළේ තමාය කියා කොලොන්නාවේ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. එහෙත්, 1948 දී ලංකාවේ ප්‍රථම වරට ස්වල්ප වශයෙන්වත් විදේශ විනිමය බජට්ටුවක් ඉදිරිපත් කෙළේ එවකට මුදල් ඇමති හැටියට සිටි මා බව සඳහන් කරන්නට සතුටුයි. අද විදේශ විනිමය බජට්ටුව රුපියලේ බජට්ටුව තරමටම වැදගත්. සමහරවිට ඊටත් වඩා වැදගත්. අද ඒ බජට්ටුව විස්තර සහිතව ඉදිරිපත් කළ යුතුව තිබෙනවා. රුපියලේ බජට්ටුව සකස් කිරීමට භාණ්ඩාගාරය තියෙනවා; මුදල් ඇමතිතුමා ඉන්නවා; කැබිනට් මණ්ඩලය තියෙනවා. අවසාන වශයෙන් ඒ ගැන විවාද කරන්නේ මේ පාර්ලිමේන්තුවේදීයි. විදේශ විනිමය බජට්ටුව සකස් කිරීමටත් විදේශ විනිමය අයවැය ලේඛනය සකස් කරන කාරක සභාව නමින් විශේෂ කාරක සභාවක් තියෙනවා. ඒ කාරක සභාවට ස්ථිර ලේකම්වරු රාශියක් ඉන්නවා. ඊට පසු මුදල් ඇමතිතුමත් ඒ දෙස බලනවා. සංවර්ධන වැඩ කටයුතු භාර ඇමතිතුමා ඒ බජට්ටුව පිළිබඳ වග කිවයුත්තා හැටියට එය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරනවා. කැබිනට් මණ්ඩලය ඒ බජට්ටුව ගැන සාකච්ඡා කිරීමෙන් පසුවයි, එය ප්‍රසිද්ධ කරන්නෙ. ඒ නිසා විදේශ විනිමය බජට්ටුවත් අද රුපියලේ බජට්ටුව වගේම ඉතාම වැදගත්.

ලංකාවේ මුදල් ලැබෙන පිළිවෙළ, ඒවා වියදම් කරන පිළිවෙළ, සඳහන් කර තිබෙන කොළ පාට පොතක් කාටත් බෙදා දී තිබෙනවා. දන් ඒ පොත කොළ පාටයි. 1965 ට පෙර ඒ පොත නිල් පාටයි. තව අවුරුදු කීපයක් ගිය තැන මොන පාටක් තිබේද කියා මා දන්නේ නැහැ. මුදල් ලැබෙන පිළිවෙළත් මුදල් වියදම් කරන පිළිවෙළත් ඒ කොළ පාට පොතේ තිබෙනවා. විදේශ විනිමය බජට්ටුව වෙනස් කරන්නට අපට පුළුවන්කමක් නැහැ. රුපියලේ බජට්ටුව වෙනස් කරන්නට අපට පුළුවනි. විශාල අලාභයක් තිබෙනවා නම් ලංකාවෙන් මුදල් ණයට ගන්නට පුළුවන්; ශ්‍රී ලංකා මහා බැංකුවෙන් ආධාර ගන්නට පුළුවන්. ඒවා සොයා ගන්නට ඔය අන්දමේ නොයෙකුත් ක්‍රම තිබෙනවා. එහෙත් විදේශ විනිමය සොයා ගන්නට ක්‍රමයක් නැහැ. විදේශ විනිමය බජට්ටුව හැදෙන්නේ අපේ බඩු විකිණෙන මිලේ හැටියට හා අප ගන්නා බඩුවල මිලේ හැටියටයි.

ලංකාවේ තේ, රබර්, පොල් ආදී දේවල් විකිණෙන්නේ අප නියම කරන මිලට නොවන බව කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමාට (ඉලංගරත්න මයා.) කියන්නට සතුටුයි. ඒවා විකිණෙන්නේ ලෝක වෙළෙඳ පොළේ මිල අනුවයි. අපේ බඩුවල මිල අවුරුදු පතා අඩු වෙනවා. එසේ වන්නේ මොන හේතුවක් නිසාද කියා අපට කියන්නට බැහැ. ලෝක වෙළෙඳ පොල පාලනය වන පිළිවෙල සොයා ගන්නට තරම් ඥානයක් මට හෝ මෙහි සිටින වෙනත් කෙනෙකුට හෝ ඇත්තේ නැහැ. එමෙන්ම අප විසින් යවනු ලබන බඩුවල ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වෙනවා. අඩුවීමක් නැහැ. ලෝකයේ හැම රටකටම වඩා ලංකාව තේ නිෂ්පාදනය කර තිබෙනවා. ඉන්දියාවත් අප විසින් පරාජය කරනු ලැබ තිබෙනවා. රබර් හා පොල් නිෂ්පාදනයෙන් අප තුන් වැනි තැන අර ගෙන තිබෙනවා. ඒ අනුව විශාල වශයෙන් ඒ වගාවන් දියුණු කිරීම ගැන තේ, පොල් හා රබර් හිමියන්ටත්, වැවිලිකරුවන්ටත් සේවකයින්ටත් අප ස්තුතිවන්ත වෙනවා. එහෙත් ඒ භාණ්ඩවලට ලැබෙන මිල අවුරුදු පතා අඩු වෙනවා. පොත්පත්වලින් පෙන්වන්නට වේලාවක් නැහැ. බැලුවොත් පෙනේවි. එමෙන්ම අප විසින් ගනු ලබන බඩුවල ප්‍රමාණයත් අවුරුදු පතා අඩු කර තිබෙනවා. 1960 සිට— නමුන්නාන්සේලාගේ කාලයේ සිට— නොයෙක් නොයෙක් විධියේ නීති මාර්ගයෙන් හා "ඉම්පෝට් රෙස්ට්‍රික්ෂන්" මාර්ගයෙන් අවුරුදු පතා එය අඩු කර තිබෙනවා. එහෙත් ඒවට ගෙවන මිල අවුරුදු පතා වැඩි වී තිබෙනවා. එය පාලනය කරන්නට බැහැ. උදාහරණයක් වශයෙන් හාල් ගැන බලන්න. 1966 දී හාල් ටොන් එකක් සඳහා ගෙව්වේ පවුම් 40 යි. එහෙත් 1967 දී හාල් ටොන් එකක මිල පවුම් 49 දක්වා නැංගා. එන අවුරුද්දේ දී ඊටත් වැඩි මිලක් [illegible] සිදු වෙන්න පුළුවන්. එය



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ජේ. ආර්. ජයවර්ධන]

ගන්නා ප්‍රමාණය අඩු කරන්නට පුළුවන්. එමෙන්ම එය කරලත් තිබෙනවා. මේ කරුණු නිසා මේ වතාවේදී විදේශ විනිමය සම්බන්ධ බජට්ටුව ගැන වචන සවල්පයක් කථා කරන්නට බලාපොරොත්තු වන නිසාත්, සවිස්තරව කරුණු කීපයක් කියන්නට තිබෙන නිසාත්, මගේ කථාව ඉංගිරිසියෙන් කරගෙන යෑමට මා නමුන්නාන්සේලාගෙන් අවසර ඉල්ලනවා.

Mr. Deputy Speaker, I was explaining that in our present economic situation it has become necessary to present to the House two budgets, the Rupee Budget and the Foreign Exchange Budget.

The Rupee Budget is what is contained in the book of Estimates, and deals with expenditure and revenue on a rupee basis, the revenue gained by taxation directly or indirectly in Ceylon, and expenditure that this House votes under the Appropriation Bill. Since 1956, almost during the last ten years, those rupee budgets have shown massive overall deficits in the region of not less than Rs. 400 million a year. But it has been possible to meet those deficits by various monetary measures, financial measures, by Central Bank money creation, by raising of loans, foreign aid, and so on. The Rupee Budget is, therefore, capable of adjustment. Maybe if your deficit is too large, and if there is a process of inflationary financing, the cost of living may go up and goods may rise in price within the country. But still the budget can be presented and it is something that the Government has control over to some extent. Just as in the past, even now the Treasury prepares the rupee budget and places it before the Finance Minister, and then ultimate decisions are taken by the Cabinet; and thereafter it comes to the House for discussion.

Today, the Foreign Exchange Budget also goes through a similar process. It is not something amateurish. It is something which officials with knowledge consider carefully, they consider what are our possible foreign exchange earnings and what is the expenditure necessary for imports, and then get it vetted by a foreign exchange budget committee, consisting of permanent secretaries of the Ministries concerned with the earning and spending of foreign exchange, who go through it first and place it before the Minister in charge of Planning and Economic Affairs and the Finance Minister. Ultimately it comes before the Cabinet, and the Cabinet passes it for presentation to the House. That document has also been placed before this House by the Finance Minister.

When the hon. Member for Kolonnawa (Mr. Ilangaratne) mentioned in his Budget Speech of 1963-64 that he was presenting a foreign exchange budget, I was able to tell him that the idea of a foreign exchange budget first came in the Budget of 1948 when I was Finance Minister. Of course, that was in a very sketchy way, but still we were thinking in terms of controlling our foreign exchange expenditure. Today it is much more detailed, much more important, possibly as important as a rupee budget, and in the years to come possibly we may be able to give a much more detailed list of how money is earned, how money is expended.

I should like, at least in this Debate, Members on both sides of the House to take a little interest in the Foreign Exchange Budget, to go into it in detail and give their advice and criticism, because to my mind this has become one of the key factors in the development of our country.

In my speech I shall show how certain departments under my Ministry, and their functions, impinge on the Foreign Exchange Budget particularly with regard to imports and import control, how those imports are distributed through the Controller of Imports and Exports and through the Co-operative Wholesale Establishment, and how we hope to some extent to meet the daily falling foreign exchange earnings

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

of our country by encouraging tourism, which we consider to be an important foreign exchange earner in the years to come.

So, I should like hon. Members to consider one important factor which the hon. Member for Kolonnawa also did mention. That is, that for the last ten years there has been a consistent rise in the price we pay for our imports——imports of manufactured goods, raw materials and essential foods. I will give you one example. Take, for instance, rice. In 1966 we paid for our rice a sum which did not exceed £ 40 per ton. This year the maximum price has gone up to £ 49 per ton. Maybe, in the years to come it may even be more. We have no control over that. If we want rice we must pay what the world market demands for the rice.

It is the same case with flour and sugar. The hon. Member for Kolonnawa will remember that during the cyclone we had to pay a tremendously high price for sugar.

ඉලංගරත්න මයා.
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

The price was £ 102.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

Yes, it was £ 102. But now the price has come down. So also is the case with a wide range of imported goods. The cost of these goods is going up to all the under-developed countries in the world. In the same way—the economists may have different views, I am not going to say what my views are ; perhaps, I have no views—the prices paid for our exports like tea, rubber, coconut and other goods are going down yearly. The volume of exports has not gone down. It may be that coconut had a bad year because of drought, but by and large the volume of our exports—the production of tea, rubber and coconuts—thanks to those who are in charge of these products, thanks to the research institutes, thanks to the various schemes of rehabilitation that we have, has kept on going up. The volume keeps on increasing so much so that this little country has become the biggest exporter of tea in the world, the second largest exporter of rubber, and, possibly, the third largest exporter of coconuts. Therefore, one cannot say that there has been no development of those industries to compete in the world market. But we cannot control the price that they fetch in the world market.

For example, last year for some reason the export market dropped below our estimate by Rs. 240 million. We lost—one can call it a loss —in our calculation, Rs. 240 million in our exports in 1966.

The countries which buy our goods, which have always had a favourable trade balance with us, are the United Kingdom, Canada, South Africa, New Zealand, the United States of America, and, if I may say without any international problems, the two Germanys. They have been consistently good buyers. They have always had a trade balance in our favour.

The Soviet Union, China and Australia have a good trade balance for some years, and an adverse trade balance for other years. India, Pakistan, Burma, Japan and France have been consistently having an adverse trade balance as far as we are concerned. Whether we buy from them or they buy from us—particularly in the case of India, Pakistan and Burma, because we have to buy our rice and essential subsidiary foodstuffs from them—we have an adverse trade balance against us. That is something that those countries enjoy every year.

It may be that we are dealing more with socialist countries or less with them, it may be that we have barter agreements, but as far as this Government and your Government are concerned, there is no particular

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

preference to which country we sell our goods provided they are prepared to buy. And there is no particular preference from which country we buy provided they sell it to us at the lowest price.

But the fact remains, and this is a fact that has not been contradicted, that during the last few years we have been getting less for our exports, though the volume has increased, and we are paying more for our imports though in volume, by restrictions and controls—deliberate controls of essential goods such as rice—we have been importing less and less.

The figures for the last three years are as follows :

| | | | |
|---|---|---|---|
| 1965 | Exports Rs. | 1,916 | million |
| | Imports Rs. | 1,922 | million |
| 1966 | Exports Rs. | 1,676 | million |
| | Imports Rs. | 2,023 | million |
| 1967 | (forecast) | | |
| | Exports Rs. | 1,723 | million |
| | Imports Rs. | 2,231 | million. |

The fact that we are able to go up to Rs. 2,000 million for imports is due to foreign aid which helped us to finance some of the essential imports for production and even consumption.

So that is why the Foreign Aid Budget becomes important. And in this booklet you see some of the strategy that has gone into the framing of the Foreign Exchange Budget. On page 7 of this booklet, what is called the "Strategy of Budgeting" is outlined. I should like to quote that because I want to impress the Foreign Exchange Budget directly on the minds of the hon. Members.

"The strategy adopted in formulating the Foreign Exchange Budget for 1967 has been to reduce imports of consumer goods, wherever desirable, and divert the foreign exchange resources for the import of intermediate and capital goods needed for development. The criteria adopted in the case of consumer goods have been firstly, to maintain the per capita level of imports of essential items ; secondly, to reduce and in some cases ban non-essential items, and thirdly, to reduce imports of those items where there was a prospect of increased domestic production. The reductions made in the case of chillies, onions and potatoes have been specifically directed towards promoting increases in local production. It is expected that the higher market prices that will temporarily prevail, as a result, will act as an incentive to increasing domestic production of these food crops. Action has been taken through the Foreign Exchange Budget to promote agricultural activities and provide the necessary inputs for rapid agricultural development. Particular mention should be made of the adequate allocations given for imports of fertilizers and agro-chemicals required to fulfil the programme, the allocation of Rs. 28 million made for the import of tractors, implements and spares and the allocation made for the import of 450,000 mamoties during 1967, which is double the level of imports in 1966. In addition, as stated above, incentives have been given to the private sector by the release of foreign exchange for the import of machinery and planting material for agricultural projects."

You will, therefore, see that in the drafting of the Foreign Exchange Budget there has been a plan and a reasoning. The strategy of the Foreign Exchange Budget is stated here. In 1967, of the Foreign Exchange Budget Rs. 837 million has been allocated to the Food Commissioner for imports of foodstuffs. There have been large allocations for fertilizers, petroleum products and so on. Rs. 597,000,000 of the Food Commissioner's imports includes such items as rice, sugar and subsidiary foodstuffs. The idea then—the strategy behind the Foreign Exchange Budget—has been, firstly, to operate within the limits of what we earn in foreign exchange, and to see that essential consumer goods are available to the consumer ; secondly, to see that goods required for local production, which take the place of imports, are made available ; and thirdly, to see that all help is given to reduce imports so that domestic production could easily take their place, for example chillies, onions and potatoes.

That, by and large, has been the strategy of the Foreign Exchange Budget under this year's Appropriation Bill.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

We, of course, had to have recourse to foreign aid. Without that, we might have had to cut down our imports much more. That foreign exchange has been allocated in three programmes. Three meetings of the countries which give us aid, the consortium, have been held in Washington, London and Tokyo, and aid to the extent of Rs. 620 million-odd has been passed for the three years. Of this aid, Rs. 421 million is aid pledged for the first and the second programmes, and out of this sum Rs. 227.3 million has been received and Rs. 194 million is expected in 1967.

I think it is our duty to thank those donor countries. It may be that they charge interest; it may be that we have to buy goods from them. Whatever it is, it has been possible for us to import essential machinery, spare parts, even food. Ultimately, on these three programmes we shall receive aid in Rs. 620 million—about Rs. 200 million a year for these years—to supplement our foreign exchange earnings. I would not look this gift horse, if one can call it a gift, in the mouth, as the hon. Member for Kolonnawa (Mr. Ilangaratne) wants us to do. I should like to remind him that when the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) was the Finance Minister he said that without foreign aid it would not be possible for us even to exist. We have been able to get foreign aid to help this country, and we must continue to get that aid as long as possible, because it helps, not the capitalists or the rich men, but, by and large, the people—the cultivators, the workers, and so on—who are helping to develop the country.

The goods that are imported come under various controls. After the foreign exchange budget has allocated the various items for expenditure under the Ministries, the Food Commissioner, and so on, a large portion of it comes through the Controller of Imports and Exports. All the allocations to the private sector, all the allocations for trade quotas, and for direct-user items come under the Controller of Imports and Exports. The Controller of Imports and Exports is an officer under my Ministry. Mr. D. B. I. P. S. Siriwardane held this office; he has now left us. He organized the whole department. I think he was able to rid the department of a certain amount of corruption and organize it well, so that people who came for licences and help secured them over the counter instead of having to wait for days and months, fill up forms, write letters, and so on. I am very glad to say that there has been very little criticism of the Import Control Department during the last two years. I hope that the system that has been introduced will be followed.

Now, Sir, we placed before the House, just before Prorogation, legislation dealing with the control of imports and exports. Unfortunately, we were not able to complete the Second Reading of that Bill which seeks to consolidate all the existing import and export regulations in the statute book. The import and export control regulations are here and there, and they will be brought under one comprehensive piece of legislation. That Bill will be placed before this House as soon as possible.

එපමණක් නොවෙයි, එතුමාගේ අයවැය කථාවේ තවත් තැනෙක තිබෙනවා, අස්වැන්න වැඩි කිරීමේ පරමාර්ථයෙන් පෝර ආනයනයන් රුපියල් 7,80,00,000 සිට 9,10,00,000 දක්වා වැඩි කර තිබෙනවාය කියා. ඔය විධියට ඉඩම් ප්‍රමාණයත් වැඩි වී, පෝර පහසුකමුත් වැඩි වී 1966 දී ලැබූ වී අස්වැන්න බුසල් ලක්ෂ 465 යි. මා කලින් සඳහන් කළා, ඊට කලින්, එනම් 1964 දී, ලක්ෂ 505 ක් තිබුණ බව. එසේ නම් අප කියනවා තමුන්නාන්සේලා මේ ගෙන යන ප්‍රචාරය අසත්‍යය කියා. අප මෙය පෙන්වා දෙන්නේ සංඛ්‍යා ලේඛනවලිනුයි. නැතැයි කියනවා නම් එය ඔප්පු කර පෙන්වන්න. මේවා තමුන්නාන්සේලාගෙ සංඛ්‍යාලේඛන. මහා බැංකුවෙ වාර්තා අපේ නොවෙයි, තමුන්නාන්සෙලාගෙ. නමුත් තමුන්නාන් සෙලාගෙ මුදල් ඇමතිවරයා කියන්නෙ එකක් ; මහා බැංකුව කියන්නෙ වෙනත් එකක්. එයින් පැහැදිලියි, රට රවටන්න මොන විධියෙ බොරු ප්‍රචාරයන්, මෙම අය වැය ලේඛනයෙනුත්, ගුවන් විදුලිය මාධ්‍යයෙනුත්, කරනවාද කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තේ නිෂ්පාදනය වැඩි වී තිබෙනවාද කියා ටිකක් දුරට කල්පනා කර බලමු. තේ නිෂ්පාදනය 1960 අවුරුද්දේදී, දස ලක්ෂ ගණනින් 435 යි. 1961 දී 455 යි. 1962 දී 467 යි. 1963 දී 485 යි. 1964 දී 482 යි. 1965 දී 503 යි. 1966 දී 490 යි. ඒ අන්ද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. එම්. හේරත් මයා.]

මට 1966 දී 490 දක්වා,—ඊට පෙර අවුරුද්දටත් වඩා—පහත බැස තිබෙනවා. එහෙනම් තමුන්නාන්සෙලාගෙ පාලන කාල සීමාව තුළදී තේ නිෂ්පාදනයත් පහත වැටී තිබෙන බව පැහැදිලියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුව බොහොම පුරසාරම් දොඩනව 'රට සංවර්ධනය කළා, කෘෂිකර්මය අතින් රට ස්වයංපෝෂිත වන්න ළඟයි, තවත් සුළු කාලයකින් සංවර්ධන කටයුතු අවසානයි' කියා. පසුපස ආණ්ඩු පක්ෂයෙ ආසනවල සිටින මන්ත්‍රීවරුන් හිතනවා ඒ සියල්ලම ඇත්තය කියා. නමුත් තමුන්නාන්සෙලාගෙ අයවැය ලේඛනයත්, බැංකු වාර්තාත් අරගෙන බැලුවාම පෙනී යනවා, මේ සියල්ලක්ම සම්පූර්ණයෙන් ම අසත්‍ය දේවල් බව. 1964 ට පෙර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ ආණ්ඩු කාලයෙදී, තේ නිෂ්පාදනය අතින්, පොල් නිෂ්පාදනය අතින්, වෙනත් ද්‍රව්‍ය නිෂ්පාදනය අතින් යම්කිසි දියුණුවක් ලබා තිබුණා නම්, එදා තිබුනු ඒ තත්ත්වයවත් රැක ගන්න බැරි වී තිබෙනවා. අද ඒ නිෂ්පාදන සියල්ලක් ම පහත බැස තිබෙනවා. අඩු වශයෙන් ඒ තත්ත්වයේවත් ඉඳගෙන කියනවා නම්, ජනතාව මේ අදහස් පිළිගන්න තිබුණා. නමුත් අද හැම නිෂ්පාදනයක්ම පහත බැස තිබෙනව; ඉහළ ගිහින් නැහැ කිසිම අංශයකින්.

ඊළඟට බලන්න පොල් නිෂ්පාදනය ගැන. පොල් නිෂ්පාදනය දස ලක්ෂ ගණනින් ගත්තොත් මෙහෙමයි. 1960 දී නිෂ්පාදනය 2183 යි. 1961 දී 2601 යි. 1962 දී 2811 යි. 1963 දී 2557 යි. 1964 දී 3000 යි. ඒ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආණ්ඩු බලයේ සිටි අවසාන අවුරුද්දේදීයි. 1965 දී 2681 යි. 1966 දී 2468 යි. මේ අනුව 1964දී දස ලක්ෂ 3000 ක්ව තිබුණු පොල් නිෂ්පාදනය 1966 දී දස ලක්ෂ 2468 දක්වා පහත බැස තිබෙනවා. සංවර්ධනය කළාය කියනවා නම් තේ පොල් නිෂ්පාදන පහත බැස්සෙ කොහොමද? මෙම වාර්තාවල තිබෙනවා, පොල් අලුතෙන් වවන්න ආධාර දුන්නාය, තේ අලුතෙන් වවන්න ආධාර දුන්නාය, තේ වලට සහනාධාර දුන්නාය කියා. ඔය අන්දමට මොන මොන ආධාර ක්‍රම සැලසුවත් නිෂ්පාදනය ඊට පෙර තිබුණාට වඩා පහත බැස තිබෙනවා.

තේ නිෂ්පාදනයත්, පොල් නිෂ්පාදනයත් ඔය අන්දමට පහත බැස තිබෙනවා නම් තමුන්නාන්සේලාට ඉතුරු වී තිබෙන්නෙ, රබර් නිෂ්පාදනය පමණක් නො වෙද? එය පමණයි වැඩි වී තිබෙනවා යයි කියන්න පුළුවන්කම ලැබී තිබෙන්නෙ. එසේ වැඩි වුණේත් කොහොමද? තමුන්නාන්සෙල බොහොම තරහයි රතු රටවල් සමග. සමහර උදවියට රතු රටක නමක් වත් කීවොත් හරියට කේන්ති යනවා. නමුත් රතු රටක් සමග අපේ ආණ්ඩුව ඇති කර ගත් ගිවිසුම නිසා තමුන්නාන්සෙලාට රබර්වලින් වැඩි ආදායමක් ලබා ගන්න පුළුවන් වුණා. එහෙමනම් එහි ගෞරවය තමුන්නාන්සෙලාට නොවෙයි ලැබෙන්නෙ.

මේ අන්දමට නිෂ්පාදනයෙන් පමණක් නොවෙයි ආදායම අඩු වී තිබෙන්නෙ. අපනයන වටිනාකමත් අඩු වී තිබෙනව. අපනයන වටිනාකම සම්පූර්ණයෙන්ම වාගෙ පහත බැස තිබෙනවා. පොල්වල, තේවල හා අනිකුත් ද්‍රව්‍යවල අපනයන වටිනාකම පහතබැස තිබෙනවා. ඒ නිසා මේ හැම නිෂ්පාදනයකින්ම ආදායම පහත බැස තිබෙනවා. එහෙම නම්, අපේ පොල් නිෂ්පාදනය, අපේ තේ නිෂ්පාදනය පහත වැටී තිබෙනවාය, ඒවායින් ලැබෙන ආදායම අඩු වී තිබෙනවාය එමනිසා මුදල් අතින් රටේ අමාරුකමක් ඇති වී තිබෙනවායයි රට ඉදිරියට ගිහින් අවංකවම කියන්න ඕනෑ. ඒකයි අවංක ප්‍රකාශය, මේ අයවැය ලේඛනය නොවෙයි. නමුත් තමුන්නාන්සෙලා කියන්නෙ කොහොමද? පත්‍රවල පළ කරන්නෙ කොහොමද? "එදා රජයෙ මැති ඇමතිවරුන්ගේ වැඩ වේදිකාවට පමණක් සීමා වී තිබුණු නිසා රටේ ආර්ථික පරිහානි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇති වුණා" ය කියා නොවෙද කියන් නෙ? හොඳයි අපේ මැති ඇමතිවරුන් වේදිකාවල කථා කළ නිසාද සංවර්ධනය පහත බැස තිබෙන්නෙ? එහෙම නැතුව තමුන්නාන්සෙලාගෙ අදක්ෂකම නිසා නොවෙද? ඇයි මෙය පිළිගන්න බැරි? තමුන්නාන්සෙලාට පුළුවන්කමක් නැහැ අඩු වශයෙන් තිබුණු තත්ත්වයවත් රැක ගන්න. සංවර්ධනය නොවෙයි, තමුන් නාන්සේලාගෙ යම් යම් අනුවණ ක්‍රියා මාර්ග ගයන් නිසා තේවලත් අනිකුත් නිෂ්පාදන වලත් අපනයන වටිනාකම් පහළ බැස තිබෙනවා. එසේ සිදු වී තිබෙන්නේ තමුන්නාන්සේලාගේ ක්‍රියාමාර්ගවල ඇති වැරදි නිසයි. ඒවා රටට කියන්න. මේ වාගේ බොරු තමුන්නාන්සේලාගේ පච පත්‍රවලින් රටපුරා ප්‍රචාරය කිරීම වැරදි බවයි, අපි තමුන්නාන්සේලාට ප්‍රකාශ කරන්නේ.

ඊළඟට තමුන්නාන්සේලා කියනවා, ගොවියා රජ කෙරුවාය කියා. දැන් ගොවියා රජ්වෙලා. හැබැයි ඒ වුණාට කෑදත් නැහැ. ගම්පොළ ගොවි රජා තෝරල ඔටුණු පැළැන් දුවා. අලිය උඩට නංවන්න යන කොට පොඩි කරදරයක් ඇතිවුණු එක විතරයි වැරැද්ද. තමුන්නාන්සේලා මේ බොරු කරන්නෙ කාටද? තමුන්නාන්සේලා ගොවියාට මොනවද දීල තිබෙන්නේ? තමුන්නාන්සේලා කර තිබෙන එක දෙ යක් තමයි. ගොවීන් අතර පන්ති භේද යක් ඇති කිරීම. මොකක්ද? ධනපති ගොවීන් කියා කණ්ඩායමක් තමුන්නාන් සේලා දැන් හදා තිබෙනවා. ධනපති ගොවීන්ට ට්‍රැක්ටර් දෙනව; ජීප් දෙනව; ඉඩම් දෙනව. තමුන්නාන්සේලාගේ මුදල් ඇමතිතුමාගේ වාර්තාවේම හැටියට ඉඩම් අක්කර 57,500 ක් එවැනි උදවියට බෙදා දී තිබෙනවා. මුදල් ඇමතිතුමා කියනවා, රුපියල් කෝටි 4 ක ට්‍රැක්ටර් ගෙන්වීමට දැනටමත් බලපත්‍ර දීල තිබෙනවාය කියා. පුංචි ගොවියාට මොකද වෙලා තිබෙන්නෙ? ඒ අයට තිබෙන්නේ එදා තිබුණු පුංචි කුඹුරු කෑල්ලමයි. ගම්බද සාමාන්‍ය ගොවි යාගේ ඉඩම් ප්‍රමාණය අඟලකින්වත් වැඩි වෙලා තිබෙනවා යයි මුදල් ඇමතිතුමාට කියන්න පුළුවන්ද? මොනවද ඔවුන්ට දීලා තිබෙන උදව්? ඔවුන්ට තිබුණු සහන පවා නැති කර තිබෙනවා.

මුදල් ඇමතිතුමා කියනවා, ගොවීන්ට දැනට වඩා සාධාරණ ණය ක්‍රමයක් ඇතිකර තිබෙනවා කියා. රුපියල් 175 ණය මුදල රුපියල් 220 දක්වා වැඩි කර තිබෙනවාලු. එහෙත් තමුන්නාන්සේලාගේ මේ රුපියල් 220 ගන්න ගොවියා දැන් බැංකුවට යන්න ඕනෑ. එදා ගමේ සමුපකාරයෙන් රුපියල් 175 ලබා ගත් ගොවියා අද සමුපකාරයෙන් නිර්දේශය ලබාගෙන ඇපකරුවන් දෙදෙනකුත් සමග බැංකුවට යන්න ඕනෑ, මේ රුපියල් 220 ලබාගන්න. පොලිය කීයද? සියයට 12 යි. තමුන්නාන්සේ තේ වවන්න සහනාධාර දෙනවා. ආපසු නොගන්න නිකම් සල්ලි දෙනවා. පොල් වවන අයටත් රබර් වවන අයටත් ඒ විධියෙ සහනාධාර දෙනව. එහෙත් ගොවියාට දෙන මේ රුපියල් 220 ණය මුදලට අසාධාරණ පොලියක් අය කර ගන්නවා. එපමණක් නොවෙයි, ඒ ණය මුදල ලබා ගැනීමට අද ගොවියාට හැතැප්ම 50 ක් 60 ක් සමහරවිට 100 ක් මඟ ගෙවා බැංකුවක් සොයාගෙන යන්න සිදු වෙනව. ගොවීන් රජ කරවන්නෙ ඔහොමද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තරුණ ගොවි කඳවුරු ඇති කර තිබෙනවලු. ගොවි හට හමුදා ඇතිකර තිබෙනවලු. කොයි ආකාරයටද ඒවාට ගොවීන් තෝරන්නෙ? ඒවාට ගොවි හමුදා යයි කියන්න අයිති යක් තිබෙනවද? ගොවි හමුදා නොවෙයි ඒව, "බටගොයි" හමුදා. කොළපාට තොප්පි දමාගෙන ඡන්ද කාලයෙදි එහා මෙහා ඇවිද්ද. "බටගොයියො" තමයි ඒවාට එකතු කරන්නෙ. ගොවි හමුදාවට ඉල්ලුම් පත්‍ර කැඳෙව්ව. ඉල්ලුම් පත්‍ර ඇමු අයගෙන් සුදුස්සන් තෝරා ගත්තෙ නැහැ. රාජාසන කථා විවාදයේදි හෝ ඊට කලින් දවසක හෝ මම පාර්ලිමේන්තුවෙදි මේ ප්‍රශ්නය නැගුව. ඊට පසුව ඉඩම් ඇමති තුමා මට ඒකට උත්තරයක් එවා තිබෙනව, වලපනේ කොට්ඨාශයේ ගොවි හමුදාවට තෝරා ගත් අයගේ සහතික පත්‍ර පරීක්ෂා කිරීම විතරයි කළේ, තවම තෝරාගෙන නැත කියා. එතුමාගේ ලියුම මට ලැබෙන විටත් මගේ කොට්ඨාශයේ විශාල පිරිසක් විදුලි පණිවුඩ මගින් හමුදාවට කැඳවල ඉවරයි. පාර්ලිමේන්තුවේ කියන්නෙත් බොරු. මේ හැම නිදර්ශනයක්ම එකක් එක්ක් පාසා කාරක සභා අවස්ථාවෙදි අපි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. එම්. හේරත් මයා.]

ගෙනෙනව. මේ පාර්ලිමේන්තුවේ තමුන්නාන්සේ යටතේ ඉඳගෙන කියන්නෙ බොරු. අපට දෙන පිළිතුරුවලින් වැඩි හරියක් බොරු. මේ විධියට අහසේ මාළිගා තනමින් රට රවටාගෙන අලුත් පන්තියක් හදා තිබෙනව, ගොවි ධනපති පන්තිය කියා. ඒ ගොල්ලන්ට තමයි, අක්කර 57,500 ක් බෙදා දීල තිබෙන්නෙ. ඒ ගොල්ලන්ට තමයි, ජීප් දීල තිබෙන්නෙ. ඒ ගොල්ලන්ට තමයි, ලොරි සහ ට්‍රැක්ටර් දීල තිබෙන්නෙ. සාමාන්‍ය මිනිහාට පෝර ටිකත් නැහැ; බිත්තර වී ටිකත් නැහැ; ණය මුදලත් නැහැ. ඔහු ජලය ලබා ගන්නා සුළු වාරිමාර්ගය වන අමුණ කැඩුණොත් ඒක හදල දෙන්නෙත් නැහැ. ධනපති ගොවීන්ට හරකුත්. ඒ වුණාට ගොවියාට නැහැ, හරක්. මෙහි සිටින හරක් මදිවට තවත් හරකුන් පිටරටවලින් ගෙන්වන්නට යන බව කියැවෙන ප්‍රවෘත්තියක් මා "දවස" පත්‍රයෙන් දැක්කා. මේ විධියට, අද මේ රජයේ ගොවි ප්‍රතිපත්තිය මේ රටේ සාමාන්‍ය මිනිසුන් අතර පවා සමච්චලයට ලක් වී තිබෙනවා.

එපමණක් නොවෙයි. වී සහන මිල ගැනත් ගරු මුදල් ඇමතිතුමා මේ අය වැය ලේඛනයෙහි ලොකුවට සඳහන් කර තිබෙනවා. වී සහන මිල වැඩි කරන බවත් එතුමා කියා තිබෙනවා.

"සහතික මිළ ක්‍රමයේ පහසුකම් සියලුම නිෂ්පාදකයන්ට ලැබෙන බවට වග බලා ගැනීම සඳහා මෙන්ම, සහල් සලාකයේ කාර්යයන් සඳහා දේශීය වී මිළයට ගැනීම් හැකිතාක් වැඩි කිරීම සඳහා ද වී මිළයට ගැනීමේ සංවිධාන ක්‍රමවත් කිරීමට වර්ෂය තුළදී පියවර ගෙන තිබෙනවා".

ගරු මුදල් ඇමතිතුමනි, තමුන්නාන්සේගේ මේ ප්‍රකාශය ඇත්තක්ද? ඇත්තක් නම්, සහන මිල ක්‍රමය අනුව වී මිලයට ගැනීම සඳහා තමුන්නාන්සේගේ 1967-68 අය වැය ලේඛනයෙන් කොපමණ මුදලක් වෙන් කර තිබෙනවාද? තමුන්නාන්සේ වෙන් කර තිබෙන මුදල රු. 6,86,70,000 යි. ගිය අවුරුද්දේ කීයද? රු. 19,45,80,000 යි. ගිය අවුරුද්දෙත් මේ අවුරුද්දෙත් සහන මිල ක්‍රමය අනුව වී ගැනීමට වෙන් කර තිබෙන මේ මුදල් කොටස් දෙකේ වෙනස කොපමණද? රු. 12,59,10,000 යි. මොකක්ද මීට හේතුව? තමුන්නාන්සේලා ලබන අවුරුද්දේ සහන මිල යටතේ ගොවීන්ගේ වී මිලයට ගන්නේ නැහැ. එසේ ගැනීමට මුදල් වෙන්කර නැහැ. ගිය අවුරුද්දේ වෙන් කරනලද මුදලෙන් තුනෙන් දෙකක්ම මේ අවුරද්දේ කපා හැර තිබෙනවා. තමුන්නාන්සේලා මේ රටේ සාමාන්‍ය ගොවීන්ගේ වී ටිකවත් ගන්නට ලෑස්ති නැහැ. ගැනීමට මුදල් වෙන් කොට තිබෙන වී බුසල් 50 ලක්ෂය අර ධනපතියන් විසින් වවන අක්කර 57,500 හි වවන වීවලින් ලබා ගැනීමට තමුන්නාන්සේලා කටයුතු කරනවා. ධනපතියන්ගේ කුඹුරුවලින් ඒ බුසල් 50 ලක්ෂය තමුන්නාන්සේලා ලබා ගනියි. සාමාන්‍ය ගොවීන්ගෙන් වී ගන්නට තමුන්නාන්සේලා ලෑස්ති නැහැ. මුදලත් කපා හැර තිබෙන්නේ ඒ නිසායි. සහන මිල ක්‍රමය අනුව හැකි තරම් වැඩියෙන් වී මිලයට ගන්නවායයි අය වැය ලේඛනයෙහි කියා තිබෙනවා. එහෙත්, එසේ වී මිලයට ගැනීමට ගිය අවුරුද්දේ වෙන් කළ මුදලටත් වඩා රු. 12,59,10,000ක් අඩුවෙනුයි මේ අවුරුද්දේ වෙන් කර තිබෙන්නේ.

ප්‍රවෘත්ති පත්‍ර මගිනුත් ගුවන් විදුලියෙන් හා වෙනත් නොයෙක් ක්‍රමවලිනුත් මේ සම්බන්ධයෙන් රජය කියන තරමක් කියන්නේ බොරු. මෙවැනි මායාවලින් මේ රජය රට රවටන බවට මා කෙළින්ම මේ රජයට චෝදනා කරනවා. රට රවටන ගමන්ම තමුන්නාන්සේලා ධනපතියන් සංවර්ධනය කරනවා. අද මේ රජය ඉඩම් දෙන්නේත් ලොරි දෙන්නේත් ජීප් දෙන්නේත් ට්‍රැක්ටර් දෙන්නේත් අනෙක් සියලුම පහසුකම් දෙන්නේත් ධනපතියන්ටයි. විදේශ විනිමය ආරක්ෂා කර ගන්නට ඕනෑ නිසා එක මිනිසකුට මිරිස් අවුන්ස 3 කට වඩා දෙන්නට බැරියයි ගරු රාජ්‍ය ඇමතිතුමා කියනවා. විදේශ විනිමය රැකීමට දුප්පතා මිරිස් ටික නැතිව, සූදුරු මාදුරු ටික නැතිව, කොත්තමල්ලි ටික නැතිව, උම්බලකඩ ටික පරිප්පු ටික නැතිව, හාල් සේරු දෙකෙනුත් එකක් නැතිව බොහොම අමාරුවෙන් පටි තද කරගෙන බඩගින්නේ සිටිනවා. ඒ විධියට ඉතිරි කර ගන්නා විදේශ විනිමයෙන් මේ රජය ධනපතියනට ජීප්, ලොරි, ට්‍රැක්ටර්, පස්ස දොරෙන් කාර් සපයා දෙනවා. ඒ මදිවාට හෙට අනිද්දාට ඔවුනට ටෙලිවිෂනුත් දෙන බාල අපේ තරුණියන් ලවා විදේශීය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ධනපතියන්ගේ කකුල් මිරිකවන්නට ගඩු මිරිකවන්නට සම්බාහන ආයතනත් හෙට අනිද්දා ඇති කරනවාලු. මේකද තමුන් නාන්සේලාගේ සංවර්ධනය? ප්‍රවෘත්ති පත්‍රත් ගුවන් විදුලියත් තමුන්නාන්සේලා ගේ නිසා මේවා වසාගෙන සිටින්නට තමුන්නාන්සේලාට පුළුවන් වී තිබෙනවා. එහෙත් මේ රටේ මහජනතාව මේවා හරියාකාර දැනගත් දාට තමුන්නාන් සේලා කොහේ ඉතුරු වෙයිද යන්නයි අපට තිබෙන ප්‍රශ්නය. මේ කරුණු බොරු යයි මේ ගරු සභාවේ ඕනෑම ගරු මන්ත්‍රී වරයකුට පුළුවන් නම් පෙන්වන්න. අප මේ කරුණු ඉදිරිපත් කරන්නේ රජයේම වාර්තාවලිනුයි.

වී සහන මිල කැපුවේ ඇයිදැයි මා නැවත වරක් ගරු මුදල් ඇමතිතුමාගෙන් අහනවා. රතුළුණු සහන මිල නම් වැඩි කර තිබෙනවා. ඒ මොකද? පෙඩරල් පක්ෂය සන්තෝෂ කරන්නට ඕනෑ නිසායි. ගිය අවුරුද්දේ රු. 45 ලක්ෂයක්ව තිබුණු රතු ළුණු සහන මිල මේ අවුරුද්දේ රු. 60 ලක්ෂය දක්වා වැඩි කර තිබෙනවා. මේ රටේ සාමාන්‍ය ජනතාවට ආහාර අතින් ලැබුණු සහන මේ රජය විසින් හොරකම් කර තිබෙනවා. ඔවුන්ට නොදන්වා හොර කම් කරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1964/65 වර්ෂයේදී මහජනතාව් වෙනුවෙන්, සහල්, වී, රතුළුණු, පිටි ආදීය සම්බන්ධ යෙන් මහජනයාට දෙන සහනයක් වෙනු වෙන්, අපේ රජය තිස්දෙකෝටි හැත්තෑ ලක්ෂයක පාඩුවක් දැරුවා. ගිය අවුරුද් දේ 1966/67 ඒ ගණන තිස්කෝටිහැත්තෑ දෙලක්ෂ පණස්දාහයි. තමුන්නාන් සේලා එයිනුත් කෝටි දෙකක පමණ ලාභ යක් ගත්තා. මේ අවුරුද්දේ ඒ ගණන කීයද? තමුන්නාන්සේලා මහජනතාව් වෙනුවෙන් කීයක පාඩුවක් දරා ගන්න වාද? 1967/68 අවුරුද්දේ ඒ ගණන විසි එක්කෝටි හැත්තෑපන්ලක්ෂයයි. එයි නුත් කෝටි එකොළහක් පමණ හොරකම් කර තිබෙනවා. දුප්පතාට ලැබෙන සහන වලින් කොටසක් හොරකම් කර තිබෙ නවා; ආපසු අරගෙන තිබෙනවා. මීගමුවේ ගරු මන්ත්‍රීතුමා නැත කියා ඔළුව වනනවා. තමුන්නාන්සේ කරුණා කර අයවැය ලේඛනය කියවා බලා ඔළුව වනන්න. ඊයෙ පෙරේද ඇවිත් මේව තේරුම් ගන්ට බැහැ.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்னாண்டோ)*
(Mr. Denzil Fernando)

ඊයෙ පෙරේද ආවට හොඳට තේරෙනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ආපු හැටියෙම කිව්වෙ හාල් කපන්නය කියායි. මේ අය බත් කන්නේ නැතිව ඇති. සමහර විට බත් කෑම තහනම් අස නීපවලින් පෙළෙනව ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකයි කෘෂිකර්මය පිළිබඳ තත්ත්වය. සහල් කැපීමෙන් අඩු වශයෙන් මේ රටේ මිනිසුන්ටවත් සහනයක් ලැබුණාද? ඒත් නැහැ. පිටරටින් ගෙනෙන සහල් සේරු වක මිළ ශත 60 යි. එක පුද්ගලයකුට සහල් සේරු දෙකක් අප දුන්නෙ සේරු වක් ශත 25 බැගින්. සහල් සේරු දෙක ගත්තෙ 1.20 ටයි. ඒ සහල් සේරු දෙක අප දුන්නෙ ශත 50 ටයි. ආණ්ඩුව ශත 70 ක පාඩුවක් දැරුවා.

දැන් තමුන්නාන්සේලා එක පුද්ගලය කුට දෙන්නෙ එක සේරුවයි. දෙන්නෙ නොමිළෙ තමයි. එහෙත් එයින් ආණ්ඩුව දරන පාඩුව් ශත 60 යි. එයිනුත් ශත 10ක් පාරිභෝගිකයාට පාඩුයි. එක පුද්ගලයකුට ශත 25 බැගින් සහල් සේරු දෙකක් දීමෙන් ආණ්ඩුව දැරු පාඩුව ශත 70 යි. අද නොමිළයේ වුවත් එක පුද්ගලයකුට එක සේරුවක් දීමෙන් ආණ්ඩුව දරන පාඩුව ශත 60 යි. එහෙම නම් පාරිභෝගි කයාට සහල් සේරුවක් පමණක් නොවේයි, මුදලිනුත් ශත 10ක් පාඩුයි. ශත 85 ට සහල් ඕනෑ තරම් තිබෙනවාය කියා ගරු මුදල් ඇමතිතුමා කියනවා. එය ගුවන් විදුලියෙන් කියනවා. සේරුව ශත 85 බැගින් සහල් ඕනෑ තරම්, ටොන් ගණන් දෙන්නම්ය කියනවා. නමුත් වී බුසලක් රුපියල් 12 ට අඩුවෙන් ගත හැකි තැනක් ලංකාවේ තිබෙනවා නම් පෙන් වන්නය කියා මා කියනවා. මගේ අභියෝ ගය පුළුවන් නම් භාර ගන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ඒක නරකද ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
නරක නොවෙයි, මගේ අභියෝගයට පිළිතුරක් දෙන්න. රුපියල් 12 ට අඩු වෙන් වී බුසලක් ගන්නට පුළුවන්ද ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ගොවීන්ට හොඳයි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
තර්කයක් ඉදිරිපත් කරන්නට ශක්තියක් තියෙන්න එපායැ. ඒවාගේම වී බුසලක් රුපියල් 12 කළේත් තමුන්නාන්සේලා නොවෙයි. අපේ රජයයි ; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජයයි. ශත 85 ට සහල් කොහේද තිබෙන්නෙ? වී බුසලක් රුපියල් 12 නම් එහි තේරුම එක සේරුවක් රුපියලක් වන බවයි. සාමාන්‍යයෙන් වී බුසලකින් සේරු දොළහකට වඩා ගන්නට බැහැ.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்னாண்டோ)*
(Mr. Denzil Fernando)
සේරු දහ අටක් ගන්නට පුළුවනි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
සේරු දහ අටක් ? මේ අයද මේ රටේ වවන්නෝ ? [බාධාකිරීමක්].

**සෙනරත් මයා.**
*(திரு. சேனரத்)*
(Mr. Senerath)
කරුණා කර ඒ වී ටිකක් අපට දෙන්න.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
බුසලකින් සේරු 18 ක් ලබා ගන්න පුළුවන් වී ගෙනැවිත් දෙන්නය කියා මා මීගමුවේ ගරු මන්ත්‍රීතුමාට අභියෝග කරනවා. නොදන්න දේවල් ගැන මොනවට කථා කරනවද ? වැඩිම සේරු ගණනක් දෙන සම්බා වී බුසලකින්වත් සේරු පහළොවකට දහසයකට වඩා ගන්නට බැහැ. කැකුළෙන් කොටන හැම වීයකින්ම සේරු 12 ට වඩා ගන්නට බැහැ. තැම්බූ වීයකින් නම් සේරු 13 ක් 14 ක් ගන්නට පුළුවන්. සම්බා වී බුසලකින් පවා ගන්නට පුළුවන් වන්නේ, හාල් සේරු 15 ක් 16 ක් පමණයි. සමහර විට ගරු මන්ත්‍රීතුමා කල්පනා කරනවා ඇති වී බුසලත්, කජු බුසලක් වගේය කියා. කජු බුසලකින් නම් පුළුවන් වෙයි, සේරු 18 ක් ගන්නට.

තමුන්නාන්සේලාගේ කෘෂිකර්ම ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම බොරුවක් බව පිළිගන්න. එයින් කරන්නේ ධනපතියන් ආරක්ෂා කිරීමක්. තව ටික දවසක් යන විට අපේ ඡන්ද කොට්ඨාශවල ඉන්න එළවළු වවන්නන් පවා අමාරුවේ වැටෙනවා. රජයේ ආධාර ඇතිව ධනපති කොම්පැණි මඟින් දැන් තේ වතුවල එළවළු වැවීම ආරම්භ කර තිබෙනවා. ඒ කොම්පැණිවලට සල්ලි තිබෙනවා, කම්කරුවන් ඉන්නවා. හැම පහසුකමක්ම සපයා තිබෙනවා. ඒ අය එළවළු වවන්නේ රක්ෂාවක් වශයෙන් නොවෙයි, කෑම දිර වන්නට නැත්නම් විවේකය සඳහා වගෙයි. තමන් වවන එළවළු කීයට දුන්නත් ඔවුන්ට කමක් නැහැ. එයින් වන්නේ එදිනෙදා රැකියාව සඳහා එළවළු වවන සාමාන්‍ය ගොවියා අමාරුවේ වැටීමයි. ධනපති එළවළු වවන්නන් සමඟ සටන් කරන්නට තරඟ කරන්නට ඒ සාමාන්‍ය එළවළු වවන්නන්ට පුළුවන් කමක් නැහැ. ධනපති කොම්පැණිකාරයන් සමඟ තරඟයට කුඹුරු කරන්නට සාමාන්‍ය ගොවියන්ට කිසි සේත් පුළුවන්කමක් නැහැ. කොම්පැණිකාරයන් කුඹුරු කරන්නේ ට්‍රැක්ටර් ආදී යන්ත්‍ර සූත්‍ර උපයෝගී කර ගෙනයි. සාමාන්‍ය ගොවියා අතින් පොළොව කොටන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

අතින් කොටන්නට බෑ, උදැල්ලක් ඕනෑ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

එහෙම නම් උදැල්ලට මිටකුත් තිබෙන්නට ඕනෑ. මන්ත්‍රීවරයෙක් හැටියට නොවෙයි මනුෂ්‍යයෙක් හැටියටවත් ඔයිට වඩා මොලයක් තිබෙන්නට ඕනෑ.

ඒ ධනපති කොම්පැණිකාරයන් ආණ්ඩුවේ නොයෙකුත් ආධාර ඇතිව ට්‍රැක්ටර් ආදී යන්ත්‍ර සූත්‍ර උපයෝගී කරගෙන අක්කර 57.500 ක් වවනවා. උදැල්ලේ අලවංගුවේ මිල අඩු කළාය කියා ඒ අය සමග තරඟයට වවන්නට සාමාන්‍ය දුප්පත් ගොවියන්ට පුළුවන්කමක් තිබෙනවාද? කොහෙත්ම නැහැ. එයින් සිදු වන්නේ සාමාන්‍ය ගොවියා කබලෙන් ළිපට වැටීමක්. එයින් සිද්ධ වන්නේ, ගම්බද කෘෂිකර්මය තිබුණාට වඩා පහළ වැටීමයි. ඒ නිසා තමයි, වෙනත් උපක්‍රමයක් යෙදුවේ.

ගම්බද පාසල්වල ඉගෙන ගන්න ළමයින්ගේ අධ්‍යාපනය හත් වැන්නෙන් නවත්වන්නට ඕනෑ. ඒ අයට කියනවා, " උඹලා කොටපල්ලා " කියා. කුරුඳුවත්තේ උදවියට පමණක් එස්.එස්.සී. දක්වා ඉහළට ඉගෙන ගන්නට පාසල් ඇති කරන්නට යනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමා මේ දිනවල ලෙඩිනුයි ඉන්නේ. ඒ ගැන මා කණගාටු වෙනවා. හොඳ මොලයක් ඇතිව හැකිතාක් ඉක්මණින් සනීප වී එන්නට එතුමාට ලැබේවාය කියා මා ප්‍රාර්ථනය කරනවා. ඒ අනුව නැවත වරක් පන්තිභේදය රෝපණය කරන්නට හදනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමා කීවා " දවසකට රුපියල් 85 ක් දී ඕනෑ කෙනකුට බෙන්තොට, තික්කඩුව, ආදී තානායම් පාවිච්චි කරන්නට පුළුවන් " කියා. අපට පුළුවන්ද, දවසකට රුපියල් 85 ක් ගෙවන්නට? අපට බැහැ. ධනපතියන්ට නම් පුළුවන්. තමුන්නාන්සේලා හැම දෙයක්ම කරන්නේ ධනපතියන්ගේ ප්‍රයෝජනය සඳහායි. ඒකයි, අප මේ පෙන්වා දෙන්නේ.

තමුන්නාන්සේලා මේ රටේ රැකිරක්ෂා සංවර්ධනය කර තිබෙනවාද? තමුන්නාන්සේලාගේ පොත්වලින්ම—රැකිරක්ෂා කාර්යාලවලින් ලබා ගත් සංඛ්‍යා අනුව—මම පෙන්වා දෙන්නම්, 1964 සිට රැකිරක්ෂා පිළිබඳ තත්ත්වය. 1964 රැකිරක්ෂා නැතියවුන්ගේ සංඛ්‍යාව 1,65,456 යි. 1965 දී 1,99,655 යි. 1966 දී 2,38,901 යි. 1967 ජනවාරියේදී 2,40,722 යි. 1967 පෙබරවාරියේදී 2,44,389 යි. 1967 මාර්තුවේදී 2,46,818 යි. රැකියා සම්බන්ධයෙන් මොකක්ද වෙලා තිබෙන්නේ? හැම දාම රැකියා නැතියවුන්ගේ ගණන නම් සංවර්ධනය වෙනවා. ඔකයි, තත්ත්වය. තේ, පොල්, රබර් නිෂ්පාදනය අඩු වී තිබෙන්නේ එහෙමයි. රැකියා නැතියවුන්ගේ සංඛ්‍යාව වැඩි වී තිබෙන්නේ මෙහෙමයි. මේ අනුව හැම අතකින්ම රට ප්‍රපාතය කරා යන තත්ත්වයක් උද්ගත වී තිබෙනවා.

වැඩ වර්ජන තත්ත්වය කොහොමද? තමුන්නාන්සේලා හදිසි තත්ත්වයක් දමාගෙන අවුරුදු දෙකක්ම ආණ්ඩු කළා. තුවක්කුවේ බලය පෙන්නාගෙනයි, තවමත් තමුන්නාන්සේලා ආණ්ඩු කරන්නේ. රජයට විරුද්ධව කථා කළොත් ගෙදර යන්නට වෙනවා. එහෙම නැත්නම් වෙනත් දඬුවම් දෙනවා. මිනිසුන් රැකියාවලින් නෙරපනවා; ඔවුන්ට නොයෙකුත් තාඩන පීඩන කරනවා. කම්කරුවන් දිහා බැලුවාම, රාජ්‍ය අංශය දිහා බැලුවාම තමුන්නාන්සේලා ඉතාමත් නරක ස්වාමිවරුන් හැටියටයි හඳුන්වන්නට සිදු වී තිබෙන්නේ. ඒ වුණත් මොකක්ද සිදු වී තිබෙන්නෙ? වැඩ වර්ජන නිසා අපතේ ගිය මිනිස් ශ්‍රමය කොපමණද? තමුන්නාන්සේලාගේ තුවක්කු, බයිනේත්තු යටතේ පවා කෙරුණු වැඩ වර්ජන නිසා අපතේ ගිය මිනිස් ශ්‍රමය මම කියන්නම්. 1963 දී 8,39,583 යි. 1964 දී 8,25,183 යි. 1965 දී 5,71,211 යි. 1966 දී 41,51,615 යි. තමුන්නාන්සේලා තුවක්කු මානාගෙන සිටියදීත් අපතේ ගිය මිනිස් ශක්තිය 41, 51,615 යි. වැවිලි අංශයෙහි ඒ තරම් මිනිස් ශක්තියක් අපතේ ගියා. මේ අනුව පෙනී යන්නේ තමුන්නාන්සේලා තුවක්කු මානාගෙන දරදඬු පාලනයක් ගෙන ගියත් වැඩ වර්ජන නවත්වා මිනිස් ශක්තිය ආරක්ෂා කර ගන්නට පුළුවන්කමක් ලැබී නැති බවයි. කරුණු මෙසේ තිබියදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. බී. එම්. හේරත් මයා.]

බොරු අයවැය ලේඛන ඉදිරිපත් කොට මහ ජනයා මුළා කිරීමට දරන ප්‍රයත්නය ගැන අප කණගාටු වෙනවා. අවංකභාවයේ නාමයෙන් මේ වගේ බොරු ප්‍රකාශ ඉදිරිපත් නොකරන ලෙස ඉල්ලා සිටිනවා. මේ රටේ ආර්ථික තත්ත්වය පහළට ඇද දමා තිබෙන්නේ මේ ආණ්ඩුව මිස කලින් පැවති ආණ්ඩුව නොවෙයි. එදා සිටි ඇමතිවරුන් මේ රට විනාශ කළේ නැහැ. එහෙත් දැන් සිටින ඇමතිවරුන් රට විනාශය කරා ගෙන යනවා. ආණ්ඩු පක්ෂයේ පිටුපස ආසන වල සිටින ගරු මන්ත්‍රීවරුනට මා දොස් කියන්නේ නැහැ. මේ ඇමති මණ්ඩලය ගෙන යන බොරු ප්‍රචාරවලට රැවටී මේ රට දිනෙන් දින පහළට ඇද දමන්නට එපා යයි මා ඒ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව කර්මාන්ත ගැන ලොකු කයිවාරු වක් ගැසුවා. එදා අප මොකවත් කෙළේ නැතිලු. එදා 1964 දී අපේ ආණ්ඩුව වැටෙන විට තේ, පොල්, රබර් සහ වී යන කෘෂිකාර්මික නිෂ්පාදනවල තත්ත්වය කෙබඳු දැයි කාටත් පැහැදිලියි. ඒ හැම වර්ගයකම නිෂ්පාදන අද එදාට වඩා පහත වැටිලා. ඒ ගොවිතැන ගැන අද ඇති තත්ත්වයයි. දැන් මේ ආණ්ඩුව කර්මාන්ත ගැන කථා කරනවා. කවුද මේ කර්මාන්ත ඇති කෙළේ? අද ආණ්ඩුවේ සිටින උදවිය එදා විරුද්ධ පාර්ශ්වයට වී සිටියදී කීවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවෙහි කර්මාන්ත ප්‍රතිපත්තියෙහි ඇති වරද ගැනයි. කර්මාන්ත ඇමතිතුමත් මුදල් ඇමතිතුමාත් එදා ඒ ගැන ලොකුවට කථා කළා. එහෙත් අද මේ ආණ්ඩුව කියන්නේ ඊට වෙනස් දෙයක් නේද? අද නම් මේ ගොල්ලන් කර්මාන්ත ගැන විශ්වාසයක් ඇති කරගෙන තිබෙනවා. රටේ සංවර්ධනය සඳහා රුපියල් 3 කෝටි 50 ලක්ෂයක් රජයේ සංස්ථාවලින් ලබා ගන්නා බව කියන්නටත්, පැට්‍රල් සඳහා අය කරන බද්ද ඛනිජ තෙල් සංස්ථාවෙන් මිස මහ ජනයාගෙන් අය නොකරන බව කියන්නටත් අද මේ ආණ්ඩුවට පුළුවන් වී තිබෙන්නේ එදා අප කළ වැඩ නිසා නොවේදැයි හඬ නගා ප්‍රශ්න කිරීමට කැමතියි. මේ ආණ්ඩුව බලයට පත් වුණායින් පසුව අලුතෙන් ඇති කරන ලද එකම කර්මාන්තයක් ගැනවත් කියන්නට මේ ආණ්ඩුවේ ඇත්තනට පුළුවන්ද? මෙතෙක් අලුතෙන් පටන් ගත් කර්මාන්තය කුමක්දැයි ඕනෑම ඇමතිවරයකුගෙන් අසා දැන ගන්නට අප සතුටුයි. ඇත්ත නම් අද වනතුරු එකම කර්මාන්තයක්වත් අලුතෙන් පටන් ගෙන නොතිබීමයි. එදා අප ඇති කළ කර්මාන්ත වලින් තමුන්නාන්සේලා අද කොපමණ ලාභයක් ලබනවාද? 1964 දී කර්මාන්ත අංශයෙන් ලැබූ ලාභය රුපියල් 73,45,461 යි. 1965 දී ලාභය රුපියල් 87,24,998 යි. හැබැයි ,එදා නම් කීවේ අපේ කර්මාන්ත ප්‍රතිපත්තිය වැරදි බවයි. කර්මාන්ත නියම විධියට සකස් කර ගැනීමට අවුරුදු 2 ක් ගත වුණාලු. හොඳයි, 1964 දී ලැබූ ලාභය රුපියල් 73,45,461 ක්ද, 1965 දී ලැබූ ලාභය රුපියල් 87,24,998 ක්ද වන නමුත් 1966 දී එම ලාභ මුදල රුපියල් 71,44,086 දක්වා අඩු වී තිබෙනවා. 1965 දී ලක්ෂ 87 ක්ව තිබී 1966 දී ලක්ෂ 71 ට බැස්සේ මන්ද? දූෂණ නැති කිරීමේ ප්‍රතිඵලයද මේ? දූෂණ නැති කරන විට ලාභය අඩු වී තිබෙනවා වගෙයි. මේ අනුව පෙනී යන්නේ කෘෂිකර්මය අතින් පමණක් නොව කර්මාන්ත අතින්ද දැන් පිරිහීමක් තිබෙන බව නොවෙයිද? නිකම් බොරුවට කයිවාරු නොගසන්නැයි මා කොපමණවත් කියන්නේ ඔය නිසා තමයි.

වෙන් වශයෙන් කර්මාන්ත එකක් දෙකක් ගැන මා මතක් කරන්නට කැමතියි. ප්‍රථම කොටම ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය ගැන කල්පනා කර බලමු. මෙම සංයුක්ත මණ්ඩලය පිහිටුවූයේ 1959 දීයි. ඊට කලින් සිමෙන්ති කර්මාන්ත ශාලාවක් තිබුණත් සිමෙන්ති සංයුක්ත මණ්ඩලය පටන් ගත්තේ ඒ අවුරුද්දේදීයි. 1963 අවුරුද්දේදී සිමෙන්ති නිෂ්පාදනයේ ප්‍රමාණය ටොන් 76,764 යි. 1964 දී ටොන් 79,508 යි. 1965 දී ටොන් 84,000 යි. 1966 දී ටොන් 81,572 යි. නිෂ්පාදනය ක්‍රමයෙන් වැඩි වෙමින් ගොස් 1966 දී හදිසියේම පහළ බැස්සේ ඇයි? හැබැයි, මේ ආණ්ඩුවේ කයිවාරුවල නම් කෙළවරක් නැහැ. 1965 දී නිෂ්පාදනය කළ සිමෙන්ති ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් 1966 දී නිෂ්පාදනය කරන්නට හේතුව මොකක්ද? සංවර්ධනයක් තිබෙනවා යයි ගසන මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කයිවාරුවෙහි තේරුම මොකක්ද? කෝ උද්ධමනයක් ? මට නම් උද්ධමනයක් පෙනෙන්නට නැහැ. මේ රටේ නම් එහෙම එකක් නැහැ. ගරු මුදල් ඇමතිතුමා උද්ධමනය වෙලා ද කියන්න මා දන්නේ නැහැ. වයසක උදවියත් සමහර අවස්ථා වල තිරිහන් වී ඇති බව අපි දැක තිබෙනවා. නමුත් මෙතැන නිපදවීම නම් පහත බැස තිබෙනව බව පෙනෙනවා ; නිෂ්පාදනය අඩු වී තිබෙන බව පෙනෙනවා ; ලාභය අඩු වී තිබෙන බව පෙනෙනවා.

1964දී සිමෙන්ති සංයුක්ත මණ්ඩලයේ ලාබය රුපියල් 61,36,198යි. 1966 දී ලාබය රුපියල් 25,00,000යි. රුපියල් 61,36,198 සිට රුපියල් 25,00,000 දක්වා පහත බැස තිබෙනවා. එතැනින් පෙනෙනවා ලාබය කොතරම් පහත බැස තිබෙනවාද යන්න. ඒ අනුව සංවර්ධනයක් සිදු වී තිබෙනවාය කියන්ට පුළුවන්ද? පේසකර්ම සංස්ථාවත් ඒ ආකාරයි. 1958 ජනවාරි මාසයේ දීයි එම සංස්ථාව පටන් ගත්තේ. 1966 වන විට එහි නිෂ්පාදනය බොහෝ දුරට අඩු වෙලා. 1965දී එහි නිෂ්පාදනය රාත්තල් 24,12,227යි. 1966 නිෂ්පාදනය රාත්තල් 23,56,964යි. ඒ අනුව නිෂ්පාදනය රාත්තල් 55,263කින් පහත බැස තිබෙනවා. පේසකර්ම සංස්ථාවේ වැඩ කරන්නේ බොහොම දක්ෂ පුද්ගලයෙක් බව කියනවා. පරාජිත අපේක්ෂකයෙක් තමයි, එතන වැඩ කරන්නේ. නමුත් නිෂ්පාදනය හා ලාබය අඩුයි. 1964 දී පේසකර්ම සංස්ථාවේ ලාබය රුපියල් 15,00,000යි. 1965දී ලාබය රුපියල් 16,00,000යි. 1966දී ලාබය රුපියල් 14,00,000යි. ඒ අනුව බලන විට ආදායම ලක්ෂ 2කින් අඩු වී තිබෙන බව පෙනී යනවා. එතකොට සංවර්ධනයක් තිබෙනවාය කියන්ට පුළුවන්ද? මේ ආදායමවත් ලබන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කර්මාන්ත ප්‍රතිපත්තිය නිසා නොවේද? තමුන්නාන්සේලා කර තිබෙන්නේ සෑම අතින්ම ආදායම පහතට දැමීමයි. එය දියුණු කර නැහැ. තමුන්නාන්සේලා හැම දෙයක්ම විනාශ කර දමා තිබෙනවා. නමුත් කියන්නේ අප විසින් රට විනාශ කර තිබෙන බවයි. එවැනි අසත්‍ය බොරු ප්‍රචාර කරන්ට එපා. කඩදාසි සංයුක්ත මණ්ඩලයේ ලාබය නම් වැඩි වී තිබෙනවා. එහි නිෂ්පාදනය වැඩි වී තිබෙනවා. අපි එය ඇත්තක් හැටියට පිළිගනිමු. වැඩි වී තිබෙන එක වැඩි වුණාය කියන අතරම අඩු වී තිබෙන දේ අඩු වී තිබෙනවාය කියන්ට ඕනෑ. මෙම වාර්තාවේ සඳහන් වන සෑම දෙයක්ම සත්‍ය දෙයක් වශයෙන් පිළිගන්ට බැහැ. සිමෙන්ති නිෂ්පාදනයවත් රෙදි පිළි නිෂ්පාදනයවත් වැඩි වී නැහැ. 1965දී කඩදාසි ටොන් 6,696ක් නිෂ්පාදනය කර තිබෙනවා. 1966 කඩදාසි ටොන් 9,081ක් නිෂ්පාදනය කර තිබෙනවා. ඒ අනුව බලන විට එහි සැලකියයුතු දියුණුවක් පෙනෙනවා. අපි එම තත්ත්වය පිළිගන්නවා.

රසායන ද්‍රව්‍ය සමායතනය ගැන ඊළඟට කියා තිබෙනවා. 1966දී එහි ලාභය රුපියල් 1,90,000යි. යම් කිසි කර්මාන්තයක් ආරම්භ කළ හැටියේම එමගින් ආදායම් ලබන්ට අමාරුයි. ඒවායින් සැහෙන ආදායමක් ලබාගන්ට යම්කිසි කාලයක් ගත වෙනවා. එයින් පසු තමයි, තත්ත්වයකට එන්නේ. අප ආරම්භ කරන ලද කර්මාන්තවලින් තමුන්නාන්සේලා අද ආදායම් ලබන නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්ති නිසා රටේ ආදායම පහත බැස තිබෙනවා යැයි කියනවා. ඒ අන්දමට බොරු කියන්ට එපා. අප ආරම්භ කළ කර්මාන්ත නිසායි, තමුන්නාන්සේලා මේ තරම් වත් කටයුතු කරගෙන යන්නේ. අප ආරම්භ කළ සංයුක්ත මණ්ඩල ටිකවත් නොතිබුණා නම් තමුන්නාන්සේලාට වැටෙන්ට සිදු වන්නේ ලොකු අමාරුවකටයි. දුප්පතාගේ බඩට ගසමින් ධනපතීන් රකිනවා. දැන් දුප්පතා ගෙනයන්ට සිදු වී තිබෙන්නේ කසාය වච්චෝරු කඩයටයි. මිරිස් අවුන්ස 3යි; සුදුරු අවුන්ස ½ යි; පරිප්පු දෙකලං මංචාඩි අටයි; හාල්සේරුවයි කියන මේ ඔක්කෝම අරගෙන පත අට එකට සිඳ කසාය බවට පත් කර හැම වේලකටම බින්දු දෙක බැගින් කන්ට නේද, අද සිදු වී තිබෙන්නේ? එසේ නැතුව මේ ලැබෙන ප්‍රමාණයෙන් මාසයක් කන්නේ කෙසේද? එහෙම නොවේනම් මෙන්න මේ විධියටයි මේවා කෑමට ගන්නේ කියා ආණ්ඩුවේ ඕනෑම මන්ත්‍රීවරයකුට නැගිට ප්‍රකාශ කරන්නැයි මා ප්‍රකාශ කර සිටිනවා. එතකොට පුළුවනි මේ රටේ මහජනයාට ඒ ගැන ඉගෙන ගන්ට. ඒ විධියට මහජනතාවගේ බඩට ගසමින්, අප කළ දේවලින් ආදායම් උපද්දමින් තමුන්නාන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඊ. බී. එම්. හේරත් මයා.]

සේලා කර තිබෙන්නේ ධනපතීන්ට ශක්තිය හා බලය ලබා දීමයි. ධනපතීන් ආරක්ෂා කිරීමටයි, තමුන්නාන්සේලා සම්පූර්ණ ශක්තිය යොදවා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව හුඟක් දේ කියන්ට තිබෙන නමුත් මගේ කථාව කෙටි කරන්ට මා කල්පනා කරනවා. අපි තුනී ලැලි සංයුක්ත මණ්ඩලය ගැන සිතා බලමු. එහි 1966 වර්ෂයේ අයවැය වාර්තාව තවම ඉදිරිපත් කර නැහැ. එය භාරව සිටින්නේ බොහොම හොඳ ඇමතිවරයෙක්. නමුත් 1966 අය වැය ඉදිරිපත් කරන්ට ශක්තියක් ලැබී නැහැ. අපේ කාලෙ එහෙම ඉදිරිපත් කරන්ට බැරිවුණා නම් කණ්නාඩිය පොළොවේ ගසා එතුමා මෙතැන ආවේස වෙනවා. අද එසේ ආවේස වෙනවා තබා අපේ කථා අසාගෙන සිටින්නේවත් නැහැ. ඩී. අයි. සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය ගැන බොහොම ලොකුවට කයිවාරු ගහලා තිබුනා. අද මොකක්ද සිදු වී තිබෙන්නෙ? 1965 ආදායම අඩු වෙලා. අපේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ නිසයි, තමුන්නාන්සේලාට හැම කයිවාරුවක්ම ගහන්නට පුළුවන් වී තිබෙන්නෙ. ලංකා ඛනිජ වැලි සංස්ථාවේ 1966 ට අයවැය ලේඛනයක් නැහැ. ලංකා පිඟන් බඩු සංස්ථාව ගැන තමුන්නාන්සේලා බොහොම ලොකුවට කයිවාරු ගහලා තිබුනා. 1964දී පිඟන් බඩු ටොන් 888 ක් නිෂ්පාදනය කළා. එහෙත් තමුන්නාන්සේලා එය සකස් කළාට පසු 1966දී පිඟන් බඩු ටොන් 813යි, නිෂ්පාදනය කර තිබෙන්නේ. ටොන් 75ක් අඩු වෙලා. මීගමුවේ මන්ත්‍රීතුමා (ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.) දැන් මොනවද කියන්නෙ? තමුන්නාන්සේලාගේ දක්ෂතාව උඩද, මේ නිෂ්පාදනය අඩු වෙලා තියෙන්නෙ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීගමුවේ පිඟන් කර්මාන්තශාලාව ගැන තමුන්නාන්සෙත් දන්නවා. අද එතැනත් නිෂ්පාදනය අඩුයි. මේ ආණ්ඩුවට අද මේ ලාභයවත් ලබා ගන්නට පුළුවන් වී තිබෙන්නේ අපේ ආණ්ඩුව පිඟන් කර්මාන්තශාලාව ඇති කර එය එක්තරා තත්ත්වයකට දියුණු කළ නිසයි. බොරලැස්ගමුවේ දෙවැනි කර්මාන්තශාලාව ගැන කිව්වා. ඒක විවෘත කළාලු. ටයර් කම්හල විවෘත කළාලු. වානේ කම්හල විවෘත කළාලු. ඔවා විවෘත කරන අවස්ථාවලදී, අවුරුදු 4 කට, 5 කට පෙර මේවා ආරම්භ කෙළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවය කියා තමුන්නාන්සේලා එක වචනයක්වත් කිව්ව ද? කෙළෙහිගුණ සලකන සිංහල මනුෂ්‍යයන් හැටියට තමුන්නාන්සේලාට ඒ ගැන එක වචනයක් කියන්න බැරි ද? නැහැ, එහෙම කිව්වෙ නැහැ. මේවා අපේ වැඩ, මේවා අපේ වැඩ කියායි කියන්නෙ. ඇයි එහෙම බොරු කියන්නෙ? එහෙම බොරු කියා මහජනයා රවටන්නට තමුන්නාන්සේලාට පුළුවන් ද? බැහැ, මහජනයා රවටන්නට තමුන්නාන්සේලාට බැහැ.

පේසකම් සංස්ථාව ගැන කිව්වා. පූගොඩ දෙවැනි පේසකම් මධ්‍යස්ථානයට මොකද වුනේ? ඒක සම්පූර්ණයෙන්ම නැති කළා. ඒ ගැන සෑහෙන මූලික වියදමක් දරා තිබෙනවා. අප ආරම්භ කළ කර්මාන්තවලින් අද ආණ්ඩුව ගෙන යන තමුන්නාන්සේලාට ඒ කර්මාන්ත ආරම්භ කළ උදවියට ස්තුති කර වචනයක් කියන්නට යුතුකමක් තියෙනවා. එහෙත් ඒ යුතුකම තමුන්නාන්සේලාගෙන් ඉටු වුණේ නැහැ. ඩී. එස්. සේනානායක අගමැතිතුමා කළ හොඳ වැඩ හොඳ බව යම් යම් අවස්ථාවල අප කියා තිබෙනවා. දැන් සිටින අගමැතිතුමාත් යම් කිසි හොඳ වැඩක් කළොත් එය හොඳ වැඩක් හැටියට පිළිගන්නට අපි ලැස්තියි. එහෙත් තමුන්නාන්සේලාට එහෙම ආත්ම ශක්තියක් නැහැ. කොයි තරම් හොඳ වැඩක් විරුද්ධ පක්ෂය කළත් ඒක හොඳය කියන්නට ආත්ම ශක්තියක් තමුන්නාන්සේලාට නැහැ. හැමදම හැම දෙයක් ම නරකය කියනවා. ඒකයි, තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය.

වානේ සංස්ථාව දැනටත් ලංකාවට විශාල සේවයක් කරනවා. ටයර් සංස්ථාව කොහොම ද? ඒක රතු නේ ද? ඒකෙන් සල්ලි ගැනීම හොඳ ද? ලෝහ භාණ්ඩ සංයුක්ත මණ්ඩලය, ජාතික ලුණු සංයුක්ත මණ්ඩලය, කාර්මික ජනපද සංයුක්ත මණ්ඩලය, ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් සංස්ථාව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, වරාය (නැව් බඩු) සංයුක්ත මණ්ඩලය, ලංකා ගමනාගමන මණ්ඩලය ඇති කළේ කව් ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමුන්නාන්සේලා අද හොරෙන් හෝ මේවාට මිනිසුන් ඇතුළු කරන්නෙ මේවා තියෙන නිසයි.

මේ සංස්ථාවලින් විශාල ප්‍රයෝජනයක් ලබා ගැනීමට අද මේ ආණ්ඩුවට පුළුවන් වී තිබෙන්නේ, මේ රටේ රැකීරක්ෂා නැති විශාල සංඛ්‍යාවකට මේ සංස්ථාවල රැකී රක්ෂා සැපයීමට පුළුවන් වී තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමාජවාදී කාර්මික ප්‍රතිපත්තිය උඩ නම්, මේ සංස්ථා ඇති කිරීමේ සම්පූර්ණ ගෞරවය හිමි වන්නේ මේ රජයට නොව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජයට බව මා ප්‍රකාශ කරන්නට සතුටුයි.

ගරු රාජ්‍ය ඇමතිතුමා අද උදේ කීවා වගේ මේවා පුද්ගලයන් සතු කරන්නට තමුන්නාන්සේලා අදහස් කර ඇති. සතොසේ රෙදි වෙළඳාම, කරවල වෙළඳාම දැන් පුද්ගලයන් සතු කර තිබෙනවා. ඒ විධියට තවත් දේවල් පුද්ගලයන් සතු කරන්නට තමුන්නාන්සේලා අදහස් කර ඇති. ඒ ඇයි ? තමුන්නාන්සේලාට රකින්නට ඕනෑ මේ රටේ බඩගින්නේ සිටින පුද්ගලයන් නොවෙයි, මේ රටේ රැකීරක්ෂා නැතිව සිටින පුද්ගලයන් නොවෙයි, මේ රටේ සිටින ධනපති පන්තිය පමණයි.

ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේලා කරන්නේ ඒකයි. ඒ නිසා තමයි තමුන්නාන්සේලා විදේශ විනිමය වැය කර ලොරි, ජීප් සහ ට්‍රැක්ටර් ආදිය ගෙන්වන්නේ. මේ ආණ්ඩුව දූෂණයෙන් දූෂණයට පත්වෙලා තිබෙනවා. ඒ කාරණය ඔප්පු කිරීමට උදාහරණයක් ඉදිරිපත් කරන්නම්. අද මේ රටේ හැම තැනම පාහේ ප්‍රසිද්ධ කථාවක් තිබෙනවා. රුපියල් පන් දාහක් වියදම් කළොත් අද ඕනෑම කෙනෙකුට බෙන්ස් ලොරියක් වුවත් ගෙන්වා ගන්නට ඉඩ ලැබෙන බව අද කාටත් අහන්නට ලැබෙන ප්‍රසිද්ධ කථාවක්. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීන් අතර ආණ්ඩු පක්ෂයෙන් ඉල්ලා අස්වීමේ ලියුම් පවා ඉදිරිපත් කර, ඒ මගින් බලය පා, ලොරි ගත් අය ඉන්නවා. මා ඒ අයගේ නම් කියන්නේ නැහැ. හැම එකක්ම එහෙමයි කෙරෙන්නේ. රක්ෂාවකට කෙනෙකු ගන්නා විට ඔහුගේ සුදුසුකම් ගැන බලන්නේ නැහැ. පස්සා ඇත්තේ දොරෙන් තමයි ඔහු ඇතුළු කර ගන්නේ. පරාජිත අපේක්ෂකයෙකු අල්ලා ගත්තොත් වැඩේ හරි.

ගරු අගමැතිතුමාට ප්‍රවෘත්ති ලේකම් කෙනෙකු පත් කරන්නට මුදල් වෙන් කර තිබෙනවා. අයවැය ලේඛනයේ ඒ සඳහා අවුරුද්දකට රුපියල් දොළොස් දාහක් වෙන් කර තිබෙනවා. ඒ කියන්නේ මාසයකට රුපියල් දාහක් ඒ තනතුර වෙනුවෙන් වෙන් කර තිබෙන බවයි. ඒ තනතුරට පරාජිත අපේක්ෂකයෙකු පත් කර ගන්නට යන බවත් දැන ගන්නට ලැබී තිබෙනවා. ඒකයි ආරංචිය. මැතිවරණයෙන් දිනා මන්ත්‍රීවරයෙකු වෙනවාට වඩා හොඳයි පරාජයට පත්වීම. මන්ත්‍රීවරයෙකුට ලැබෙන්නේ රුපියල් හයසියයක් පමණයි. එහෙත් පරාජිතයාට රුපියල් දාහක වැටුපක් ලැබෙන රක්ෂාවක් ලබා දෙනවා. මේවා ගැන වැඩි දුර කථා කරන්නට ගියොත් ආණ්ඩුවට වැඩි වැඩියෙන් රිදෙනවා. පරාජිත ඡන්දාපේක්ෂකයන් රුපියල් දාහේ මාසික වේතන ලැබෙන රක්ෂාවලට නොවෙයි, රුපියල් 1,500ක් ලැබෙන රක්ෂාවලටත් පත් කර තිබෙනවා. ඇතැම් පුද්ගලයන් මාසයකට රුපියල් තුන්දහක් ලැබෙන තැන්වලටත් පත් වී සිටිනවා. මේ තරම් දූෂණයෙන් පිරීගිය ආණ්ඩුවක් ගැන අප අසා නැහැ. වරාය සංයුක්ත මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබ සිටින්නේ කවුරුද ? ඔහු පාත්තර හොරකම් කළ කෙනෙකැයි දෙහිඕවිට ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. වීරසේකර මයා.) මේ ගරු සභාවේදී කියා තිබෙනවා. ඒ පැමිණිල්ල සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා ක්‍රියාත්මක වෙනවායයි එදා ප්‍රකාශ කළා. එහෙත් එතුමා ඒ ගැන ක්‍රියාත්මක වූ බවක් පෙනේද ? දැන් ගරු අගමැතිතුමාට ක්‍රියාත්මක වන්නේ නැතුවා වෙන්නට ඇති. දැන් උද්ධමනය නැවතිලා ඇති. මෙහෙමද වැඩ කරන්නේ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

දුම්කොළ වගාව ගැන මේ ආණ්ඩුව කර තිබෙන්නේ මොනවාද? මේ ආණ්ඩුවට ලැබෙන ලොකුම බද්ද දුම්කොළවලින් ලැබෙනවා. ආණ්ඩුවට ලොකුම ආදායම දුම්කොළවලින් ලැබෙනවා. ඇස්තමේන්තු වල හැටියට දුම්කොළ බද්දෙන් ලැබෙන ආදායම රුපියල් පහළොස් කෝටියයි. ගරු මුදල් ඇමතිතුමාගේ අලුත් යෝජනාවලින් එය තවත් වැඩි කර තිබෙනවා. දැන් රුපියල් දහසය කෝටි පණස් ලක්ෂයක් දුම්කොළවලින් ලබා ගැනීමට බලාපොරොත්තු වෙනවා. එහෙත් ඒවා වවන ගොවියාට දී තිබෙන සහනය කුමක්ද? පඩිපාලක සභාවකින් කළ සම්මතයට අනුව කම්කරු ගැහැණියකට දවසකට රුපියල් තුනක පඩියක් ගෙවිය යුතුයි. අද වනතුරු එය ක්‍රියාවේ යොදා තිබෙනවාද? දවසකට රුපියල් දෙකයි ගෙවන්නේ. සමහර තැන් වල ගෙවන්නේ රුපියලකුත් ශත පණහක් පමණයි. ගොවියාට රාත්තලකට රුපියල් දෙකකුත් ශත පණහකට වඩා ලැබෙන්නෙ නැහැ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පොරොන්දු වුණා පෝරණුවලින් රාත්තල් දාහකට වඩා ගන්නේ නැති බවට. වැඩි මත් සීමා කළා. ලංකා දුම්කොළ කර්මාන්ත ආයතනය ගැන චෝදනාවක් කරන්නට තිබෙනවා. රුපියල් 25,000 ක් සමිතියකට ගෙවන්නට තිබෙනවා. සල්ලි ගෙවන්නේ නැහැ. ගොවියා ආරක්ෂා කිරීමට කිසිම උත්සාහයක් ගන්නේ නැහැ. තමුන්නාන් සේලාගේ ආණ්ඩුව බලයට පත් වන්නට පෙර වේදිකාවල කථා කළ අපේක්ෂකයින් —එක්සත් ජාතික පක්ෂයේ උදවිය— කිව්වේ කොහොමද? දුම්කොළ වෙනුවෙන් අය කරන බද්ද රුපියලකින් අඩු කර ඒ මුදල ගොවියාට ලබා දෙනවාය කිව්වා. රුපියලක් වැඩිපුර ගෙවනවාය කිව්වත් ඒ ගැන යමක් මෙතෙක් කර තිබෙනවාද? රුපියල් 28.50 ගේ ගණන දූන් රුපියල් 33 කර තිබෙනවා. ගොවියා හිටපු තැනමයි. ආණ්ඩුව අවුරුද්දකට රුපියල් දහසය කෝටි පණස් ලක්ෂයක් අය කර ගන්නවා. ආදායම උපයන ගොවි ජනතාව ආරක්ෂා කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීම ආණ්ඩුවක යුතුකමක් නොවෙයිද? ගොවියාටත් කම්කරුවාටත් සහන යක් ලැබෙන පරිදි වැඩක් කර නැහැ. ආණ්ඩුව පමණයි රුපියල් තිස්තුනක ආදායමක් ලබා ගන්නේ. එය ඉතා විශාල අසාධාරණයක් මෙන්ම අයුක්තියක්.

සුළු ගණනකින් හෝ තේ මිල බැස්සාම මේ ආණ්ඩුව ධනපති පන්තියට සහනයක් ලබා දෙන්නට අතිරේක වැය ශීර්ෂ ඉදිරිපත් කර මුදල් ලබා ගන්නවා. දුම්කොළ වගා කරන ගොවියා අමාරුවේ වැටී සිටින අවස්ථාවේ ඒ ගැන යමක් කරන්නේ නැහැ. රුපියල් කෝටි දහසයමාරක් ලැබෙන දුම්කොළ වගාවේ නිරත ගොවියාට සහනයක් තමුන්නාන්සේලාගෙන් ලැබී නැහැ. මේ රජය ඉතාම අන්ත දූෂිත ලෙස මේ රටේ මහජනයා පෙළමින්, මහජනතාව ගේ ආහාර හා රැකීරක්ෂා ප්‍රශ්න පිරිමහන්නට බැරි තරමටම දිනෙන් දිනම උග්‍ර තත්ත්වයට පත්වන්නට ඉඩ හැරියා. කෘෂිකර්මයත්, කර්මාන්තත්, තේ හා පොල් නිෂ්පාදනයත් තිබුණු තැනින් පහළට දමා මේ රටේ සාමාන්‍ය ජනතාව අමාරුවට පත් කළා. ඒ අතරම මේ රටේ සිටින ධන පතීනට සුඛෝපභෝගී ජීවිත ගත කරන්නට වුවමනා කරන යාන වාහන, හෝටල්, සම්බාහන මණ්ඩල ආදිය තනමින් ධනපතීනට වුවමනා කරන ව්‍යාපාර පමණක් පවත්වා ගෙන යනවා. ඒ නිසා මේ රටේ සිටින සියයට 99 ක් පමණ වූ දුප්පත් ජනතාවගේ හදවත් තුළින් පැනනගින උණුසුම් ලේ ධාරාව මගින් මේ ධනපති රජය සුණු විසුණු වේවා කියා පතමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

 අ. භා. 5.28

**එම්. සිවසිතම්පරම් මයා. (උඩුප්පිඩ්ඩි)**
*(திரு. எம். சிவசிதம்பரம்—உடுப்பிட்டி)*
(Mr. M. Sivasithamparam—Uduppiddi)

Mr. Deputy Speaker, I have the doubtful pleasure of following the hon. Member for Walapane (Mr. T. B. M. Herath). The hon. Member quoted a large number of figures. I only wish to tell him that figures, whether of the numerical variety or the human variety, must be most carefully dealt with. The less you know of them, the more dangerous it is to handle them.

The hon. Member referred to the decline in the profits of the Cement Corporation. He has apparently forgotten that the Cement Corporation, during the last two years, has undertaken the setting up of a clinker grinding factory in Galle and another cement factory in Puttalam, for which, undoubtedly, preliminary expenditure had to be borne by the Cement Corporation. Therefore, one is not surprised that the corporation's profits have fallen.

The hon. Member for Walapane also made some wild charges about bribery. It is generally advisable for those who live in glass houses not to throw stones at others.

We do not claim that this budget is in any way an ideal budget or a budget that has found solutions for all the economic problems that are facing this country, but we do claim that by this budget, in spite of the many hardships, the many difficulties that any Finance Minister would have had to face in fashioning out a budget in the circumstances that we in this House are well aware of, the Finance Minister has provided some relief to those people who cannot bear the burden of economic difficulties in this country.

I shall refer right away to the increased allowance that the Hon. Minister proposes to give those public servants who are in receipt of salaries of less than Rs. 100, namely, an allowance of Rs. 20 a month.

I remember that when the Hon. Minister of Finance announced this proposal there were shouts of "*pin* money" from the Opposition. It is indeed strange that the members of the Sri Lanka Freedom Party should belittle the allowance the Hon. Minister of Finance proposes to give the public servants who draw less than Rs. 100.

This House will recall that, in consequence of the struggle by the Public Service Workers' Trade Union Federation, the late Mr. S. W. R. D. Bandaranaike appointed a commission—the Wilmot Perera Commission —to go into the question of salaries and wages. I believe that, since Independence, if there was one government which did not implement the recommendations of a commission appointed by itself, it was the S. L. F. P. Government.

You will recall that in the 1950's the United National Party Government appointed the Jansze Commission to go into the question of salaries and wages. Certain recommendations were made by that commission, and it lies to the credit of the Government of that day that it implemented most of the recommendations of that commission as far as salaries and wages were concerned.

PUBLIC LIBRARY JAFFNA

During the nine years the S.L.F.P. was in power there was a virtual wage-freeze not only in the government sector but even in the private sector. Indeed, it was not only a wage-freeze that occured during that period ; there was a wage-cut in the form of the national development tax that the hon. Member for Dompe (Mr. F. R. Dias Bandaranaike) imposed when he was Minister of Finance.

The House will recall that the G. C. S. U., which was in the vanguard of the agitation against the national development tax, had its headquarters taken over by the then Government and it was only after a great deal of agitation that they were given back to the G. C. S. U.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. සිවසිතම්පරම් මයා.]

What happened to the money collected by way of the national development tax after that tax was withdrawn, nobody knows. There was not even an attempt made to refund the money that had been deducted from the salaries of public servants in the form of the so-called national development tax. The only relief, meagre though it was, that was given to public servants over the last nine and a half years was by the hon. Member for Yatiyantota when, as Minister of Finance, he increased the annual increments of those who were earning less than Rs. 100 from Re. 1 to Rs. 2.50. You will see the contrast between the proposal of the hon. Member for Yatiyantota which meant an increase of Rs. 18 per year in the case of those public servants, and the proposal of the present Minister of Finance which would mean an increase of Rs. 240 per year. In these circumstances, it is indeed strange and, if I may say so, hypocritical for the S.L.F.P. Members to criticize the allowance that the Hon. Minister of Finance has proposed to give to public servants—an alowance of Rs. 20 to those who draw a salary of Rs. 100 and less.

The other important, if I may say so, aspect of this Budget is that a great deal of emphasis is being placed on development. As the Hon. Minister of Finance himself said, the largest sum that was ever voted for development projects has been voted in this budget. Of course, it is sometimes said that, although large sums of money are voted annually for development, it is seen at the end of the financial year that actually there has been under-expenditure. I wish to quote from the Central Bank Report to show that, as far as last year was concerned, there was the least amount of under-expenditure on capital development. I read from page 5 of the Central Bank Report for 1966 :

"It is, however, significant to note that the under-expenditure recorded on capital votes in 1965-66 was only 8.7 per cent. in contrast to 22 per cent. in 1963-64 and 15.6 per cent. in 1964-65. Capital expenditure (including capital items in recurrent votes and expenditure financed from extra-budgetary funds) at Rs. 632.4 million was the highest level of capital expenditure achieved so far by Government and was higher than the 1964-65 level by Rs. 52.2 million. ......... This is indeed a very satisfactory feature of Government's fiscal operations in 1965-66.

The hon. Member for Walapane spoke a great deal of the lack of development. And here is proof that not only have larger sums been voted in our Budgets for capital expenditure, and therefore for development work, but also that during the last year and the year before under-expenditure on capital investment has been the lowest so far recorded during the last eight to nine years.

It has always been a perplexing question for successive Governments in Ceylon and, indeed, in all developing countries, as to what stress should be placed on which sector for economic development. As far as Ceylon is concerned, the question was whether stress should be placed on plantation agriculture or on traditional agriculture or on industry. Indeed, it will be strange to note that even experts who have come to this country from time to time have never agreed as to what sector the Government should devote more attention for the purpose of its development. For instance, John Hicks in "Papers by Visiting Economists", at page 7,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

emphasizes traditional agriculture as the only sector which offered real hope of increasing employment fast enough to absorb the rapidly growing labour force. Nicholas Kaldor, on the other hand, in his " Observations on the Problem of Economic Development in Ceylon ", at page 23, says that Ceylon owes the prosperity it has realized so far to her plantation agriculture and urges further concentration of her efforts to develop the economy on that relatively productive sector. Mrs. Joan Robinson, on the other hand, in her work on economic possibilities of Ceylon, stressed industry as an ultimate solution to Ceylon's economic problems.

You will thus see that it is a perplexing question as to what sector should receive greater emphasis or what portion of the Government's limited resources should be channelled into that sector. That is a question which has been perplexing not only successive Governments but also economic experts who visited Ceylon from time to time.

It is undoubtedly true that as far as this Government is concerned, it is placing more than average emphasis on the development of what may be called traditional agriculture ; and I say, Mr. Deputy Speaker, that for very good reasons this Government has decided that the emphasis should, within the next two or three years, be more on the development of paddy and agriculture.

As has often been said and rightly said, our country has a 'ship to mouth' existence. We import all the essential foods. Our staple food, rice, as well as all the other foods that we consume in our daily lives, have to be imported. Over the past few years we have seen how it has become increasingly more difficult for us to obtain our food requirements as a result of increasingly high prices in the world market as well as the fall in prices of our export articles. Therefore the Government has rightly decided that in the present context of our foreign exchange position, it has become necessary that our traditional agriculture should be developed.

It is the opinion of certain visiting experts that the sector which should have been the most dynamic was the present agricultural sector, but that there had been a deviation in the late 1950's and in the early 1960's in terms of output and production and certainly in production growth.

The output of paddy rose nearly two and a half times from 1946 to 1950. The value of its contribution to the gross domestic product rose by nearly 75 per cent. It employed nearly 245,000 people in traditional agriculture, more persons than it did in 1946. These undoubtedly are very far-reaching strides that we have made in the field of our traditional agriculture. But there is scope for more.

While we have increased our yield per acre from nearly 45 bushels to 50 bushels per acre, there are countries like Japan, which, by the adoption of modern methods, by the advancement of technological know-how in agriculture, have been able to reach a limit of 100 bushels per acre. So according to the data that we have from selected plots where new methods of agriculture have been tried out, it is possible even in Ceylon, even if we do not reach that yield of 100 bushels per acre, at least to double our present output. If that is something which we can achieve, and achieve quite easily, is there any harm in the Government having decided to place a lot of emphasis on agriculture in the coming one or two years ?

Of course, while the Government, as I said, quite rightly decided that emphasis should be placed on the development of agriculture, I do not concede for a moment the criticism that has been levelled by the Opposition that the industrial sector has been neglected.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිවසිතම්පරම් මයා.]

Mr. Deputy Speaker, quite a number of Members of the Sri Lanka Freedom Party, including the hon. Member for Walapane (Mr. T. B. M. Herath) asked us the question "what have you done for the last 2½ years? What is the new industry that you have set up?" Surely, Sir, industrial development in a country does not jump from government to government. If one government planned projects, and the succeeding governments find those projects worthwhile carrying through, then they do that before they start new industries. Undoubtedly the S. L. F. P. Government had planned out the tyre factory, the steel rolling factory and certain other factories. We give credit for that. Nobody wants to deny the good work that any government has done.

Then, Sir, it is useles and pointless saying that this Government has not started new industries. What did the Government do? It quite rightly continued, worked out and established, and put into production all the projects that the earlier Government had planned. Therefore, Sir, if they ask us what we have done, in the last two and half years, the simple answer is that we have carried on, maybe more efficiently, the projects that they set up or hoped to set up.

Mr. Deputy Sperker, this is only part of the problem. It is true that by force of circumstances, not by choice or deliberate planning but as a result of the strict import controls that they were forced to impose in 1960 and 1961, a large number of small industries were started by private parties There is no doubt, that we have had a large volume of import substitution in industrial projects started by individuals in many parts of the country.

Sir, industrialization in Ceylon has two main obstacles. One is in the field of processing agricultural primary products, the raw materials necessary for industries being almost totally absent in this country. I do not say that this is a fatal limitation, considering the example of Hongkong and Japan. Probably the absence of raw materials is no fatal limitation industrially in any country. The only limitation here then is the smallness of our country. As the population and *per capita* income of our country stand today, industrial products have only a limited market. One cannot conceive for instance that our home market can ever absorb a well-run automobile industry.—[*Interruption*]. I know the population of Yugoslavia and I also know the motor car industry there. Let us not forget the fact that we used to have Skoda cars in this country and there were a number of other countries which imported cars from Yugoslavia. I ask the hon. Member for Agalawatta (Dr. Colvin R. de Silva), Who is going to export our cars that we are going to produce?

Mr. Deputy Speaker, it is very easy to speak on those lines but when one starts looking at these matters——

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා (අගල වත්ත)

(கலாநிதி கொல்வின் ஆர். டி. சில்வா—அகலவத்த)

(Dr. Colvin R. de Silva—Agalawatta)

This was said about the steel industry, this was said about every other industry that was started. Anyway, I am sorry for that interruption.

එම්. සිවසිතම්පරම් මයා.

(திரு. எம். சிவசிதம்பரம்)

(Mr. M. Sivasithamparam)

I have no doubt that with his greater experience and better knowledge of these matters, he will deal with them in his speech.

It is my view that we could never have a home market in Ceylon to absorb all the products that we can produce in this country.

When one speaks of industrialization, Mr. Deputy Speaker, one must bear all these factors in mind and thereafter launch out on a scheme of industrialization.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

But I do at the same time level this charge at the Sri Lanka Freedom Party and the Governmental Party. They neglected certain basic industries which were absolutely essential for the industrial take-off in this country. One of these is the cement industry. Now you will remember, Sir, that according to the Ten-Year Plan that the late Mr. Bandaranaike drew up, the second and the third kilns of the Kankesanturai factory were to be completed before the 1960's. For various reasons the second kiln did not come up till 1963, and the third kiln is still in the offing. It is the considered opinion of practically every expert who had come to this country that if you are going to start a clinker grinding plant in Galle it is essential that the transport of clinker and oil should be done by sea and not by rail, which necessitated, therefore, the opening of the Kankesanturai harbour. Once again, Mr. Deputy Speaker, for various reasons, the opening of the Kankesanturai harbour was not undertaken. I think the hon. Member for Agalawatta (Dr. Colvin R. de Silva) will well remember that one of the last Motions that we discussed on the Floor of this House, before the defeat of the Sirimavo Bandaranaike Government, was a private Motion moved by me—

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

After its defeat.

එම්. සිවසිතම්පරම් මයා.
(திரு. எம். சிவசிதம்பரம்)
(Mr. M. Sivasithamparam)

All right, after its defeat, but before this Government assumed office and, may I say, at the time they were hesitating whether to resign or to do something else. It was during that period that one of the last private Members' Motions in this House was moved by me, namely, that the Kankesanturai harbour should be developed. I think the hon. Member for Agalawatta will recall that he spoke for nearly two and a half hours—he spoke on everything but the development of the Kankesanturai harbour—adducing reasons as to why the Kankesanturai harbour should not be developed.

මේ රටේ නිවාස ප්‍රශ්නය අද ඉතාමත්ම උග්‍ර තත්ත්වයකට පත්වී තිබෙන බව අප දන්නවා. වර්ෂයක් වර්ෂයක් පාසා මේ රටේ වැඩි වන ජනගහණයට සරිලන පරිද්දෙන් නිවාස ප්‍රශ්නය විසඳීමට මේ රජය ක්‍රියා කරගෙන යනවා. කොළඹ හා අවට ප්‍රදේශවල තට්ටු නිවාස පන්දහසක් පමණ තැනීමට අප ක්‍රියා කරගෙන යනවා. ඒවාගේම පළාත් පාලන ආයතනවලට වැඩිපුර ආධාර මුදල් දී පළාත් පාලන ආයතන මාර්ගයෙනුත් නිවාස තැනවීමට අප වැඩ කටයුතු කරගෙන යන බව මා මේ අවස්ථාවේදී මතක් කරන්නට සතුටුයි. 1964 මාර්තු 25 වැනි දින සිට 1965 මාර්තු 31 වැනි දින දක්වා ජාතික නිවාස දෙපාර්තමේන්තුවෙන් 3,006 දෙනකුට නිවාස ණය දී තිබෙනවා. එහෙත් ඊළඟ වර්ෂයේ—වර්තමාන රජයෙන්—5,995 දෙනකුට නිවාස සාදා ගැනීම සඳහා ණය දී තිබෙනවා. රුපියල් 2,000 සිට 25,000 දක්වා ණය මුදල් මගින් වර්ෂයක් පාසා රුපියල් කෝටි 10 කට වඩා මහ ජනතාව අතර බෙදා හැර තිබෙනවා. ඒ සමගම මා කියන්නට කැමතියි, නිවාස සාදා ගැනීම සඳහා ණය ඉල්ලුම් කරන්නට මේ වර්ෂයේදීත් එවැනිම මුදල් ප්‍රමාණයක් ලබා දීමට කටයුතු ආරම්භ කර තිබෙන බව.

ඒ වාගේම ප්‍රයෝජනයට නොගන්නා ඉඩම්, කණ්ඩායම් වශයෙන් රජයෙන් ඉල්ලා සිටි විට ඉඩම් නැති අයට ලබා දීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රජය ක්‍රියා කරනවා පමණක් නොව ඒ සඳහා පහසු ක්‍රමයට මුදල් ගෙවීමට කටයුතු සලස්වා තිබෙන අතර ඉදිරියටත් එවැනි පහසුකම් සලස්වන බවත් මා මතක් කරන්නට කැමතියි. ඔය ආදී වශයෙන් කටයුතු කිරීමෙන් වුණත් නිවාස ප්‍රශ්නය විසඳීම රජයට පමණක් කරන්නට පුළුවන් දෙයක් නොවන බව අප කවුරුනුත් දන්නා කාරණයක්. ඒ වුණත් ඉදිරියටත් හැකි තාක් දුරට මේ රටේ ජනතාවගේ නිවාස ප්‍රශ්නය විසඳීමට මේ රජය කටයුතු කරගෙන යන බව මෙම අයවැය කථාවෙන් තමුන්නාන්සේලාට ප්‍රකාශ කර තිබෙනවා.

විදුලිබල කර්මාන්තය අපේ රටේ ශීඝ්‍රයෙන් දියුණු වේගෙන එන කර්මාන්තයක්. සුළු නගරවලට පවා, ගම් නියම්ගම් වලට පවා විදුලිබලය වුවමනා කරනවා. එසේ අළුතින් විදුලි බලය වුවමනා කරන ගම්වලින් අඩු තරමින් ගම් 100 කටවත් මේ මුදල් වර්ෂය තුළ විදුලි බලය සැපයීමට රජය සූදානම් බව මා ඉතා සන්තෝෂයෙන් මතක් කරන්නට කැමතියි.

ඒ සමඟම මේ රටේ අනෙකුත් කර්මාන්ත දියුණුව සඳහාත් රජය නියම විධියට කටයුතු කරගෙන යනවා. ඒ කර්මාන්ත වලින් නිෂ්පාදනය කරන භාණ්ඩ ජනතාවට ඉතා පහසුවෙන් ප්‍රයෝජනයට ගන්නට පුළුවන් වන අන්දමට, එම නිෂ්පාදන උසස් තත්ත්වයේ නිමැවුම් වීමට ඒ කර්මාන්තකරුවන් වගබලා ගත යුතු බවත් මෙහිදී මතක් කරන්නට කැමතියි. පසුගිය රජයෙන් මේ කර්මාන්ත වැඩි හරියක් ආරම්භ කළා පමණක් නොව ණය මුදල් දුන් බවත් අප පිළිගන්නවා. ඒ වාගේම ඒ ණය මුදල් දීමට අමතරව අවුරුදු 5 ක ආදායම් බදු නිදහසකුත් ඔවුනට පසුගිය රජයෙන් දී තිබෙනවා. ඒ නිසා මේ කර්මාන්ත ශාලාවලින් පිට වන නිෂ්පාදනයන් ජනතාවගේ ප්‍රයෝජනයට සෑහෙන තරම් තත්ත්වයක නැති බව මා දන්නවා. එම නිසා ඒ නිෂ්පාදන භාණ්ඩ මීට වඩා හොඳ තත්ත්වයකට ගෙන ඒමට ගරු කර්මාන්ත ඇමතිතුමා ක්‍රියා කරාවිය කියා මා විශ්වාස කරනවා.

මේ ගරු සභාව තුළ සමාජ සේවා ඇමතිතුමාත් ඉන්නා නිසා ඒ සම්බන්ධයෙනුත් වචනයක් දෙකක් කියන්නට කැමතියි. රැකියාවක් කර ගන්නට බැරි දිළිඳු, වයෝවෘද්ධ ජනතාව වෙනුවෙන් අද සමාජ සේවා දෙපාර්තමේන්තුව විශාල වියදමක් දරන බව මා කියන්නට කැමතියි. ඒ කටයුතු දිගටම කරගෙන යන අතර ඉදිරියටත් දිළිඳු වයෝවෘද්ධ ජනතාවට තව තවත් ආධාර කිරීමට රජය ක්‍රියා කරගෙන යන බවත් ප්‍රකාශ කරන්නේ සන්තෝෂයෙන්. ඒ වගේම ජනතා රක්ෂණ ක්‍රමයකුත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් සකස් කර තිබෙනවා. පසුගිය කාලය තුළ සුළි සුළං, වර්ෂා, නියං ආදිය නිසා ජනතාවගෙන් සමහර කොටසකට පීඩා සිදු වුණු බව තමුන්නාන්සේ දන්නවා. ඒ සෑම අවස්ථාවකදීම විශාල මුදලක් වියදම් කර ඒ ජනතාව සුඛිත-මුදිත කිරීමට සමාජ සේවා දෙපාර්තමේන්තුව ඉදිරිපත් වුණා. ඒ සමඟම මේ අවස්ථාවේදී එක් කාරණයක් මතක් කරන්නට කැමතියි. සෑම දාමත් මේ විධියට ඒ දුප්පත් ජනතකාවට ආධාර කිරීමෙන් පමණක් මේ ප්‍රශ්න විසඳන්නට බැහැ. කෙසේ හෝ මෙම ප්‍රශ්නය විසඳන්නට අප කල්පනා කළයුතුයි. සමාජ සේවා දෙපාර්තමේන්තුව දැනට අනුගමනය කරන යල් පැනපු ක්‍රම පැත්තකට දමා අලුත් විධියට සිතාමතා අලුත් යෝජනා ඉදිරිපත් කළහොත් සමහර විට මේ රටේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීම සඳහා සෑහෙන වැඩ කොටසක් කරන්නට එම දෙපාර්තමේන්තුවට පුළුවන් වෙනවා ඇති.

උදාහරණයක් වශයෙන් හොඳ ශරීර ශක්තියක් ඇති ගැහැණු දරුවන් තිදෙනකු සමඟ ජීවත් වන දුර්වල මාතාවක ගැන කල්පනා කර බලමු. ඒ දුර්වල මාතාවට මාසයකට රුපියල් 20 ක ආධාරයක් ලැබෙනවා. පවුලේ කී දෙනකු සිටියත් දෙන වැඩිම ආධාර මුදල රුපියල් 20 යි. මේ අය ගෙවල් කුලියක් නොගෙවා තමන්ගේ කුඩා පැල්පතේ ජීවත් වෙනවා. අර ශරීර ශක්තියෙන් යුක්ත ගැහැණු දරුවන් තිදෙනාට රක්ෂා නැහැ. ඔවුනට වැඩ කරන්නට පුළුවනි. වැඩ කරන්නට ශක්තිය තිබෙනවා. එහෙත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ද එස්. ජයසිංහ මයා.]

ස්වෝත්සාහයෙන් කිසියම් වැඩක් ආරම්භ කිරීම පිණිස අවශ්‍ය මූලධනය ඒ අයට නැහැ. අර දුර්වල මාතාව මාසයකට ලැබෙන රුපියල් 20 මුදල වියදම් කරමින් කෙසේ හෝ දුරු කහ මිරිස් ටික ලබාගෙන නොමිළයේ ලැබෙන හාල් සේරුව ප්‍රයෝජනයට ගනිමින් දවසට වේලක් පිරිමසා ගෙන ජීවත් වෙනවා. ඉතින් කවදාවත් මේ විධියට නම් මේ අයට දියුණුවක් ලැබෙන්නේ නැහැ. එසේ නම් මාසයකට වරක් දෙන රුපියල් 20 මුදල වෙනුවට දැවුරුද්දක පමණ මුදල එක වර දෙනවා නම්--රුපියල් 480 ක් නැත්නම් රුපියල් 500 ක් එකවර දෙනවා නම්—අර ශරීර ශක්තිය තිබෙන ගැහැණු ළමයින් තිදෙනාට මැහුම් ගෙතුම් කිරීමෙන්, එසේ නැත්නම් රස කැවිලි සෑදීමෙන් තම ජීවිකාව සලසා ගන්නට පුළුවන් වෙනවා. ඒ අයට රක්ෂා ලැබෙනවා; පවුලේ දියුණුවක් ඇති වෙනවා.

තවත් කාරණයක් කල්පනා කර බලමු. රක්ෂා නැති 100කට ට්‍රයිසිකල් 100ක් දී රුපියල් 100 බැගින්ද දෙමින් මිනිසුනට එදිනෙදා ජීවත් වීම සඳහා වුවමනා කරන දේ එම මුදලින් ගෙන වෙළෙඳාමේ යන ලෙස කියන්නට පුළුවනි. ගිනි පෙට්ටි ලාම්පු තෙල්, පොල් තෙල් තේ කොළ සීනි ආදිය රුපියල් 100ට ලබාගෙන ඒවා සුළු පැකට් වශයෙන් සකස් කොට තබා ගෙන ට්‍රයිසිකලයේ නැඟී වෙළෙඳාමේ යෑමේදී එසේ කරන තැනැත්තාට තමන්ගේ දවසේ වියදම සපයා ගන්නට පුළුවන් වෙනවා. ඒ අතර ට්‍රයිසිකලය සඳහා දවසකට ශත 10ක්, 15ක්, 25ක් ආදී වශයෙන් පුළුවන් ප්‍රමාණයක් ගෙවන්නට ඔවුට පුළුවන් විය යුතුයි. එසේ ගෙවාගෙන ගොස් මුළු මුදල සම්පූර්ණ කිරීමේදී ඔහුට ට්‍රයිසිකලයේ අයිතිය පවරා දෙන්නට ඕනෑ. මේ විධියට කළහොත් ලොකු සමාජ සේවයක් සැලසෙනවා. සෑම නගරවලින්ම මේ විධියට සෑහෙන පිරිසක් තෝරාගෙන රක්ෂා සපයන්නට පුළුවනි. මේ නිසා සමාජ සේවා දෙපාර්තමේන්තුව යල් පැනපු ක්‍රමවලින් ඉවත් වී අලුත් ක්‍රම ගැන හිතා මේ සමාජය දියුණු කිරීමට කටයුතු කළ යුතුයි. ගංවතුරක් ගැළුවාම එයින් පීඩාවට පත් වන උදවියට ආධාර මුදල් දෙනවා. ටික දවසකින් නැවතත් වරක් ගංවතුර ගැළුවාම නැවතත් ආධාර දෙන්නට වෙනවා. ආයෙත් දෙනවා; ආයෙත් දෙනවා. හැමදාමත් මේක කරන්න පුළුවන්ද? බැහැ. එසේ හෙයින් මේ සඳහා නිසි යෝජනා ක්‍රමයක් සකස් කර ගන්නට ඕනෑ. දැනට දෙන රුපියල් 20 න් පවුලේ සිටින සියලු දෙනාම ජීවත් වන්නට ඕනෑ. මේ ආධාර මුදල ලබන්නා මිය ගිය විට පවුලේ ඉතිරි අය නැවත් අනාථ වෙනවා. ඔවුන් ශරීර ශක්තියෙන් අඩුවක් නැති නිරෝගී අය හෙයින් ඔවුනට ආධාර අනවශ්‍ය යයි දැක් වෙන රපෝර්තු ගිය විට ඔවුනට ආධාර ලැබෙන්නේ නැහැ. යම් යම් වැඩ කරන්නට පුළුවන් උදවිය ගම්වල සිටිනත් මූලධනය නැති නිසා ඔවුන් දන්නා වැඩ පටන් ගන්නට ඔවුනට පුළුවන්කමක් නැහැ. මූලධනයක් ලැබුණහොත් ගොවි තැනක් කර හෝ, කුකුළු පට්ටියක් දමා හෝ, වෙළඳාමක් කර හෝ ජීවිකාව සලසා ගන්නට පුළුවනි. මේ කරුණු කල්පනාවට ගෙන සමාජ සේවා අමාත්‍යාංශය අලුත් වැඩ පිළිවෙළක් ආරම්භ කරතැයි අප බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කිරීම සඳහා ලැබුණේ මිනිත්තු 40 යි. දැන් ඒ කාලය සම්පූර්ණ වීගෙන යනවා. ඒ නිසා මගේ කථාව කෙටි කරන්නට අදහස් කරනවා. මෙවැනි අයවැය ලේඛන යක් මෙම ගරු සභාවට ඉදිරිපත් කරන ලද ප්‍රථම අවස්ථාව මේකයි. මීට පෙර අයවැය ලේඛන කීපයකට මා සවන් දී තිබෙනවා. මා මෙම ගරු සභාවේ නොසිටි කාලය තුළ දී අයවැය ලේඛන වාර්තා පුවත්පත් මඟින් කියෙව්වා. එහෙත් මෙතරම් සහනයක් ලැබුණු අයවැය ලේඛනයක් මෙම සභාවේ ඉදිරිපත් කර නැහැ. එනිසා මෙම අයවැය ලේඛනය පිළිබඳව තමන්ගේ හෘදසාක්ෂියට එකඟව සාවධානව කල්පනා කර බලන ලෙස විරුද්ධ පාර්ශ්වයෙන් මා ඉල්ලා සිටිනවා. තමුන්නාන්සේලා ආණ්ඩු කරද්දී තමුන්නාන්සේලාගේ රත්තරන් මොළ ටිකත් එකතු කර ගෙන ඉදිරිපත් කරන්නට යෙදුණු අයවැය ලේඛනවලින් සැලසුණු යහපත කුමක්ද? එක් අයවැය ලේඛනයකින් සිලිම් පහක් වැඩි කරන්ට පමණයි, තමුන්නාන්සේලාට පුළුවන් වුණේ. නමුත් මේවර අයවැය ලේඛනය මඟින් ඊට වඩා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සෙතක් සලසා දී තිබෙනවා. රුපියල් 100න් පහළ ආදායමක් ලැබෙන හැම දෙනාටම රුපියල් 20ක වැඩි කිරීමක් තිබෙනවා. අපි සිතමු, අද හාල් සේරුවක මිල ශත 80 යි කියා. ඒ මුදලින් හාල්සේරු 25ක් ලබා ගන්ට පුළුවනි. එක පැත්තකින් හාල් සේරුවක් නිකම් ලැබෙනවා. අනික් පැත්තෙන් ඒ ආකාරයට සහල් ලබා ගන්ට රුපියල් 20ක ආධාරයක් ලැබෙනවා. රුපියල් 10 පෙන්ෂන් පඩියෙන් ජීවත් වන අය සිටින ගෙවල වුවත් හරිහම්බ කරන දූ දරුවන් සිටින්ට පුළුවනි. ඒ උදවියට එම ආදායම් අතරට මෙම ආධාරයත් ලැබුණු විට බොහොම ලෙහෙසියෙන් කටයුතු ගෙන යන්ට ඉඩ සැලසෙනවා ඇති.

මෙම රජය හාල්සේරුවක් කැපුවාය කියා බොහෝ දෙනා චෝදනා කරනවා. එහෙත් නිකම් හාල් සේරුවක් දෙනවායැයි කවදාවත් විරුද්ධ පාර්ශ්වයේ උදවිය ප්‍රශංසා කර නැති බව මා කනගාටුවෙන් නමුත් ප්‍රකාශ කරනවා. තමුන්නාන්සේලා හාල් සේරුවක් කැපුවාය කියා අපට බනින්න; දොස් කියන්න; "මේ මූසල ආණ්ඩුව නැම්බිලා යන්ට ඕනෑ, හාල් සේරුවක් කැපුවාට" කියා චෝදනා කරන්න; ලෝකයේ හැම තැනම හාල් තිබෙන නමුත් කරන්නේ බොරුවය කියා තමුන්නාන්සේලා දන්නා හැම භාෂාවකින්ම මෙම රජය විවේචනයට භාජන කරන්න. එහෙත්, මේ රට මෙතරම් ආර්ථික පරිහාණියකට මුහුණ පා සිටින අවස්ථාවකදී හාල්සේරුවක් නොමිලයේ ලබා දීමට ක්‍රියා කිරීම ගැන පමණක් මේ ආණ්ඩුවට ප්‍රශංසා කරන්න. තමුන්නාන්සේලා එවැනි ප්‍රශංසාවක් මෙම ආණ්ඩුවට දෙන්ට කැමති නැහැ. ලෝකයේ හැම තැනම හාල් තිබෙනවා; ඒ හාල් ගෙනැවිත් දෙන්ට බැරි ඇයි කියන චෝදනාවයි, තමුන්නාන්සේලා හැම අවස්ථාවකදීම කරන්නේ. නමුත් හාල් සේරුවක් නිකම් දීම ගැන කුමන අවස්ථාවකදීවත් ප්‍රශංසා කරන්නේ නැහැ. මෙම රජයේ අග්‍රාමාත්‍යතුමාත් අමාත්‍ය මණ්ඩලයත් අපේ රටේ ගොවිතැන් ව්‍යාපාර සඳහා බොහෝ මහන්සි ගන්නවා. මේ ගෙනයන වැඩ පිළිවෙළ තව අවුරුදු දෙකක් ගෙන ගියොත් හාල් කුපන් ක්‍රමය මේ රටින් සම්පූර්ණයෙන්ම නැති කර දමන්ට හැකි වෙනවා ඇති. හාල් සේරු දෙකම කිසි කරදරයක් නැතුව මේ රටේ මහජනතාවට ලබා දීම සඳහා දැනට අත්තිවාරම් දමා තිබෙන බව මෙහිලා සඳහන් කරන්ට කැමතියි. [බාධා කිරීමක්] නොමිලයේම දෙන්ටත් පුළුවන් වේවි. තේ, රබර් යනාදියෙහි මිල ඉහළ ගියොත්, තමුන්නාන්සේලාගේ සහයෝගය අපට නිසියාකාර ලැබුණොත්, බැණුම් ගැරහුම් කරන්නේ නැතුව අපි කරන වැඩ කටයුතුවලට තමුන්නාන්සේලා ප්‍රශංසා කළොත්, අපි කරන වැඩ හොඳය කියා තමුන්නාන්සේලා පිළිගත්තොත් අපට කිසි අමාරුවක් නැතුව මෙම ප්‍රශ්න විසඳා ගන්නට පුළුවන් වෙනවා ඇති. එහෙත් තමුන්නාන්සේලා කරන්නේ අපේ වැඩවලට අකුල් හෙළන එකයි; දොස් කියන එකයි. කාටහරි ට්‍රැක්ටරයක් දුන්නොත් ඒ ට්‍රැක්ටරය වෙන වැඩකට ගෙන ගියාය කියා චෝදනා කරනවා ඇති. තව කාටවත් ඉඩමක් දුන්නොත් ධනපතියකුට ඉඩමක් දුන්නාය කියා චෝදනා කරනවා ඇති. වෙන වැඩක් කළත් කතා කරන්නේ එහෙමයි. එසේ කතා කරන්නේ නැතුව සාධාරණව කල්පනා කර බලා පුළුල් අන්දමින් සිතා බලා ක්‍රියා කළොත් තව අවුරුදු දෙකක් යන විට මේ රට ආහාරයෙන් ස්වයංපොෂිත වෙනවාට කිසිම සැකයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රජය මඟින් අර්තාපල් ගෙන්වීම නැවැත්වූ බව තමුන්නාන්සේ දන්නවා ඇති. මේ රටේ ජාතික ධනයෙන් රුපියල් ලක්ෂ 350 ක් අවුරුදු පතා ඒ සඳහා පිටරටට ඇදී ගියා. එක අවුරුද්දකට ලක්ෂ 350ක මුදලක් අපට ඉතිරි කර ගන්නට පුළුවන් වුණොත් ඒ මුදලින් ලක්ෂ 10 බැගින් වියදම් කොට පාඨශාලා 35ක් සඳහා ගොඩනැගිලි 35 ක් සාදා දෙන්ට පුළුවන්කම ලැබෙනවා ඇති.

අද අපේ රටේ මිරිස් වගාව සඳහා මෙම රජය මඟින් ආධාර දෙනවා. එනිසා අද රටේ බොහෝ ප්‍රදේශවල ඉතා සශ්‍රීකව මිරිස් වගාව කෙරෙනවා. ඒ වෙනුවෙන් සෑම ආධාරයක්ම කරන්ට මේ රජය සූදානමින් සිටිනවා. අපි කන වේලිච්ච මිරිස් කරල වෙනුවෙන් අවුරුද්දකට අපේ රටේ ජාතික ධනයෙන් ලක්ෂ 450 ක් වැය කරන බව ප්‍රකාශ කරන්ට සිදු වී තිබෙනවා. ඒ මුදල ඉතිරි කර ගන්ට හැකි වුණොත් කොතරම් වැදගත්ද කියා කල්පනා කර බැලිය යුතුයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේත් මාත් දෙදෙනාම සිංහල අයයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ද එස්. ජයසිංහ මයා.]

අප දෙන්නාම බත් කන අයයි. අප එක් අයකුගේ පාවිච්චියට දවසකට මිරිස් කරල් 4ක්වත් වැය වන්නේ නැහැ. එහෙත් මේ රටේ ජාතික ආදායමෙන් රුපියල් ලක්ෂ 450 ක් අවුරුදුපතා මිරිස් සඳහා වියදම් වෙනවා. මේ රුපියල් ලක්ෂ 450 අපට ඉතිරි කර ගන්නට පුළුවන් නම් එකකට රුපියල් ලක්ෂ 10 බැගින් වියදම් කර ආරෝග්‍යශාලා 45 ක් පළමුවෙන්ම විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ගේ ඡන්ද කොට්ඨාශවල සාදන්නට අපට පුළුවන්. අප මේ ගෙන යන ව්‍යාපාරයට තමුන්නාන්සේලාගේ සහයෝගය ලැබෙනවා නම් ඔය පාඨශාලාත්, ඔය ආරෝග්‍යශාලාත් පළමුවෙන්ම තමුන්නාන්සේලාගේ ඡන්ද කොට්ඨාශවල සාදනවට කිසිම සැකයක් නැහැ.

අපේ පාරවල් අද බොහොම දුර්වල තත්ත්වයකයි, තියෙන්නෙ. පසුගිය රජය කාලයේදී මේ පාරවල් හොඳට හදා තිබුණා නම් අද මේ තරම් දුර්වල තත්ත්වයක තිබෙන්නෙ නැහැ. ඒ පාරවල් හදන්නට තිබුණු මුදල්වලින් කාර් ගෙන්නුවා; තවත් නොයෙක් දේවල් කළා. මා දැන් ඒ ගැන විවේචනය කරන්නට බලා පොරොත්තු වන්නෙ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්න බලා පොරොත්තු වන්නෙ නැහැ. දුප්පතාට මේ තරම් සහනය සලසන, දුප්පතාගේ ආහාරයට, ළදරුවාගේ ආහාරයට, හැම දෙනාම අඳින රෙදි පිළිවලට කිසිම මුදලක් වැඩි කරන්නෙ නැතිව සෑම දෙනාටම සාධාරණය ඉටු වන අන්දමට ඉදිරිපත් කර තිබෙන මේ අයවැය ලේඛනයට සහයෝගය දෙන මෙන් විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ගෙනුත් මම ඉල්ලා සිටිනවා. තමුන්නාන්සේලා මේ අයවැය ලේඛනයට විරුද්ධ වෙනවා නම් ඒ විරුඬ වන්නේ දුප්පත් ජනතාවගේ ආහාරවලට මිළ වැඩි නොකළ, දුප්පත් ළදරුවාගේ පිටි කිරිවලට මිළ වැඩි නොකළ, දුප්පත් කම්කරුවාගේ වැටුප රුපියල් 20 කින් වැඩි කළ අයවැය ලේඛනයකට බව කල්පනා කරන්න ඕනැ. ඒ නිසා තමුන්නාන්සේලාගේ හෘදය සාක්ෂියට අනුව කල්පනා කර මේ සාධාරණ අයවැය ලේඛනයට තමුන්නාන්සේලාගේ සහයෝගයත් ඡන්දයත් දෙන ලෙස ඉල්ලමින් මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 7.20

තුඩාවේ මයා.

(திரு. துடாவ)

(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු පාර්ලිමේන්තු ලේකම්වරයකුගේ කථාවෙන් පසු මට කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. එතුමා දීර්ඝ වශයෙන් කථා කරමින් මේ අයවැය ලේඛනයේ වැදගත්කම අපට අවබෝධ කරවන්නට ලොකු උත්සාහයක් කළා. එහෙත් ඒ උත්සාහය සාර්ථක වුණායයි, මා කල්පනා කරන්නෙ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අප මේ විවාද කරන්නේ යූ.එන්.පී.—පෙඩරල් ආණ්ඩුවේ තුන් වන අයවැය ලේඛනයයි. අයවැය ලේඛනයක් ඉදිරිපත් කරන විට මහජනයා බලාගෙන ඉන්නවා, මේ අයවැය ලේඛනයෙන් අපේ ජීවිතයට, අපේ අනාගතයට කොයි විධියේ පහසුවක් ලැබේද, මේ අයවැය ලේඛනය නිසා අපේ ජීවිතයේ මොන විධියේ වෙනසක් ඇති වේද, අපේ දරුවන්ගේ ජීවිතයේ මොන විධියේ වෙනසක් ඇති වේද, අපේ දරුවන්ගේ අධ්‍යාපන තත්ත්වයේ මොන විධියේ වෙනසක් ඇති වේද කියා. සමාජයේ සෑම අංශයකම සිටින කොටස්—ලිපිකරුවන්, ගුරුවරුන්, කම්කරුවන්—බලාගෙන සිටිනවා, මේ අයවැය ලේඛනයෙන් තමන්ට ලැබෙන සහනය කුමක්ද කියා. මහජනාධාර ලබන උදවිය පවා මේ අවුරුද්දේ තමන්ගේ ආධාර මුදල වැඩි වේය කියා බලාපොරොත්තු වන බව සමාජසේවා ඇමතිතුමාට මතක් කරන්නට සතුටුයි. ඒ විධියට මේ අයවැය ලේඛනයෙන් තම තමන්ට මොන මොන විධියේ සහනයන් ලැබේද කියා මුළු ජාතියම බලාගෙන සිටිනවා.

අවුරුද්දක් ආරම්භ වන විට ලිත අරගෙන රාශි අයවැය බැලීමේ පුරුද්දක් අපේ ගම්බද මිනිසුන් අතර තියෙනවා. තමන්ට ආදායම ලැබෙන්නේත්, තමන්ගේ වියදම කෙරෙන්නේත් තමන්ගේ

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ලග්නයට අනුවය යන විශ්වාසයක් ඒ අය තුළ තිබෙනවා. මීන ලග්නයට ආදායම් ලැබෙන්නේ මේ පිළිවෙළටය, මේෂ ලග්නයට ආදායම් ලැබෙන්නේ මේ පිළිවෙළටය, යනාදි වශයෙන් ගණන් බැලීමේ සිරිතක් තිබෙනවා. එහෙත් අපේ මහජනයා දැන් ඉස්සරට වඩා දියුණුයි. ග්‍රහ තාරකාවන් දෙස බලා අපේ අයවැය පිළිබඳව ජ්‍යෝතිශ්ශාස්ත්‍රඥයන් කියන අනාවැකි කෙරෙහි දැන් මහජනයා ඒ තරම් විශ්වාසයක් තබන්නෙ නැහැ. දැන් මහජනයා බලාපොරොත්තු වන්නේ රටේ පාලනය භාරව සිටින ආණ්ඩුව වර්ෂයකට වරක් ඉදිරිපත් කරන අයවැය ලේඛනයෙන් තමන්ගේ අයවැය ගැන කොයි තරම් ලොකු කාර්යභාරයක් ඉෂ්ට වේදැයි දැන ගැනීමටයි. ආණ්ඩුවේ අයවැය ලේඛනය උඩ තමයි දුප්පත් කම්කරුවාගේ අයවැය ලේඛනයත් රඳා පවත්නේ. මහජනාධාර ලබන—පින්පඩි ලබන—දුගී ජනතාවගේ අයවැය ලේඛනය සකස් වන්නේත් ආණ්ඩුවේ අයවැය ලේඛනය අනුවයි. ජන ජීවිතයේ කොයි කොයි අන්දමේ වෙනස්කම් ඇති වේ දැයි දැන ගත හැක්කේ ආණ්ඩුවෙන් අවුරුදුපතා ඉදිරිපත් කරනු ලබන අයවැය ලේඛනය අනුවයි. ඒ නිසා අයවැය ලේඛනය ඉතාමත් වැදගත් එකක් බව පිළිගත යුතුව තිබෙනවා.

දැන් අපේ සැලකිල්ල යොමු වෙමින් තිබෙන්නේ මේ ආණ්ඩුවෙන් ඉදිරිපත් කරන ලද තුන්වැනි අයවැය ලේඛනයයි. මීට පෙර අයවැය ලේඛන දෙකක් මේ ආණ්ඩුවෙන් ඉදිරිපත් කළා. පළමුවැනි අයවැය ලේඛනයත්, දෙවැන්නත් පරීක්ෂා කර බැලූ මට පැහැදිලි වූ එක් කාරණයක් නම් මේ ආණ්ඩුව ධනපති පන්තියට බදු සහනයන් ඇති කිරීම රහසක් නොවන බවයි. සාමාන්‍ය ජනතාවට වඩා ධනපති පන්තියේ ජනතාව දෙස බලාගෙනයි මේ ආණ්ඩුව අයවැය ලේඛන සකස් කරන්නේ. එය පුදුමයට කාරණයක් නොවෙයි. දේශීය සහ විදේශීය ධනපතියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්නට ඉන්න, වැඩි වශයෙන්ම ධනපතියන් නියෝජනය කරන පිරිසක් ඉන්න ආණ්ඩුවක් ධනපති අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියා කිරීම ගැන මා පුදුම වන්නේ නැහැ. මුල් අයවැය ලේඛන දෙකෙන්ම ඒ කාර්යය නොපිරිහෙලා කර තිබෙනවා. තුන්වැනි අයවැය ලේඛනය—දැන් අප විවාදයට භාජන කරන අලුත් අයවැය ලේඛනය—පිරික්සා බැලුවත් පළමුවැනි, දෙවැනි අයවැය ලේඛන වගේමයි. පෙරටත් වඩා සමහර විට ධනපති පන්තියට බදු සහන දී තිබෙනවාය කියන්නට පුළුවනි, තුන්වැන්නෙන්. මේ රටේ ජාවාරම්කාරයන් මේ අයවැය ලේඛනයෙන් හුඟක් වාසි ගන්නවා ඇති. තමන්ගේ ජාවාරම් ධනය රැස් කිරීමට යොදා ගත හැකි පරිදි පහසුකම් ඒ අයට සලසා දී තිබෙනවා. විදේශ විනිමය බෙහෙවින්ම යෙදෙන්නේ ජාවාරම්කාරයින්ගේ වාසියට බව මෙයින් පෙනී යනවා.

අයවැය හිඟය හෙවත් පරතරය පියවා ගැනීමට මේ ආණ්ඩුවට තිබෙන ක්‍රියා මාර්ගය මොකක්ද? ඒ ගැන කල්පනා කරන අපට පෙනෙන්නේ විදේශීය ධන දෙවුවන් අතට අප යට වී සිටින බවයි. ඔවුන්ගෙන් ණය ලබා ඒ මගින් අපේ අයවැය හිඟය පියවා ගැනීමටයි ආණ්ඩුව ක්‍රියා කරන්නේ. අයවැය හිඟය පියවා ගැනීමට ගන්න පළමුවැනි පියවරයි ඒ. දෙවැනි පිළියම පාරිභෝගික භාණ්ඩ වෙනුවෙන් වැඩියෙන් අය කිරීමයි. මට පෙර කථා කළ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා නම් කිව්වේ පාරිභෝගික භාණ්ඩවල මිල වැඩි නොවන බවයි. ඒ සියල්ලම ආරක්ෂා කර දුප්පත් පන්තියේ උදවියට පහසු මිළට බඩු ලබා දෙන්නට වැඩ කටයුතු කරන බවයි එතුමා කියා සිටියේ. ඒ කියමන පිළිගන්නට පුළුවන්කමක් අපට නැහැ.

බලපත්‍ර සඳහා අය කළ සියේට එකේ බද්ද සියේට දහය කිරීමෙන් මේ ආණ්ඩුව බලාපොරොත්තු වන්නේ අයවැය හිඟය පිරිමසා ගැනීමට අවශ්‍ය මුදල් සොයා ගන්නට බව අපට පෙනී යනවා. අයවැය හිඟය පියවා ගැනීම සඳහා මේ රටින් ණයක් ලබා ගන්නටත් මේ ආණ්ඩුව බලාපොරොත්තු වෙනවා. සංයුක්ත මණ්ඩලවල ලාභයෙන් කෝටි තුනක් ගන්නට බලාපොරොත්තු වෙනවාලු. මේ සංයුක්ත මණ්ඩල කාගේ වැඩද? ඒවා ඇති කළේ කවුරුද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවයි ඒවා ඇති කළේ. කලින් තිබුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව මේ රටේ සංයුක්ත මණ්ඩල ඇති කිරීමෙන් කර තිබෙන්නේ සේවයකැයි මේ ආණ්ඩුවේ [illegible] කවදාවත් කොයිම අවස්ථාවකදීවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

කියන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම මේ සංයුක්ත මණ්ඩලවලින් විශාල ලාභයක් ලැබෙනවා. ජනසතු ව්‍යාපාරවලින් ලැබෙන ලාභවලිනුයි මේ ආණ්ඩුව අද ජීවත් වන්නේ. පසුගිය ආණ්ඩුවේ ක්‍රියා කලාපය නිසා ලැබෙන ලාභවලින් තමයි, අද මේ රජය රට ආණ්ඩු කරන්නේ. වරාය සංයුක්ත මණ්ඩලය දෙස බලන්න. වරාය ජනසතු කළේ 1958 දීයි. මේ ජනසතු ව්‍යාපාරයට ඒ කාලයේදී කම්කරුවන් 14,000ක් බඳවා ගන්නට පුළුවන් වුණා. දැන් ඒ සංඛ්‍යාව 3,500 කින් පමණ වැඩි වී වරාය සංයුක්ත මණ්ඩලය යටතේ වැඩ කරන සේවකයින්ගේ සංඛ්‍යාව 17,500ක් පමණ වෙනවා. මේ ව්‍යාපාරය ආරම්භ කළ වර්ෂයේම ලක්‍ෂ 28 ක ලාභයක් ලැබුවා. දැන් ලක්‍ෂ 50 ක ලාභයක් ලැබෙනවා. කොළඹ වරාය ලෝකයේ තිබෙන වරායන් අතුරින් වැඩි ලාභයක් ලබාගන්නට පුළුවන් ධන උල්පතක් හැටියට සැලකිය හැකි වරායක්. මේ වරාය මගින් දේශීය හා විදේශීය ධනපති පන්තිය විසින් සූරා ගනු ලැබූ ධනය මහජන සේවයක් සඳහා උපයෝගී කර ගන්නට පුළුවන් අන්දමට මේ සංයුක්ත මණ්ඩලය ආරම්භ කර, වරාය ජනසතු කර, ආදායම රජයට ගැනීමේ කටයුතු ආරම්භ කළේ පසුගිය රජයෙනුයි. එහෙත් කියන්නත් කණගාටුයි, මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසු මෙවැනි ජනසතු ව්‍යාපාර හා සංයුක්ත මණ්ඩලවලට ඉදිරියට යෑමට සිදු වී තිබෙන්නේ මේ රජයේ දූෂණ ක්‍රියාවලට මැදි වෙමිනුයි.

සංයුක්ත මණ්ඩල භාරව සිටින අයට තමන්ගේ වැඩ කටයුතු ස්වාධීනව කර ගෙන යන්නට බැරි තත්ත්වයක් දේශපාලන ඇඟිලිගැසීම් නිසා ඇති වී තිබෙනවා. රක්‍ෂණ සංස්ථාවේ සභාපතිතුමා අස් වී ඇති බව අද පත්‍රයෙන් තමුන්නාන්සේලා දකින්නට ඇති. දේශපාලන ඇඟිලිගැසීම් නිසා එය කරන්නට බැරි යයි ඔහු කෙලින්ම කියා තිබෙනවා. ආණ්ඩු පක්‍ෂයේ මන්ත්‍රීවරුන්ගේ යෝජනා පිළිගන්නට බැරි නිසාත්, පත්වීම් දෙන්නය කියන අයට පත්වීම් දීමට නොහැකි නිසාත්, පස්සා දොරෙන් පත්වීම් නොදෙන නිසාත්, අවංක ලෙස සේවය කරන අයට අද සංයුක්ත මණ්ඩලවල සේවය කරන්නට බැරි තත්ත්වයක් ඇති වී ඒවාට ආයුබෝවන් කියන්නට ඔවුන්ට සිදු වී තිබෙනවා. මේ සංයුක්ත මණ්ඩල මගින් මේ ආණ්ඩුව ගෙන යෑමට සෑහෙන ආදායමක් ලබා දෙන්නේ මෙවැනි කරදරවලට මැදි වෙලයි. ඒ කාලයේ එක්සත් ජාතික පක්‍ෂයේ ආණ්ඩුව ජනසතු ව්‍යාපාරවලට විරුද්ධයි. එසේ වුවත් මේ ආණ්ඩුවේ ජීවය තිබෙන්නේ මේ ජනසතු ව්‍යාපාර මත බව පිළිගැනීමට මේ ආණ්ඩුවට සිදු වී තිබෙනවා. එසේ හිතන උදවිය තුළත් මේවා දියුණු කිරීමටවත්, පුළුල් කිරීමටවත්, තව තවත් ජනසතු ව්‍යාපාර ආරම්භ කිරීමටවත් බලාපොරොත්තුවක් නැහැ. මේ අය එවැනි පියවරක් ගන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට කලින් කථා කළ බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා (මංගල මුණසිංහ මයා.) තේ ව්‍යාපාරය ගැන සඳහන් කළා. තේවලින් විශාල පාඩුවක් සිදු වීගෙන යනවා යයි ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය කථාවේ සඳහන් වෙනවා. මේ ආණ්ඩුවේ තිබෙන දුර්වල ප්‍රතිපත්ති නිසාත්, මේ ආණ්ඩුව අධිරාජ්‍යවාදීන්ට ගැති වීම නිසාත්, මේ ආණ්ඩුව සමාජවාදී කඳවුර සමග මිත්‍රත්වයෙන් කටයුතු කිරීමට ලැහැස්ති නැති නිසාත්, මේ රටට විශාල ආදායමක් ලබා දෙන තේ ව්‍යාපාරයෙන් ඒ ආදායම ලබා ගන්නට බැරි තත්ත්වයක් තේ පිළිබඳව ශත සංවත්සරය පවත්වන මේ අවස්ථාවේ ඇති වී තිබෙනවා.

1956 ට පෙර මේ රටේ තේ ව්‍යාපාරයට විශාල ධනස්කන්ධයක් වියදම් කළා. කොනලාවල ආණ්ඩුව පැවැති කාලයේ මේ රටේ තේ වගාවට විශාල ධනස්කන්ධයක් වියදම් කළා. ඒ මගින් මේ රටේ ආර්ථික තත්ත්වය උසස් කිරීමටයි, ඒ ආණ්ඩුව බලාපොරොත්තු වුණේ. එමෙන්ම මුළු මහත් ශක්තියම යොදා තිබුණේ මේ තේ වගාවටයි. ඒ තත්ත්වය වෙනස් කර මේ රටේ පළමු වැනි වරට ආහාර වගාව සඳහා විශේෂත්වයක් ඇතිව කටයුතු කරන්නට පටන්ගත්තේ 1956 න් පසුවයි.

ආහාර වගාව ගැන කථා කරන විට මේ ආණ්ඩුව පෙන්වන්න උත්සාහ කරනවා, ඒ අය විශාල දේශාලයක් තිබෙන අයය, විරුද්ධ පක්‍ෂයේ සිටින්නේ දේශප්‍රේමීන්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

නොවේය කියා. විරුද්ධ පක්ෂය ආහාර වගාවට විරුද්ධයයි රටට මහජනතාවට පෙන්නුම් කරන්නට ආණ්ඩුව උත්සාහ කරනවා.

අප ආහාර වගාවට විරුද්ධ නැහැ. ආණ්ඩු පක්ෂයේ උදවිය වාගේම අපත් මේ රටට ආදරය කරන, මේ රටේ ජනතාවට ආදරය කරන, මේ රට ඉදිරියට ගමන් කරන්න ඕනෑය කියන අදහසින් ක්‍රියා කරන පිරිසක් බව මා මතක් කරන්න කැමතියි. ඒ නිසා ආහාර වගාවට අප විරුද්ධ නැහැ. එහෙත් මේ ආහාර වගා කිරීම පිළිබඳ කාර්යය කොයි තරම් හොඳ අදහසින් පෙන්නුම් කළත් ඒ යට ඉතාමත්ම නැත අදහස් කීපයක් තිබෙන බව අපට පෙනෙනවා. මා කලිනුත් කිව්වා, ඇත්ත වශයෙන්ම මේ රටේ කාර්මික සංවර්ධනයක් ඇති වුණේ 1956න් පසුවය කියා. මේ රටේ කාර්මික සංවර්ධනයක් ඇති කර, මේ රටින් පිට රටට ඇදී යන ජාතික ධනය මේ රටේම නවත්වා, එවැනි කාර්මික වැඩ කිරීමට පුළුවන් දක්ෂකම් ඇති තරුණයන්ගේ දක්ෂකම්, ඔවුන්ගේ ශක්තිය, ඔවුන්ගේ ශ්‍රමය, ඔවුන්ගේ බුද්ධිය මෙහෙයවා—එය අමු ද්‍රව්‍යත් සමග මිශ්‍ර කර—මේ රටේ ජාතික ධන නිධාන දියුණු කිරීමට නියම අන්දමේ වැඩ පිළිවෙළක් ඇති කෙළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවයි. එදා එවැනි වැඩවලට අධිරාජ්‍යවාදීන් විරුද්ධ වුණා. අධිරාජ්‍යවාදීන්—තමුන්නාන්සේලා දන්නවා ඇති—කිසිම දවසක ලංකාව වැනි නොදියුණු රටවල කර්මාන්ත සංවර්ධනයක් ඇති වනවාට කිසිසේත්ම කැමති නැති බව.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

ඒ කාලයේ කොමියුනිස්ට් පක්ෂය පුළුවන් තරම් විරුද්ධකම් කළා. ඒක මතක තබාගන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

කාටද ?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට කොමියුනිස්ට් පක්ෂය සෑම අවස්ථාවකදීම උදව් උපකාර කළා, ආධාර දුන්නා, රටේ කාර්මික සංවර්ධනයක් ඇති කිරීමට. මේ රට අධිරාජ්‍යවාදීන්ගේ තවලමක් හැටියට තබා ගැනීමට විරුද්ධ වුණා. මේ රට අධිරාජ්‍යවාදීන්ගේ වෙළඳපොළක් හැටියට තබා ගැනීමට විරුද්ධ වුණා. ඒ අනුව නියම අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරයක් කොමියුනිස්ට් පක්ෂය විසින් ගෙන ගිය බව මම තමුන්නාන්සේට මතක් කරන්න කැමතියි. ඒ ප්‍රතිපත්තිය අප ඉදිරියටත් ගෙන යන බවත් ප්‍රකාශ කරන්න කැමතියි.

එහෙත් මේ රජය දැන් කරන්නට සූදානම් වන්නේ කාර්මික සංවර්ධනයට තිබුණ ඒ නැම්ම කෘෂිකර්මය පැත්තට හරවා—ආහාර වගාව පැත්තට හරවා—මේ රටේ කාර්මික සංවර්ධනය තිරයකින් වසා අධිරාජ්‍යවාදීන් සතුටු කරන්නයි. ඒ මොකද ? මේ රටේ කාර්මික සංවර්ධනයක් ඇති වෙනවාට අධිරාජ්‍යවාදීන් කැමති නැහැ. ඒ නිසා අධිරාජ්‍යවාදීන් සතුටු කිරීම පිණිස මේ ආහාර වගාව නමැති කඩතුරාව දමාගෙන, අප කාර්මික සංවර්ධනය වසා දමාය තිබෙන්නේ, ටිකක් නවත්වා දමාය තිබෙන්නේ, ඒ නිසා තමුන්නාන්සේලා අප සමග විරුද්ධ වෙන්න ඕනෑ නැත, අප කාර්මික සංවර්ධනයෙන් ඉදිරියට යන්නෙ නැත, ආහාර සංවර්ධනය තමයි අප ගෙන යන්නෙ කියා මුළු රටේම අවධානය ආහාර වගාව වෙත යොමු කර අධිරාජ්‍යවාදීන් සතුටු කර ඔවුන්ගෙන් ණය මුදල්, ආධාර මුදල් ලබාගෙන ජීවත්වීමට මේ ආණ්ඩුව බලාපොරොත්තු වන බවයි අපට මෙහිදී හොඳින් පැහැදිලිවම පෙනී යන්නෙ.

අනික් අතට ලෝකයේ සහල් නැත කියා හාල් සේරුවක් කපා හැර දැන් දේශප්‍රේමී බවකින් ආහාර වගාව පටන් ගෙන තිබෙනවා. ඒ නිසා මෙය කොයි තරම් හොඳ වැඩක් වුණත් යටි අදහස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

බොහෝම අශෝභනයි. එසේ නැතිව අවංක සිතින් මේ රටේ ආහාර වගාව දියුණු කරන්න ඕනෑය කියා කටයුතු කිරීමට මේ ආණ්ඩුව ලැහැස්ති වනවා නම් ඒ වගා කටයුතුවලට සම්පූර්ණ සහයෝගය දෙන්නට විරුද්ධ පක්ෂයත් ලැහැස්තියි. එහි කිසිම ප්‍රශ්නයක් නැහැ.

හාල් ප්‍රශ්නය ගැන අපේ උප ඇමතිතුමා ලොකුවට දන් කථා කළා. හාල් ප්‍රශ්නයේදී අප කවුරුත් දන්නවා, මෙසේ හාල් සේරුව කැපුවේ ලෝක බැංකුවේ උපදෙස් පිටය කියා. ලෝක බැංකුව තමයි මේ ආණ්ඩුවේ උපදේශකයා ; ගුරුවරයා. ලෝක බැංකුව මේ ආණ්ඩුවට කිව්වොත් ඔළුව පහතට දමා කකුල් දෙක ඉහළට දා සිටින්නය කියා ඒ විධියට ඉන්නත් මේ ආණ්ඩුව ලැහැස්තියි. ආණ්ඩුවෙ මොළේ තිබෙන්නේ ලෝක බැංකුව තුළයි. ලෝක බැංකුවෙ තමයි මේ ඇමති මණ්ඩලයේ මොළ තිබෙන්නේ. ඒ නිසා ලෝක බැංකුවෙ කල්පනාව අනුව තමයි මේ ආණ්ඩුව ක්‍රියා කරන්න සූදානම් වී සිටින්නෙ. ලෝක බැංකුව සෑම තිස්සේම උත්සාහ කරන්නේ මේ රටේ වහල් ආර්ථික ක්‍රමයක් ඇති කිරීමටයි, මේ රටේ වහල් ආර්ථික ක්‍රමයක් පැලපදියම් කරවීමටයි. මේ රටේ නිදහස් ආර්ථික ක්‍රමයක් ඇති වීමට ලෝක බැංකුව ඉඩ දෙන්නේ නැහැ. එපමණක් නොවෙයි, සෑම නොදියුණු රටවලම ආර්ථික ක්‍රමය බැඳ තබා ගැනීමට තමයි ඔවුන් උත්සාහ කරන්නේ.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்னே)*
(The Hon. N. H. A. M. Karunaratne)

අපි කරන්නෙ මා වෝ සේතුං කියන විධියට.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

බොහොම හොඳයි, එහෙමවත් කරනවා නම් සතුටු වෙන්න පුළුවනි. නමුත් නමුත්නාන්සෙලා මා වෝ සේතුං කියන විධියටවත්, වෙනත් පුද්ගලයකු කියන විධියටවත් කටයුතු කරන්නේ නැහැ. ලෝක බැංකුව කියන විධියට පමණයි කටයුතු කරන්නෙ. ලෝක බැංකුව කියන විධියට කටයුතු කිරීමෙන් අපට නිදහස් ආර්ථික ක්‍රමයක් කවදාවත් ඇති කර ගන්න ලැබෙන්නෙ නැහැ. එමනිසා ලෝක බැංකුවට ඇති වහල් භාවය නැති කර දමන්න ඕනෑ. ලෝක බැංකුවෙ දමා තිබෙන මේ ආණ්ඩුවෙ මොළය එළියට ගෙන, එය නිදහස්ව කල්පනා කරන්න ශක්තියක් ඇතිවන විධියට හැඩ ගස්වන්න ඕනෑ. ඒ මාර්ගයෙන් තමයි වහල් ආර්ථික ක්‍රමය නැති කර මේ රටේ නිදහස් ආර්ථික ක්‍රමයක් සකස් කරන්න පුළුවන් වන්නේ. ඒ වාගේම අපේ තේ කර්මාන්තය දියුණු කර ගන්න පුළුවන් වෙන්නෙ සමාජවාදී රටවල් සමග සම්බන්ධවී ක්‍රියා කළොත් පමණයි. එමෙන්ම අපේ සුළු තේ වතු හිමියන්ට සෑහෙන තරම් ආධාර කරන්න ඕනෑ. මන්ද ? පහත රට සුළු තේ වතු හිමියන්ගෙන් මෙරට තේ නිෂ්පාදනයට විශාල සේවයක් සිදුවෙනවා. ඔවුන්ගේ තේ වගාවට වැඩි වැඩියෙන් ආධාර කළ යුතුව තිබෙනවා. උඩරට විශාල වතු හිමියන්ට, දේශීය හා විදේශීය විශාල කොම්පැනි කාරයින්ට ආධාර දීමේ ක්‍රමය වෙනුවට පහත රට සුළු තේ වතු හිමියන්ට ආධාර කිරීමේ වැඩ පිළිවෙළක්, සැලැස්මක් ක්‍රියාවේ යෙදීම ඉතාමත්ම අවශ්‍ය වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය ඇමතිතුමාගෙ කථාව අප අසාගෙන සිටියා. ඇත්ත වශයෙන්ම අප බලාපොරොත්තු වූයේ මෙමම අයවැය වාර්තාව ගැන සෑහෙන යමක් ප්‍රකාශ කරාවිය කියායි. එතුමාගෙ මුළු කථාවෙන්ම උත්සාහ කළේ මේ රට ජීවත් කරන්න පුළුවන් එකම සින්දූරම, නැතිනම් ඉන්ජෙක්ෂන් එක, විදේශ සංචාරක සේවයක් ඇති කිරීම බව පැහැදිලි කිරීමටයි. මුළු ලෝකයෙන්ම නිදර්ශන අරගෙන එතුමා පෙන්නුම් කළා, සංචාරක සේවයක් ඇති කිරීමෙන්, එමගින් ලැබෙන ආදායමින් තමයි මේ රට ජීවත් කරන්න පුළුවන් වන්නෙ කියා. ඒ අදහස පෙර ඇරි කරගෙන තමයි එතුමා කරුණු ඉදිරිපත් කළේ. එතුමා කීව හෝටල් ගණනාවක් ඇති කරන්න බොහොම ඉක්මනින් කටයුතු කරගෙන යනවාය කියා. මම ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමතියි, විදේශ සංචාරකයින් සඳහා සැපපහසුකම් සලසන්න කල්පනා කරතත් අපේ රටේ, අභ්‍යන්තර සංචාරකයින් සඳහා සැහෙන සැපපහසුකම් ඇති කර තිබෙනවාද කියා. අපේ රටේ උතුරේ උදවිය තිස්සමහාරාම, කතරගම ආදී පූජනීය ප්‍රදේශවල සංචාරය සඳහා එහෙම නැතිනම් වන්දනාව සඳහා යනවා. ඒ වාගේම දකුණු ප්‍රදේශවල උදවිය, පොළොන්නරුව, අනුරාධපුරය, මිහින්තලේ ආදී පූජනීය ප්‍රදේශ වන්දනා කිරීම සඳහාත් සීගිරිය වැනි ස්ථාන නැරඹීම සඳහාත් යනවා. මේ අන්දමට ලංකාවෙ සිඩස්ථාන වන්දනාමාන කර ගැනීම පිණිසත්, ඓතිහාසික ස්ථාන නැරඹීම පිණිසත් විශාල සංඛ්‍යාවක් යන බව අප දන්නවා. රට ඇතුළේ සිටින අපේ ඒ සංචාරකයින්ට සැහෙන විධියෙ සැපපහසුකම් ඇති කරන්න ඕනෑ නො වෙද, පිටරටින් පැමිණෙන සංචාරකයින් ගැන කටයුතු කරන්න පෙර?

මුහුදුබඩ දුම්රිය මාර්ගය අවසන් වෙන්නෙ මාතරින්. මාතර ප්‍රධාන දුම්රිය මධ්‍යස්ථානයක්. මෙම ස්ථාන යට මේ වන තෙක් විශ්‍රාම ශාලාවක් තනා දීමට උනන්දුවක් ගෙන නැහැ. කතරගම, දෙවුන්දර වැනි සිඩස්ථාන වන්දනාමාන කර ගැනීමට පැමිණෙන වන්දනා කරුවන්ට රැඳී සිටින්න සථානයක් නොමැතිව වේදිකාවෙ වැතිර සිටින හැටි දකින්න කාට වුණත් ඇති වෙන්නෙ කන ගාටුවක්. ඒ උදවියට විශ්‍රාම ගැනීමට තැනක් නැහැ. අවුරුදු පතා අයවැය ලේඛනයෙන් මුදල් වෙන් කළත්—මෙවරත් වෙන් කර තිබෙනව—අද වන තුරු ඒ සම්බන්ධයෙන් කිසිම වැඩක් කර නැහැ. මෙන්න මේ විධියටයි, අපේ දේශීය සංචාරකයින් ගැන කටයුතු කරන්නෙ. නමුත් විදේශික සංචාරකයින්ට සැප පහසුකම් සැලසීමට උනන්දු වෙනවා. ඒකයි මේ ආණ්ඩුවෙ ප්‍රතිපත්තිය.

මෙයට පෙර ආණ්ඩු පක්ෂයෙන් කථා කළ ගරු මන්ත්‍රීවරුන් කිව, මේ ආණ්ඩුව ලොකු වැඩක් කර තිබෙනවාය, රුපියල් සියයට අඩු වැටුපක් ලබන රජයේ සේවකයින්ට රුපියල් 20 බැගිනුත්, රුපියල් තුන් සියයට අඩු වැටුපක් ලබන අයට රුපියල් 10 බැගිනුත් වැටුප් වැඩි කර තිබෙනවාය කියා. මම ඒ ගරු මන්ත්‍රීවරුන්ගෙන් අහන්න කැමතියි, මේ රටේ ජීවත්වෙන්නෙ ලිපිකරුවන් පමණක්ද? රජයේ සේවකයන්, පළාත් පාලන සේවකයන්, ගුරුවරුන් පමණක්ද මේ රටේ ජීවත්වන්නෙ, අනික් අංශවල උදවිය ජීවත්වන්නෙ නැද්ද? මේ රටේ ජාතික ආදායම උපදවන තේ කර්මාන්ත යෙහි, පොල් කර්මාන්තයෙහි යෙදී සිටින කොපමණ සංඛ්‍යාවක් සිටිනවාද? ඒ උදවියගෙ තත්ත්වය මොකක්ද? සංයුක්ත මණ්ඩලවල වැඩ කරන අයගේ තත්ත්වය මොකක්ද? මේ රටේ ඉතාමත් අවශ්‍ය ආහාරයක් සපයන ධීවර කාර්මිකයන්ගේ තත්ත්වය මොකක්ද? මුළු මහත් ජනතාවම ඉතාමත් අමාරුවෙන් ජීවත් වෙද්දී ලිපිකරුවන්ටත්—ලිපිකරුවන් ගෙනුත් සුළු කොටසකටයි, මේ මුදල ලැබෙන්නෙ—පළාත් පාලන සේවකයන් ගෙන් සුළු කොටසකටත් ඉතා සුළු දීමනාවක් ගෙවීමට මුදල් වෙන් කර පුරසාරමක් වශයෙන් කියා සිටිනව, "වෙන කිසිම ආණ්ඩුවක් මේ විධියේ දෙයක් කළේ නැහැ. අපි තමා කළේ" කියා.

පසුගිය රජයෙන් රුපියල් 17.50 ක විශේෂ ජීවනාධාර මුදලක් ඇති කළා. ඒ ජීවනාධාරය වතු කම්කරුවන්ටත් දෙන්න කියා අපි ඉල්ලීමක් කළා. ඒ සම්බන්ධ යෙන් මැද කොළඹ තුන් වෙනි ගරු මන්ත්‍රීතුමා (කෙනමන් මයා.) විසින් මේ සභාවට යෝජනාවකුත් ඉදිරිපත් කළා. එහිදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් මොන වද කිව්වෙ? "17.50 ක් මදි. දවසකට රුපියල ගණනේ රුපියල් 30 ක් වැඩි කරන්න ඕනෑ" කියා ඒ යෝජනාව පරාජය කර කුණු කූඩයට දැම්ම. රුපියල් 17.50 විශේෂ ජීවනාධාරය වතු කම්කරුවන්ටත් ලබා දෙන්න මේ ආණ්ඩුව ලැහැස්ති නැහැ. රජයේ සේවකයන්ට ලැබෙන මේ මුදල අනිකුත් අංශවල සේවකයන්ටත් ලබා දෙන්න මේ ආණ්ඩුව කට යුතු කරන්නෙ නැහැ. එහෙත් අනික් පැත්තෙන් ගුරුවරුන්ටත්, රජයේ සේවකයන්ටත්, පළාත් පාලන සේවකයන් වත්, මේ අළුත් දීමනාව ලබා දී ඒ මාර්ග යෙන් ලොකු සේවයක් කර ගන්න ආණ්ඩුව බලාපොරොත්තු වෙනවා. ඒ සේවය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

මොකක්ද? ගරු නියෝජ්‍ය කථානායක තුමනි, මේ ආණ්ඩුව ඒ මගින් බලා පොරොත්තු වෙන්නෙ මේ රටේ වෘත්තීය සමිති ව්‍යාපාරයට පහර ගහන්න පුළුවන්ද කියා අත්හදා බලන්නයි. වෘත්තීය සමිති අතර භේදයක් ඇති කිරීම මෙහි පරමාර්ථයයි. මේ විධියට එක පැත්තක් අල්ලා ගෙන, එක අංශයකට සුළු ගණනක් වැඩි කරල මේ රටේ වෘත්තීය සමිති ව්‍යාපාරය බිඳ හෙළන්න බැරි බව මා ආණ්ඩුවට මතක් කරන්ට කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කලින් කථා කළ පාර්ලිමේන්තු ලේකම් තුමා කිව්ව පසුගිය රජය රුපියල් 17.50 විශේෂ ජීවනාධාරය ලබා දුන්නෙ උන්නැහේලට ගස්සවන්නය, හිරිහැර කරවන්නය කියා. මේ ආණ්ඩුවත් මේ රුපියල් 20 සහ රුපියල් 10 වැඩි කළේ ඒ අදහසින්දැයි මා අහනව. උන්නැහේලා ගේ යටි අදහස තමයි මේකෙන් කියවුණේ. උන්නැහේලාගේ අදහස මේ මගින් මේ රටේ වෘත්තීය සමිති ව්‍යාපාරය බිඳ දැමීම වයි. "මේ රටේ වැඩි වන ජීවන වියදම උහුල ගන්න බැහැ. ආහාර ද්‍රව්‍යවල මිළ වැඩියි. ඒ නිසා අපේ මූලික පඩිය රුපියල් 30 කින් වැඩි කරන්න" යයි මේ රටේ වෘත්තීය සමිති ව්‍යාපාරය රජයෙන් ඉල්ලා සිටියා. එපමණක් නොවෙයි, හාල් සලාකය අඩු කිරීමෙන් පසුව තවත් රුපියල් 30 ක් වැඩි කරන ලෙස ඔවුන් ඉල්ලා සිටිය. "හාල් සේරුවක් අඩු කිරීම නිසා අපට අනික් සේරුව ලබා ගන්න කළුකඩයට ගියාම මෙතරම් මුදලක් වියදම් වෙනව. ඒ නිසා අපේ මූලික වැටුප තවත් රුපියල් 30 කින් වැඩි කරන්න" යයි ඔවුන් නැවතත් ඉල්ලීමක් ඉදිරිපත් කළා. ඒ අන්දමට මාසයකට රුපියල් 60 කින් ඔවුන්ගේ මූලික වැටුප වැඩි කරන ලෙස වෘත්තීය සංගම් රජයෙන් ඉල්ලා සිටිය. මේ ආණ්ඩුව කොටසකට රුපියල් 10 කුත්, තවත් කොටසකට රුපියල් 20 කුත් අතිරේක දීමනාවක් වශයෙන් ලබා දී ප්‍රශ්නය විසඳන්න උත්සාහ කරනව. මෙය පෙන්නුම් කරන්නෙ මහා ලොකු වැඩක් හැටියටයි. කම්කරු පන්තිය භේද කිරීමේ අදහසින් මේක කළත් ඒ අදහස ඉෂ්ට නොවන බව අපි කියනව.

මේ ආණ්ඩුව රුපියල් 20 සහ රුපියල් 10 වශයෙන් දෙන්න යන දීමනාවට රුපියල් කෝටි 6 ක් වැය වෙනව. ඒ ගමන් මේ ආණ්ඩුව අනික් පැත්තෙන් කෝටි 9 1/2 ක් ඔවුන්ගෙන්ම අය කර ගන්න යෝජනා කරනව. මේ විධියෙ කියමනක් තිබෙනව:

"සුරතින් පුදනී වම් අත නොමදැන නදන
තිළිනෙන් පසිඳු අය වෙත උවමකි යොදන"

ත්‍යාගශීලී උදවිය වම් අත නොදැනුවත්ව දකුණු අතින් දෙනවලු. මේ ආණ්ඩුව එක අතකින් දෙනව; අනික් අතින් ඊට වඩා උදුරා ගන්නවා. ඒ වගේ ත්‍යාගශීලී ආණ්ඩු වක් මේ. පඩි වැඩි කිරීමේ ආවේශයෙන් එක අතකින් කෝටි 6 ක් දීල අනික් අතින් කෝටි 9 1/2 ක් ඔවුන්ගෙන්ම උදුරා ගන්නවා. ඒ වගේ ත්‍යාගශීලී ආණ්ඩු විශාල ඇස්බැන්දුමක් තමයි, කරගෙන යන්නෙ. රජයේ සේවකයන්ගේත්, ගුරුවරුන්ගේත්, පළාත් පාලන සේවකයන් ගේත පඩි වැඩි කරනවාය කියා ඒ මුවාවෙන් මහජනයා මුළා කිරීමට, වෘත්තීය සමිති ව්‍යාපාරය මොට කිරීමට, මේ ආණ්ඩුව උත්සාහ කරන බවයි මෙයින් පෙනී යන්නෙ.

පඩි වැඩි කිරීම් සම්බන්ධයෙන් කොමිෂන් සභාවක් පත් කරන බව මෙම අයවැය ලේඛනයෙහි කියා තිබෙනවා. එය මහ විහිළුවක්, බොරුවක්. පඩි වැඩි කිරීමට කොමිෂන් සභා පත් කරන්නට වුවමනාවක් නැහැ. දැනටත් රුපියල් 10 ක් හා 20 ක් වැඩි කර තිබෙනවා. ඒ සඳහා කොමිෂන් සභා පත් කෙළේ නැහැ. කම්කරු පන්තියේත් වෘත්තීය සමිති වලත් ඉල්ලීම් කොමිෂන් සභා පත් නොකර හරියාකාර ඉෂ්ට කරන්නට මේ ආණ්ඩුවට පුළුවන් කමක් නැද්ද? සමූපකාර සේවක කොමිෂන් සභාවක් පත් කිරීමට බලාපොරොත්තු වන බවත් මේ රජය කියා තිබෙනවා. එසේ නම්, එයින් සමූපකාර ව්‍යාපාරය ගැන පමණක් නොව සමූපකාර සේවකයින්ගේ පඩිනඩි වැඩි කිරීම ගැනත් ඔවුන්ගේ තත්ත්වය උසස් කිරීම ගැනත් සොයා බලා කටයුතු කරනු ඇතැයි මා විශ්වාස කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ රජය දැන් ලිපිකරුවන් වැනි සේවක කොටස් සන්තෝෂ කරන්නට උත්සාහ දරතත්, 1966 ජනවාරි 8 වැනි දා පැවැති වැඩ වර්ජනය සම්බන්ධයෙන් මේ රජය ගත් පියවර ලිපිකරුවන් ආදී රජයේ සේවක කොටස්වලට අමතක වන්නේ නැහැ. ඉතාමත් දරුණු විධියට රජයේ සේවකයින්ට පහර ගැසූ ආණ්ඩුවක් මේ හත් හවුල් රජය. මේ රජය විසින් රජයේ සේවකයින්ට දෙන ලද දඬුවම් තවමත් ඉවර වී නැහැ. තවමත් සමහර අය වැඩ තහනම් කරනු ලැබ සිටිනවා. සමහර උදවිය සේවයෙන් අස් කර දමා සිටිනවා. මේ විධියටයි මේ ආණ්ඩුව වැඩ කරගෙන ගියේ.

වෘත්තීය සමිති ව්‍යාපාරයට ආධාර කරන බවද මේ රජය කියතත්—වෘත්තීය සමිති නිලධාරීන් මාරු නොකරන බවට රජයේ පොරොන්දුවක් තිබියදීත්— එම නිලධාරීන් නොයෙක් තැන්වලට මාරු කර යවා තිබෙනවා. ඒ අන්දමින් ළඟදීම කරන ලද මාරුව කාර්මික නිලධාරීන්ගේ වෘත්තීය සමිතියේ ප්‍රධාන ලේකම් තැන මාරු කර යැවීමයි. මෙවැනි මාරුකිරීම් තවත් රාශියක් තිබෙනවා. මේ විධියට වෘත්තීය සමිති සම්බන්ධයෙන් මහජනතාවට දෙන ලද පොරොන්දුවක් කඩා දමා මේ ආණ්ඩුව දැන් කටයුතු කරගෙන යනවා.

1966 ජනවාරි 8 වැනිදා වැඩ වර්ජනය කළ නිසා අස් කරන ලද අය දැන් නැවතත් හෙමින් හෙමින් ආපසු වැඩට ගැනීමට පටන් ගෙන තිබෙනවා. එහෙත්, ඔවුන් බඳවා ගනු ලබන්නේ, එක්සත් ජාතික පක්ෂයේ ප්‍රාදේශීය නායකයින් මාර්ගයෙනුයි. මොකක්ද මේ ප්‍රතිපත්තිය ? මෙයින් රජය අදහස් කරන්නේ මොකක්ද ? මේ ක්‍රමයෙන් මෙම සේවකයින් එක්සත් ජාතික පක්ෂයට ගොදුරු කර ගන්නට පුළුවන් වේයයි රජය බලාපොරොත්තු වෙනවාද ? මධ්‍යස්ථව කල් පනා කරන අය තුළ මෙම ආණ්ඩුව කෙරෙහි ඇති අප්‍රසාදය මෙයින් තව තවත් වැඩි දියුණු වෙනවා මිස එහි අඩුවක් වෙනවාද ? මෙවැනි තත්ත්වයක් තිබෙන නිසා තමයි, ලිපිකරුවන් ආදීන්ගේ පඩි වැඩි කිරීමට රජය අදහස් කරන්නේ.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
ඉතින් මොකක්ද කරන්න කියන්නෙ ? පඩි කපන්න කියනවද ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඒක තමුන්නාන්සේලාට අයිති වැඩක්.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
තමුන්නාන්සේ කියන ප්‍රතිකර්මය මොකක්ද ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
සංයුක්ත මණ්ඩලවල සේවකයින්, සමුපකාර සේවකයින් ආදීන්ටත් මේ වැඩි වීම් ලබා දෙන්න. ඒ සේවකයින් කන්නේ බොන්නේ අඳින්නේ නැද්ද ? තමුන්නාන්සේලාට රටේ පාලනය හරිහැටි කරන්නට බැරි නම්, කාටත් ජීවත් වන්නට පුළුවන් අන්දමට පඩියක් දෙන්නට තමුන්නාන්සේලාට බැරි නම්, ඒ අපගේ වරදක්ද ?

අධ්‍යාපන වියදම් සම්බන්ධයෙනුත් මෙම අයවැය ලේඛනයෙහි කරුණු කියා තිබෙනවා. එහෙත් මේ රටේ තිබෙන පෞද්ගලික පාඨශාලා ප්‍රශ්නය සම්බන්ධයෙන් නියම පිළිතුරක් තවමත් මේ රජය විසින් අපට දීලා නැහැ. පෞද්ගලික පාඨශාලා සම්බන්ධයෙන් මේ රජය සාධාරණය ඉෂ්ට කළ යුතු බව මීගමුවේ ගරු මන්ත්‍රීතුමා (එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.) ප්‍රකාශ කර තිබෙනු මා ප්‍රවෘත්ති පත්‍රයෙන් දැක්කා. ගරු අගමැතිතුමා තමන් කියන වචනය ඒ සැටියෙන්ම ඉෂ්ට කරන කෙනකු නිසා පෞද්ගලික පාඨශාලා සම්බන්ධයෙන් වූ පොරොන්දුව රජය විසින් ඉෂ්ට කළ යුතුයයි පුවත්පත් කියනවා. මේ කියන පොරොන්දුව කුමක්දැයි අප දන්නේ නැහැ. පෞද්ගලික පාඨශාලාවලට මුදල් අය කිරීමට ඉඩ දෙනවාද. එසේ නැත්නම් ඒවත් ජාතික අධ්‍යාපන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]
ක්‍රමයට ඇතුළත් කරනවාද, යන ප්‍රශ්නය අප කෙලින්ම රජයෙන් අහනවා. ආණ්ඩුව ඒ පිළිබඳව අනුගමනය කරන ප්‍රතිපත්තිය කුමක්ද කියා අපට දැනගන්නට ඕනෑ. විශේෂයෙන්ම මීගමු අතුරු මැතිවරණය මේ අවස්ථාවේදී වැදගත් වෙනවා.

පෞද්ගලික පාඨශාලාවලට දැන් මේ ආණ්ඩුව කුමක් කරන්නටද බලාපොරොත්තු වෙන්නෙ? නැවතත් මුදල් අය කරන්නට ඉඩ දෙනවාද? එවැනි බලාපොරොත්තුවක් තිබෙනවාද? එහෙම නැත්නම් ජාතික අධ්‍යාපන ක්‍රමයක් සකස් කිරීමට කටයුතු කිරීමක් වශයෙන් මේ සියලුම පෞද්ගලික පාඨශාලා පවරා ගන්නවාද? මේක ලොකු ප්‍රශ්නයක්. පාඨශාලා රජයට පවරා ගැනීමේදී ආගම විනාශ වේය කියා ඒ කාලයේ ලොකු බියක් තිබුණා. එහෙත් දැන් ඒ බිය නැහැ. පාඨශාලා රජයට පවරා ගැනීම නිසා ආගම විනාශ වුණේ නැහැ. හැම ආගමකටම අයත් පාඨශාලා රජයට පවරා ගත්තා. බෞද්ධ පාඨශාලාත් ගත්තා. බෞද්ධයින්ගේ ඉතාමත්ම උසස් පාඨශාලාත් ගත්තා. ඒවාගේම අනෙකුත් ආගම්වලට අයත් පාඨශාලාත් රජයට පවරා ගත්තා. කිසිම අසාධාරණයක් සිදුවුණේ නැහැ. ආගම විනාශ වුණේ නැහැ. සංස්කෘතිය විනාශ වුණේ නැහැ. එම නිසා ආණ්ඩුව පෞද්ගලික පාඨශාලා පිළිබඳව පැහැදිලි ප්‍රකාශයක් කරන්නට ඕනෑ. හැමදාම ඔය විධියට ප්‍රශ්නයට මුහුණ නොදී දුවල බේරෙන්නට බැහැ. මේ ප්‍රශ්නය විසඳන්න. කෙලින්ම ප්‍රශ්නයට මුහුණ දී ප්‍රශ්නය විසඳන්න. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය මේ ගරු සභාවටත් රටටත් පැහැදිලි කර දෙන්නට ඕනෑ. එම නිසා පෞද්ගලික පාඨශාලා පිළිබඳව කෙලින්ම උත්තරයක් දෙන්න. මේ ආණ්ඩුව ඒ පිළිබඳව ගන්නා පියවර කුමක්ද? අපට ඒක දැනගන්නට ඕනෑ.

පෞද්ගලික පාඨශාලාවලට අද දෙමව්පියන් බොහොම අමාරුවෙන් තමයි දරුවන් යවන්නෙ. කෙලින්ම මුදල් අය නොකළාට නොයෙක් මාර්ගවලින් මුදල් අය කර ගන්නවා. මහජනතාවගේ දහඩිය මහන්සිය සූරා ගන්නවා. සමහර පෞද්ගලික පාඨශාලාවල මුදල් අය කරන හැටි මා දන්නවා. ඒවාට ගෙනෙන අභ්‍යාස පොත් වෙනත් කවරවල දමන්නට ඕනෑ. එකක් ශත 25 බැගින් ඒ කවර පාඨශාලාවෙන් තමයි ගන්නට ඕනෑ. මේ ආදී නොයෙකුත් ක්‍රමවලින් මේ පෞද්ගලික පාඨශාලා මහ ජනතාව සූරා කනවා. මේක ආගම් පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. එක්තරා ආගමකට විරුද්ධව කරන චෝදනාවක් නොවෙයි. හැම ආගමිකටම අයත් උදවිය මේ රටේ සාධාරණ අන්දමින් ජීවත් වෙන්නට ඕනෑ. අපට ආගම් භේදයක් වුවමනා නැහැ. අපට ජාති භේදයක් වුවමනා නැහැ. එහෙත් මේ රටේ අධ්‍යාපන තත්ත්වය මේ විධියට තිබෙන්නට ඉඩ හරින්නට අප කැමති නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
කරුණාකර ඉක්මණින් අවසාන කරන්න.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
වලිගය ඉතිරි කළා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
තමුන්නාන්සේලා ඒ වලිගයත් ගන්නට ලැස්තිද? එහෙම නැත්නම් කඳත් එක්ක ආපසු දෙන්නට ලැස්තිද කියා අපට දැනගන්නට ඕනෑ.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
තමුන්නාන්සේලා කෝ ඒක කළා? ගන්න කොට ඔක්කොම ගන්න එපායැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ නිවාස ගොඩනැගීම සඳහා වැඩියෙන් ආධාර දෙනවාය කියා මෙහි සඳහන් කර තිබෙනවා. එහෙත් නිවාස ගොඩනැගීම සඳහා ණය මුදල් ලබා ගන්නා උදවිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිවාස සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය, සනීපාරක්ෂක උපකරණ, වීදුරු, යකඩ බඩු යනාදිය නියම මිළකට, සැලන මිළකට ලබා ගන්නට නොහැකිවීම නිසා ඉතාමත් අමාරු තත්ත්වයකට වැටී සිටිනවා. එමනිසා නිවාස ණය දෙනවා වාගේම නිවාස සෑදීමට අවශ්‍ය උපකරණ හා බඩු බාහිරාදියත් සාධාරණ මිළකට ලබා ගන්නට කටයුතු සැලැස්වීම ආණ්ඩුවේ යුතුකමක්. කලුකඩකාරයින්ට මේ රටේ මහජනතාව සූරා කන්නට ආණ්ඩුව ඉඩ දෙනවා නම් මහජනතාව ලබා ගන්නා ඒ ණය මුදල්වලින් නිවාස තනන්නෙ කොහොමද ? එමනිසයි නිවාස තැනීමට අවශ්‍ය ද්‍රව්‍ය සාධාරණ මිළකට ලබා ගැනීමට වැඩ පිළිවෙළක් සකස් කරන්නටය කියා අප කියන්නෙ.

ඊළඟට, ගොවීන්ගේ ප්‍රශ්න ගැන බලමු. අද එක පොලීකාරයකුගෙන් තවත් පොලීකාරයකුට මේ ගොවීන් ගොදුරුකර තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

තමුන්නාන්සේට දැන් විනාඩි 10 ක් වැඩිපුර දුන්නා.

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

තව විනාඩි 5 කින් මගේ කථාව අවසාන කරනවා.

ඒ කාලයේ සියයට 9 පොලියට ගොවීන්ට ණය දුන්නා. දැන් ගොවීන්ට සියයට 12 පොලියට ණය මුදල් ගන්නට සිදුවී තිබෙනවා. එක පොලීකාරයකුගෙන් තවත් පොලීකාරයකුට ගොවියා බිලි කර තිබෙනවා. මේ ආණ්ඩුව ක්‍රියා කර තිබෙන්නෙ ඒ විධියටයි. ලොකු ධනපතියන්ට නම් අඩු පොලියට බැංකුවලින් ණය මුදල් ලබා ගන්නට පුළුවනි. එහෙත් ගොවියාට ආධාර කරනවාය කියන, ගොවියා රජකරවනවාය කියන මේ ආණ්ඩුව ගොවීන්ට ණය මුදල් දෙන්නෙ සියයට 12 පොලියකටයි. ඉතින් කොහොමද මේ රට සංවර්ධනය කරන්නෙ ?

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

කරුණා කර දැන් කථාව අවසාන කරන්න.

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

තව විනාඩි දෙකකින් මගේ කථාව අවසාන කරනවා.

ඉදිරිපත් කර තිබෙන මේ යෝජනා මඟින් මේ රටේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීමට මේ ආණ්ඩුවට පුළුවන්කමක් නැහැ. රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීමට දකුණු කොරියාව කරන්නා වාගේ කරන්නයි, මේ ආණ්ඩුවට සිද්ධ වී තිබෙන්නේ. ඒ රටේ උගත් තරුණයන් වියට්නාමයට යවනවා. ඒ රටේ වාගේම මේ රටේත් උගත් තරුණයන් පිටරට යැවීම වහල් වෙළෙඳාමට තැබීම හැරෙන්නට, රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්නට මේ ආණ්ඩුවට වෙන කිසිම විධියක් නැහැ. ඇමෙරිකන් අධිරාජ්‍යවාදීන්ගේ බලපෑම්වලට යටවී කටයුතු කරන ආණ්ඩුවකට තිබෙන්නේ ඒ අධිරාජ්‍යවාදීන් සතුටු කිරීම සඳහා කටයුතු කිරීම පමණයි. ඒ අනුව සකස් වුණු මේ අයවැය ලේඛනය ධනපති පන්තියේ අයවැය ලේඛනයක් බව කියන්නට කැමතියි. මෙයින් දුප්පතාට කිසිම සහනයක් ලැබෙන්නේ නැහැ. තමුන්නාන්සේට ස්තුතියි.

**එකල්හි වේලාව අ. භා. 8 වූයෙන් කටයුතු අත්සිටුවා විවාදය කල් තබන ලදී.**

**එතැන් සිට විවාදය 1967 අගෝස්තු 3 වන බ්‍රහස්පතින්දා පවත්වනු ලැබේ.**

*அப்போது பி. ப. 8 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பெற்றது.*

1967 *ஆகஸ்ட் 3, வியாழக்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.*

*It being 8 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Thursday, 3rd August 1967.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී:**

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය".—[ගරු ඩඩ්ලි සේනානායක]

"சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக".—[கௌரவ டட்லி சேனநாயக்க] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினு எடுத்தியம்பப்பெற்றது.

*Motion made, and Question proposed,*

"That the House do now adjourn".—[*The Hon. Dudley Senanayake*].

**සෙනරත් මයා.**

*(திரு. செனரத்)*

(Mr. Senerath)

නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය පිළිබඳව මා ගරු අගමැතිතුමාට කලින් දන්වා තිබෙනවා. අමෙරිකන් සාම හමුදාව — American Peace Corps — සඳහා ලංකාවෙන් එක්තරා පිරිසක් තෝරා යැවීම ගරු අගමැතිතුමා අනුමත කර තිබෙනවා. මා දැන් ගන්නට කැමතියි, මේ පිරිසගේ නම්.

මට ලැබී තිබෙන ආරංචි අනුව, ගරු අගමැතිතුමා කරුණු නිසි ලෙස සලකා අනුමත කළ ලැයිස්තුවේ, නම් කීපයක් කපා හැර වෙනත් නම් කීපයක් ඇතුළත් කිරීමට එක්තරා පිරිසක් මහන්සි ගන්නවා. මේ සාම හමුදාව ගැන අපේ නම් වැඩි විශ්වාසයක් නැහැ. ඒ වුණත් මුලින් තේරූ—ගරු අගමැතිතුමා අනුමත කළ—නම් ලැයිස්තුවෙන් නම් කපා හැර, ඥාති සවාරියක් ගැසීම සඳහා අළුතින් විධායක නිලධාරීන්ගේ නම් එයට ඇතුළත් කිරීමට මහන්සි ගන්නා බව අපට ආරංචි වී තිබෙන නිසා, මේ නම් ලැයිස්තුව දැන ගැනීමට මා සතුටුයි. ඔබතුමා අනුමත කළ නම් වෙනස් නොකරන ලෙස තරයේ ඉල්ලා සිටිනවා.

අ. භා. 8.02.

**ආර්. එම්. අප්පුහාමි මයා.** (බණ්ඩාරවෙල)

*(திரு. ஆர். எம். அப்புஹாமி—பண்டாரவளை)*

(Mr. R. M. Appuhamy—Bandarawela)

නියෝජ්‍ය කථානායකතුමනි, ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාගෙන් ඇසීමට බලාපොරොත්තු වන ප්‍රශ්නයට අදාළ ලිපියක් මා ළඟ තිබෙනවා. එය මා දැන් තමුන්නාන්සේ ඉදිරියේ කියවන්නට සූදානම්:

"1967 ජූලි 24 වන දා.

**ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාගේ චාරිකාව**

ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා බණ්ඩාරවෙල සහ වැලිමඩ මැතිවරණ කොට්ඨාශ දෙකේ චාරිකාවක් සඳහා පැමිණෙන බව එතුමාගේ ස්ථිර ලේකම්තුමා මා වෙත දන්වා ඇති අතර, එතුමා මෙදින පෙරවරු 8 සිට දවල් 12 දක්වා බණ්ඩාරවෙල මැතිවරණ කොට්ඨාශයේද, පස්වරු 2 සිට පස්වරු 6 දක්වා වැලිමඩ මැතිවරණ කොට්ඨාශයේද මිඩංගු කිරීමට නියමිතව ඇත.

2. බණ්ඩාරවෙල මැතිවරණ කොට්ඨාශයේ වැඩ සටහන කොළොන්න මහජන මන්ත්‍රී සී. නන්ද මැතිව් මහතා හා ඔබගේ සම්බන්ධය ඇතිව සකස් කළ යුතු බැව් ස්ථිර ලේකම් වැඩිදුරටත් දන්වා ඇත. මේ නිසා කොළොන්න මහජන මන්ත්‍රී හා ඔබ එක්ව මේ පිළිබඳව සාකච්ඡා කර, ඒකාබද්ධ වැඩ පිළිවෙලක් සකස් කර, කල්වේලා ඇතිව මා වෙත එවන්නේ නම් අගය කොට සලකමි. මේ වැඩ පිළිවෙළ ගැන කොළොන්න මහජන මන්ත්‍රී හා ඔබ මා සමඟ සාකච්ඡා කිරීමට කැමති නම් එසේ සාකච්ඡා කිරීම සඳහා මා මුණගැසීම පහසු නම්, 67.8.12 දින පෙරවරු 10 ට මගේ කාර්යාලයට පැමිණෙන ලෙස ඉල්ලමි.

අත්සන් කළේ: එල්. බී. අබේරත්න,
බදුල්ල දිසාපති."

මේ විෂය භාර ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා මේ අවස්ථාවේදී මේ ගරු සභාවේ නැහැ. ඒ ගැන මා කනගාටු වෙනවා. මේ ප්‍රශ්නයට ගරු අගමැතිතුමාගෙන්වත් පිළිතුරක් ලැබේයැයි මා බලාපොරොත්තු වෙනවා. කොළොන්න ගරු මන්ත්‍රීතුමාට (සී. නන්ද මැතිව් මයා.) බණ්ඩාරවෙල මැතිවරණ කොට්ඨාශය ගැන තිබෙන අයිතිය කුමක්ද කියා මා අහන්නට කැමතියි. පසුගිය අතුරු මැතිවරණයේදීත්, ඊට කලිනුත් බණ්ඩාරවෙල ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ අපේක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ෂකයා වශයෙන්, කොළොන්න ගරු මන්ත්‍රීතුමාගේ පියා—සිරිල් මැතිව් මයා.—ඉදිරිපත් වීම උඩ ද, මේ විධියේ වැඩ පිළිවෙළක් ගන්නේ කියා මා මේ අවස්ථාවේදී ප්‍රශ්න කරන්නට කැමතියි. බණ්ඩාරවෙල මැතිවරණ කොට්ඨාශයේ මහජන නියෝජිතයා හැටියට පෙනී සිටීමට කොළොන්න ගරු මන්ත්‍රීතුමාට ඇති අයිතිය කුමක්ද? බණ්ඩාරවෙල මැතිවරණ කොට්ඨාශයේ යම් යම් වැඩවලට එතුමා ඇඟිලි ගසන්නේ කුමක් නිසාද කියා මා දැන ගන්නට කැමතියි. මීට කලින්ද නොයෙකුත් අවස්ථාවලදී ඉඩම් ප්‍රශ්න වැනි නොයෙකුත් ප්‍රශ්න සම්බන්ධයෙන් කොළොන්න මහජන මන්ත්‍රීතුමා (සී. එන්. මැතිව් මයා.) අයුතු විධියට ක්‍රියා කර තිබෙනවා. මා මේ ගැන කනගාටු වෙනවා. බණ්ඩාරවෙල කොට්ඨාශයේ වැඩ කටයුතුවලට ඇඟිලි ගසන්නට කොළොන්න මහජන මන්ත්‍රීතුමාට ඇති අයිතිය කුමක් දැයි මා දැන ගන්නට කැමතියි. මෙසේ කරන්නේ මොන කාරණයක් නිසාද? මෙය දිගටම ප්‍රතිපත්තියක් හැටියට ක්‍රියාත්මක කරන්නට යන දෙයක්ද? එසේ නම් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් පෙනී සිටින අනෙක් කොට්ඨාශ සම්බන්ධයෙන්ද මේ විධියේ බලපෑම් ඇති කරන්නට බලාපොරොත්තු වෙනවාදැයි මා ගරු අගමැතිතුමාගෙන් දැන ගන්නට කැමතියි.

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)**

*(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும், தகவல், ஒலி பரப்பு அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

Two questions have been addressed to me. One is as regards the Peace Corps. A question was asked about certain officers being sent to America. They are going to that country for the purpose of acquainting the people who are to come out here to do work in three Ministries with the languages and conditions prevailing in this country. These persons are going on an invitation extended to them, and it is not going to cost this Government a single cent. All the expenses have been provided for.

These are the officers who have been chosen to go for this purpose. The respective Ministries sent up these names and they have been approved.

1. HOME MINISTRY :

(i) Mr. B. Abeysundere, Assistant Director, Department of Rural Development and Small Industries.

(ii) Mr. W. J. H. Wijesuriya, Lecturer, Community Development Training Institute, Peradeniya.

(iii) Mr. R. M. Vitharne, Assistant Director, Department of Rural Development and Small Industries, Matara.

(iv) Mr. A. Welikande, Rural Development Officer, Kolonne Korale, Ratnapura.

(v) For training volunteers in the Tamil Language : Mr. S. Sivaloganathan, Industrial Assistant, Department of Rural Development and Small Industries.

PUBLIC LIBRARY JAFFNA.

(vi) Reserve : Mr. N. P. Ranasinghe, Rural Development Officer, Puttalam.

2. MINISTRY OF AGRICULTURE AND FOOD :

(i) Mr. S. N. Dissanayake, Agricultural Instructor (Extension Services).

(ii) Miss P. Dissanayake, Principal, Ladies' Farm School, Bindunuwewa.

(iii) For training in Tamil Language : Mr. K. Vartharasa, Agricultural Instructor (Tobacco), Amparai.

3. MINISTRY OF LAND, IRRIGATION AND POWER :

(i) Mr. T. Jayawardene, Officer in Charge, Youth Settlement Schemes Kalutara District.

These officers will be in the United States for a period of about four months and are expected to leave Ceylon in August.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩඩ්ලි සේනානායක]

As regards the question addressed by the hon. Member for Bandarawela (Mr. R. M. Appuhamy), he made a complaint that the hon. Member for Kolonne (Mr. Mathew) had taken up some matter connected with the Bandarawela electorate.

කොළොන්නෙ ගරු මන්ත්‍රීතුමා (මැතිව් මයා.) බණ්ඩාරවෙල කොට්ඨාශයේ කට යුතු ගැන ක්‍රියා කිරීම ගැන නෝද ප්‍රශ්නය ?

**අප්පුහාමි මයා.**
*(திரு. அப்புஹாமி)*
(Mr. Appuhamy)

ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා බණ්ඩාරවෙල සංචාරයක් සඳහා පැමි ණෙන බවත්, ඒ පිළිබඳව වැඩ පිළිවෙළක් සකස් කර ගැනීම පිණිස කොළොන්නෙ ගරු මන්ත්‍රීතුමා මුණගැසී සාකච්ඡා කළ යුතු බවත් සඳහන් කොට තිබෙනවා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

කවුද ?

**අප්පුහාමි මයා.**
*(திரு. அப்புஹாமி)*
(Mr. Appuhamy)

බදුල්ලේ දිසාපතිතුමා—ස්ථිර ලේකම් ගේ නියෝගය පිට බදුල්ලේ දිසාපතිතුමා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

කරුණාකර ඒ ලියවිල්ල මට එව්වොත් ඒ ගැන බලන්නට පුළුවනි. ඒ ලියවිල්ල එවා තිබෙන්නේ ස්ථිර ලේකම්ද ?

**අප්පුහාමි මයා.**
*(திரு. அப்புஹாமி)*
(Mr. Appuhamy)

ස්ථිර ලේකම්ගේ නියෝගයක් උඩ මට එවා තිබෙන්නේ බදුල්ලේ දිසාපතිතුමායි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

කරුණාකර මට ඒ ලියවිල්ල එවන්න.

**අප්පුහාමි මයා.**
*(திரு. அப்புஹாமி)*
(Mr. Appuhamy)

හොඳයි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.10 ට 1967 ජූලි 25 වන දින සභාසම්මතිය අනුව, 1967 අගෝස්තු 3 වන බ්‍රහස්පතින්දා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.

அதன்படி பி. ப. 8.10 மணிக்கு சபை, அதனது 1967 ஜூலை 25 ஆம் தேதிய தீர்மானத்திற்கிணங்க, 1967 ஆகஸ்ட் 3, வியாழக்கிழமை மு. ப. 10 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.

*Adjourned accordingly at 8.10 P.M. until 10 A.M. on Thursday, 3rd August 1967, pursuant to the Resolution of the House of 25th July 1967.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

3058

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம்; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months. Each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org